# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඉල් - උඳුවප් 2021 නොවැම්බර් - දෙසැම්බර්

## ලිපි සරණිය


| | |
|---|---|
| ★ **ධම්ම පදය - ජීවිතයට සම්බන්ධ කර ගනිමු** | - සිංහල සම්පාදක: පණ්ඩිත රන්ජිත් වනරත්න |
| ★ **චීවරයේ (සිවුරේ) කතාව** | - රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි |
| ★ **The Four Nutriments of Life** | - Das Miriyagalla |
| ★ **භික්ෂුණී ශාසනයේ ආරම්භය සංවර්ධනය හා පිරිහීම** | - රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති දිසානායක හේරත් |
| ★ **කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍ය** | - ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ |
| ★ **බොදු පිළිවෙතින් හෙළිවන සමාජ සේවාව අගයමු** | - එම්.කේ.ඒ. නෙත්මි චමෝද්‍යා |
| ★ **කාමනීය ජාතකය** | - පූජ්‍ය මකුද්දල උපරතන ස්ථවිර |
| ★ **ආයුර්වේදීය ස්වස්ථතාව සහ නිද්‍රා චර්යාව** | - වෛද්‍ය කේ. ඉන්ද්‍රා චන්ද්‍රමාලි |
| ★ **සෝවාන් සිතේ ශ්‍රද්ධාව** | - නාලක ජයසේන |
| ★ **මුනි සිරිපා** | - රුවන් වින්ඩ්සර් |
| ★ **මහාචාර්ය ගුණපාල මලලසේකර** | - වෑතර මහින්ද හිමි |
| ★ **සිංහල භාෂාව ඔබේ උරුමයයි** | - විද්‍යාජෝති මහාචාර්ය නිමල් ද සිල්වා |
| ★ **මාලඹේ 66+ නිකේතනය** | - |
| ★ **කඨින මහෝත්සවය 2021** | - |
| ★ **සංඝමිත්තා මහරහත් තෙරණියෝ** | - වෛද්‍ය ඉන්ද්‍රාණි රත්නායක |



**කළමනාකරණ උපදේශක මණ්ඩලය**
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බොඩ
මහාචාර්ය මාලිංග අමරසිංහ

**සංස්කරණ කළමනාකරණ**
වෛද්‍ය රාණි ප්‍රනාන්දු

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය

**සංස්කරණ උපදේශක**
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

**සංස්කාරක මණ්ඩලය**
චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාමි නුවන් ගනේවත්ත
නාලක ජයසේන
ඉෂාන් එදිරිසූරිය

**කවර නිර්මාණය සහ ඡායාරූප**
දුෂාන්ති කුමාරි



**සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන : 011-2691695 / 011-2688517
ෆැක්ස් : 011 - 2688517 web : www.acbc.lk
විද්‍යුත් ලිපිනය : acbc380@gmail.com
buddhistinfo380@gmail.com

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

## සිවුරු දැරීමට සුදුසු හා නුසුදුසු අය

**9. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති**
**අපෙතො දම සච්චෙන නසො කාසාව මරහති**

කෙලෙස් කසට සහිත වූ; ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන්; පහ වූ; යමෙක්; කසාවතක; පරිභෝග කරන්නේ වේද? ඒ පුද්ගල තෙම; කසාවතට; සුදුසු නොවේ.

**10. යො ච වන්ත කසාවස්ස සීලෙසු සුසමාහිතො**
**උපෙතො දම සච්චෙන ස වෙ කාසාව මරහති**

යම් පුද්ගලයෙක් වනාහි; ප්‍රහීණ කළ කෙලෙස් කසට ඇත්තේ වේද, සීලයන්හි, මනාව පිහිටියේ වේද, ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන්, යුක්තද, ඒ පුද්ගල තෙමේ; ඒකාන්තයෙන්; සිවුරු දැරීමට, සුදුසු වේ.

දඹදිව සෙත්‍ය නුවර මහාකාල, මජ්ඣිම කාල, චූලකාල යයි වෙළෙඳ පුත්‍රයෝ තුන් බෑ කෙනෙක් වූහ. මහාකාල, චූලකාල, දෙදෙන දිසාවන්හි හැසිර ගැල්වලින් බඩු ගෙන එති. මජ්ඣිම කාල තෙමේ ගෙනෙන බඩු විකුණයි. එක් කාලයෙක්හි ඒ සොහොවුරු දෙදෙන ගැල් පන්සියයකින් නොයෙක් බඩුගෙන සැවැත්නුවරට ගොස් සැවැත්නුවරටත් දෙව්රම් වෙහෙරටත් අතර ගැල් මිදවූහ. මහාකාල තෙමේ එදා සවස සැවැත්නුවර වැසියන් මල් ගඳ විලවුන් අතින් ගෙන බණ අසන්නට යනු දැක, වෙහෙරට ගොස් බුදුන් වැඳ පිරිස් කෙළවර සිට බණ ඇසුයේය. බුදුන් වහන්සේ ඔහු දැක ඔහුගේ අදහස් දැන අනුපිළිවෙළින් දම් දෙසන සේක් නොයෙක් අයුරින් කාමයන්ගේ ආදීනව වදාළ සේක. ධර්ම දේශනාවගේ කෙළවර දී හෙතෙම මහණ වීමට කැමැතිව බුදුන් කරා ගොස් පැවිද්ද ඉල්ලීය. පිළිවිසිය යුතු යැයි වදාළ සේක. චූලකාලට දන්වා බුදුන් වෙත ගොස් මහණ විය. මහාකාල තෙරුන් වහන්සේ උපසම්පදාවත් ලැබ පසුව මහලුව පැවිදි වූ නිසා විදර්ශනාධූරය පිරීමට කමටහන් ගෙන සොසානිකාඞගය සමාදන් වී සොහොනෙහි රාත්‍රිය ගෙවා අලුයම පන්සලට වඩිති. එකල කාලී නම් සොහොන් ගොවු දුවක් තෙරුන්වහන්සේ සිටි, සක්මන් කරන තැන් දැක කවරෙක් මෙහි ඒ දැයි පරීක්‍ෂා කරමැයි දිනක් සොහොනෙහි පිහිටි කුටියක පහනක් දල්වා දූ පුතුන් සමඟ ගොස් වැඳ "ස්වාමීනී! මෙහි වැඩ සිටින සේක් ඔබ වහන්සේදැ"යි ඇසුවාය. "එසේය උපාසිකාවෙනි"යි වදාළ කල්හී, සොහොනෙහි වසන්නවුන් විසින් වතක් උගතමනා යැයි කීවාය. එවිට කුමක් කළ යුතු දැයි විචාළහ. ස්වාමීනී! සොහොනෙහි වසන්නවුන් විසින් තමන් සොහොනෙහි වසන බව, සොහොන් පල්ලන්ට, විහාරයෙහි මහ තෙරුන්ට, ගම්මුලැදෑනියාට, දැන්විය යුතුය. කවර හෙයින්ද? හොරු මිනිසුන් ලුහුබඳින විට සොහොනෙහි, බඩු දමා පලායති. එවිට බඩු හිමියෝ සොහොනෙහි වසන අය අල්ලා සොරු යයි තැළීම් පෙළීම් කරන්නෝය. තවද, සොහොනෙහි වසන්නවුන් විසින් මස්, මාළු, පිටි කැවුම් ආදිය අත්හළ යුතුයි. දවල් නොනිදිය යුතුය. අලස නොවිය යුතුය. වීර්යය ඇත්තෙකු විය යුතුයි. කපටිකම් රැවටිලි හා කුහක අදහස්වලින් තොර විය යුතුය. සියල්ලන් නිදිගත් පසුව විහාරයෙන් ආ යුතුය. අලුයම විහාරයට යා යුතුය. මේ කී ලෙස මෙහි වසන්නාහු නම් ඔබ වහන්සේගේ අදහස් පිරිදි පැවිදි කිස මුදුන් පමුණුවා ගත හැකි වේ. මිනිසුන් මළ සිරුර මෙහි ගෙනා පසු කම්බිවලින් කුළු ගෙවල් සාදා දවන්නෙමි. දර සෑයක දල්වා කපා කොටා ගින්නෙහි ලා දවන්නෙමියි කීවාය. උපාසිකාවෙනි, යම්කිසි අශුභ රූපාරම්මණයක් දුටු කළ මට කියවයි, වදාරා තම අදහස් පිරිදි තෙරුන් වහන්සේ සොහොනෙහි මහණ දම් පුරති.

සහෝදර චූලකාල තෙමේ මහණකම ගැන නොසිතා නිතර ගේදොර ගැන සිතමින් කාලය ගෙවයි. මේ අතර හදිසි ලෙඩකින් මියගිය තරුණියකගේ මළ සිරුරක් නෑයෝ සොහොන් පාලිකාවට දැවීමට භාර දී ගියහ. ඕ තොමෝ මළ ලස්සන තරුණ සිරුර දැක තෙරුන් වහන්සේට දැන්වූවාය. තෙරුන් වහන්සේ ද අවුත් බලා එම සිරුර ගින්නෙහි ලා ගිනි ඇවිලගත් කල දක්වන්නැයි කියා විහාරයට වැඩි සේක. ඕ තොමෝ එසේ කොට දැන්වූවාය. මළ සිරුරෙහි ගිනි දල් වැදුන තැනේ කබර දෙනකගේ සිරුර පැහැය ගෙන තිබුණි. අත් පා නැවී ගොස්ය. තෙරුන් වහන්සේ ඒ මළ සිරුර බලා "සියලු සංස්කාරයෝ ඒකාන්තයෙන්ම අනිත්‍යයහ. ඉපදීම හා නැතිවීම ස්වභාව කොට ඇත්තාහ. ඉපිද නැසෙති. ඒ සංස්කාරයන්ගේ සංසිඳීම සැපයෙකි"යි විදර්ශනා වඩා සිව්පිළිසිඹියා සහිතව රහත් වූහ. මහාකාල තෙරුන් වහන්සේ රහත් බවට පත් කල්හී, බුදුන් වහන්සේ වහා සංඝයා වනයට පිවිසි සේක. චූලකාල තෙරුන්ගේ පුරාණ භාර්යාවෝ බුදුරදුන් වැඩි බව අසා තම සැමියාණන් සිවුරු හරවා ගන්නා අටියෙන් බුදුන් ප්‍රධාන සංඝයාට දනට ආරාධනා කළහ. බුදුන් නොවැඩි විරූ තැන්හී අසුන් පනවන අයුරු කියා දෙනු පිණිස භික්‍ෂු නමක් පළමු කොට යැවීම සිරිතකි. ආසන පිළියෙල කරවනු සඳහා චූලකාල භික්‍ෂුව පළමුව සිය ගෙට ගියේය. ඒ දුටු පුරාණ භාර්යාවෝ ඔහු හා විහිළු තහළු කොට සිවුරු ගලවා ගත්හ. පසුව සුදු පිළියක් හඳවා ගිහිව ගොස් බුදුන් ප්‍රමුඛ සංඝයා වහන්සේ වැඩම කරවා ගෙන ආවේය.

දන් වළඳා අවසන් වූ පසු මහා කාල තෙරුන් වහන්සේගේ පුරාණ භාර්යාවෝ මැලා තම හිමියා සිවුරු හරවා ගත්හ. අපිදු අප හිමියා හැර ගනිම්හැයි දෙවන දිනට ද දනට ආරාධනා කළහ. එදින දන් වළඳා අවසන් වූ පසු අපට මහාකාල තෙරණුවෝ අනුමෙවෙනි බණ වදාරා වඩින සේකැයි පුරාණ භාර්යාවෝ අයැද සිටියහ. බුදුහු යහපතැයි වදාරා වැඩියහ. එවිට භික්‍ෂුන් වහන්සේ බුදුන් වහන්සේට දොස් පැවරූහ. එවිට බුදුන් වහන්සේ මහණෙනි, කුමක් කියව ආදැයි විචාළ සේක. වහන්දෑ පෙර පුවත සැල කළහ. "මහණෙනි, චූලකාල මෙන් නොව මහාකාල. එවිට ස්වාමීණි, චූලකාලට භාර්යාවෝ දෙදෙනෙකි. මහාකාලට අට දෙනෙකි. ඔවුන් වටකර ගත් කල්හි කුමක් කෙරෙන්ද? ස්වාමීණි"යි කීහ. එවිට බුදුන් වහන්සේ "සුභානු පස්සිං විහරනතං" යනාදී ගාථාවන්ගෙන් දහම් දෙසූ සේක. මහාකාල තෙරුන් වහන්සේගේ භාර්යාවන් උන්වහන්සේ වටකොට ගෙන ගිහිවන්නැයි කියා සිවුරු උදුරා ගැනීමට තැත් කළහ. එවිට මහාකාල තෙරුන් වහන්සේ සෘද්ධියෙන් අහසට නැග අහසින් අවුත් බුදුන් දහම් දෙසා අවසන්වත්ම සිරිපා වැඳ සිටියහ.

**පණ්ඩිත රන්ජිත් වනරත්නයන්ගේ**

ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොත ඇසුරින්

# Persons suitable and unsuitable to wear the yellow robe of a monk

**09. Anikkasävo Käsävam yovattham paridahissati apeto damasaccena, na so käsävam arahati.**

*Whoever wears the monk's yellow robe while being depraved, devoid of self-control and truthfulness, he surely is not worthy of the yellow robe.*

**10. Yo ca vantakasäv' assa sïlesu susamähito upeto damasaccena, sa ve käsävam arahati.**

*But whoever is purged of depravity, well established in virtues, and filled with self-control and truthfulness, he indeed is worthy of the yellow robe.*

The three brothers, Mahakala, Majjima kala and Chulakala were merchants who lived in the city of Setya in Dambadiva. Mahakala and Chulakala travel to various places by wagon carts, collecting merchandise. Majjimakala sells the goods that are brought. Once the two brothers transporting merchandise by five hundred carts came to Savatti and rested, camping between Savatti and the Devram Viharaya. In the evening Mahakala saw lay devotees in Savatti carrying flowers and incense going to the vihara to listen to Bana, preached by the Buddha. Mahakala too went along with them to the viharaya, worshiped the Buddha and stood at the back listening to Bana. The Buddha having seen him and knowing his intentions, preached about the consequences of desires.

At the end of the sermon Mahakala wished to enter the order of the monks and requested from the Buddha, to be ordained. He informed Chulakala and ordained in the presence of the Buddha. Having entered the priesthood in his old age and in need of an object to contemplate upon for insight meditation (vidharshana) , he spent the nights meditating in a cemetery and went back to the temple at dawn. Kali, a woman attending to dead bodies that are brought to the cemetery noticed signs of the presence of the thera. She approached the thera and informed him that those who live in the cemetery have to follow certain rules.

She stated that the thera should inform the cemetery keeper, the chief priest of the viharaya and the village headman that he was living in the cemetery. The reason being that robbers when chased by the villagers abandon their loot in the cemetery . Then the owners beat up the persons living there assuming they are the robbers. In addition, people residing in the cemetery should abstain from eating meat and fish, should not sleep during the day, should not be lazy, should be persevering and free from cunning and deceitful thoughts. They should leave the temple after all others are asleep and get back to the temple early in the morning. She told the thera that if he follows these rules he would succeed in achieving his spiritual goal. The woman further said that when dead bodies are brought to the cemetery, she prepares them for burning and sets fire to them in a pyre. The thera told her to inform him when she sees a suitable object for his austere practice and continued to meditate in the cemetery. The brother Chulakala was not interested in priesthood and spent time thinking about his home and family.

During this time a body of a young woman who had died of a sudden illness was brought to the cemetery by relatives and was handed over to the woman employed at the cemetery. Having seen the beautiful young body of the dead woman she informed the thera about it. The thera said to let him know when the body would be prepared for cremation and set on fire, and went back to the temple. When thus informed the thera came and observed the changes in the once beautiful body of the dead woman whose body was now charred and disfigured in places. While looking at the burnt corpse, he contemplated and realised that all sanskaras or component things are impermanent, birth and cessation being the true nature of things, arising and passing away. When the sanskara are extinguished with insight their eradication brings happiness. With this insight he attained arahatship.

When Mahakala thero attained arahatship the Buddha visited with the Sangha. The wives of Chulakala (during his lay life) having heard that the Buddha was visiting, invited the Buddha and the sangha for alms with the intention of getting Chulakala thera to disrobe. Since the Buddha was not present at the time, and following tradition for a bhikku to precede to the house to instruct on the arrangement of seating for the alms giving, it was Chulakala thera who went to his house for this purpose. The wives of the lay Chulakala then surrounded him and making fun removed his robes, dressed him in a white robe. Attired in this manner he went to escort the Buddha and the sangha for the almsgiving. Having seen that the previous wives of Chulakala thero got him to disrobe, the wives of Mahakala during his lay life thought of doing the same. Thus they invited the Buddha and the sangha for alms on the second day too. They requested that Mahakala Thero deliver the sermon after consuming the meal. The Buddha agreed to this request. The bhikkus however found fault with the Buddha for having done so. The Buddha then told them of a previous incident.The Buddha said to the bhikkus that Mahakala was quite different from Chulakala. “Chulakala has two wives whereas Mahakala has eight. What can be done when they all surround Mahakala!”said the bhikkus. The Buddha then preached the dhamma based on the gatha “Suhanu passin viharanathan”. The previous wives of Mahakala thero surrounded him, tugged at his robes trying to remove them wanting him to give up monkhood. However at that point Mahakala thero with the powers attained by him, rose high up in the air, and at the end of the sermon, descended to worship at the Buddha’s feet.



# සිවුරේ (චීවරයේ) කතාව සිවුර හෙවත් චීවරය යනු කුමක් ද?

භික්ෂූන් වහන්සේලා පොරවන වස්ත්‍රය සිවුර නමින් හැඳින් වේ. මෙය ලෝකයේ පැරැණිම වස්ත්‍රය ලෙස හැඳින්වීම වරදක් නොවේ. වසර දෙදහස් ගණනක් තිස්සේ පැවත එන වස්ත්‍රයකි. බොහෝ ඇඳුම් කාලයෙන් කාලයට වෙනස් වේ. එහෙත්, බුද්ධ කාලයේ පටන් මේ දක්වා අවිච්ඡින්නව පැවත එන වස්ත්‍රය සිවුර ලෙස හැඳින්විය හැකි ය. මෙය කාසාය වස්ත්‍රය ලෙසින් ද හැඳින් වේ. මුල් යුගයේ දී භික්ෂූන් වහන්සේලා විසින් චීවර වශයෙන් භාවිත කර ඇත්තේ කසට පාට ඇති කඩ නොකැපූ සිවුරු ය. එය රෙදි කෑලි එක්කර මසාගත් පොරෝණයක් වැනි සිවුරකි. එහි රටාවක් හෝ හැඩයක් තිබී නැත.

දිනක් බුදුරජාණන් වහන්සේ, භික්ෂූන් වහන්සේලා පිරිසක් සමඟ රජගහනුවර සිට දක්ඛිණාගිරියට චාරිකාවේ වඩින අතරමඟ දී විශාල වෙල්යායක් දක්නා ලදී. එහි ලියදි දික් අතටත්, හරස් පැත්තටත් මනාව බෙදා මනාව සකස් කර තිබිණ. එය ලොකු නියරවලින් සහ හරස් නියරවලින්, හතරැස් ලියදි වෙන් කරන ලද විශාල කුඹුරු යායකි. පිළිවෙළකට සකස් කරන ලද ඒ කුඹුර පෙන්වා බුදුරජාණන් වහන්සේ, "ආනන්දය, මේ හතරැස් කුඹුර මෙන් දිග හා පළල නියර ඇති අතරතුර බැඳි කුඩා හරස් නියරවලින් යුක්ත මගධ ක්ෂේත්‍රය දුටුවෙහි ද?" යි ඇසූහ. "ස්වාමීනි, මගධ ක්ෂේත්‍රය, දුටුවෙමි." ආනන්ද හිමියෝ පිළිතුරු දුන්හ. "ආනන්දය චීවරයත් එසේ ම කඩ කපා සකස් කරන්න උත්සාහවත් වන්නැ"යි වදාළ සේක.

එය පිළිගත් ආනන්ද හිමියෝ වේළුවනාරාමයට වැඩම කොට මගධයේ දක්ඛිණාගිරියේ කුඹුරුවල ස්වරූපයට අනුරූප ලෙසට සිවුරක් සකස් කිරීමට තීරණය කළහ. උන්වහන්සේ රෙදි සොයාගෙන කඩ කපා මසා පඬු ගසා සකස් කළ සිවුර, බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූහ. එම චීවරය පරීක්ෂා

කළ බුදුරජාණන් වහන්සේ, මහණෙනි, මා විසින් කෙටියෙන් කියන ලද කාරණය, ආනන්ද විස්තර වශයෙන් අවබෝධ කරගෙන "දිග පළල නුවා ද, හරස් නුවා ද, මහ මැඩිලි ද, කුඩා මැඩිලි ද, වස් අත්ත ද, ඇළ අතු ද, ගෙළ පටිය ඇල්ලීම ද, කෙණ්ඩ පටිය ඇල්ලීම ද, නුවා අතු, බාහුව මත සිටින නුවා ද, ඇතිව කඩ කපා මැසූ සිවුර රළුය පැවිද්දන්ට සුදුසු ය. එය සොරුන් විසින් පැහැර ගන්නේ හෝ සොරකම් කරන්නේ නැත. ආනන්ද පණ්ඩිත ය. නුවණැති ය, මහණෙනි, කඩ කැපූ දෙපොට සිවුර ද, කඩ කැපූ තනිපොට සිවුර ද, කඩ කැපූ අඳන ද අනුමත කරමි" යනුවෙන් වදාළ සේක. ඒ අනුව තුන් සිවුරම එකම රටාවකට මැසීම සිදු කරයි.

ගිහි පිරිස ඇඳුම් අඳින්නේ විවිධ හේතු පාදක කොටගෙන ය. ඔවුන් ලස්සන වීම පිණිස වටිනා කියන ඇඳුම් පැළඳුම් භාවිත කරයි. එහෙත් සිවුර එසේ නොවේ. චීවරය සුඛෝපභෝගී නොවන චාම් වූ වස්ත්‍රයකි. එය භික්ෂූන් වහන්සේ සීතල නැති වීමට, උෂ්ණය නැති වීමට, මැසි මදුරු කරදර ආදියෙන් ආරක්ෂා වීමටත්, විලි වසා ගැනීමටත් යොදා ගන්නවා මිස අලංකාරය පිණිස හැඩ වැඩවීම පිණිස භාවිත නොකරයි.

## තුන් සිවුර යනු කුමක් ද?

තනිපට සිවුර, දෙපට සිවුර, අඳන සිවුර යනු තුන් සිවුරයි. එක් පොටක් පමණක් ඇති ස්වාමීන් වහන්සේලා නිතර පොරවන සිවුර තනිපට සිවුරයි. සිවුරු දෙකක් එක්කොට මසා ඇති නිසාත්, රෙදි පොටවල් දෙකක් ඇති නිසාත්, දෙපට සිවුර කියා හඳුන්වයි. බොහෝ විට විනය කර්ම කරන අවස්ථාවල මෙන් ම සීතල අවස්ථාවල පෙරවීමට දෙපට සිවුර යොදාගනියි. අඳන සිවුර යනු කුඩා සිවුරකි. එය යටිකය වැසෙන සේ අඳින සිවුරයි. අඳන සිවුර කියනවාට වඩා අඳනය යන නමින් මෙය බොහෝ විට හඳුන්වනු ලැබේ.

## සිවුරු වර්ග මොනවා ද?

සිවුරු වර්ග සතරකි. පාංශකූල සිවුර, ගහපති සිවුර, කඨින සිවුර, වස්සාවාසික සිවුර යනු ඒ සිවුරු වර්ග සතරයි. පාංශුකූල වස්ත්‍රයෙන් මැසූ සිවුර පාංශකූල සිවුර ලෙස හැඳින් වේ. ජීවක වෙද මහතාගේ ඉල්ලීම අනුව අනුමත කළ සිවුර ගහපති සිවුර ලෙස හැඳින් වේ. කඨිනය සඳහා පූජාකරන්නා වූ තුන් සිවුරෙන් ඕනෑම සිවුරක් කඨින සිවුර ලෙස හැඳින් වේ. විහාරස්ථානයක වස් වැසූ භික්ෂූන් වහන්සේලා හැම දෙනා වහන්සේලාට ම කඨින සිවුරු පූජා කරන්නේ නැත. එක් විහාරස්ථානයක පූජා කරන්නේ එක් සිවුරකි. විහාරස්ථානයේ වස් විසූ අනෙක් ස්වාමීන් වහන්සේලා විෂයෙහි පූජාකරන සිවුර වස්සාවාසික සිවුරු ලෙසින් හැඳින් වේ.

## පාංශකූල සිවුර කියන්නේ කුමක් ද?

බුදුන් වහන්සේ දවස කෙනෙකු මියගිය පසු සුදු රෙදිවල ඔතා සොහොනට ගෙන ගොස් දමති. සමහරු සොහොනේ වළ දමා ඒ මත පස් ගොඩගසා රෙද්දකින් වසති. ස්වාමීන් වහන්සේලා එම රෙදි රැගෙන සෝදා සිවුරු සකස් කරගනී. එසේ ම සල්පිල්, සොහොන්, කසළගොඩ ආදියේ දමාගිය රෙදි, ගින්නෙන් අඩක් දැවුණු නිසා ඉවත දැමූ රෙදි කැබැලි ආදී කිසිකෙනෙකුට අයිතියක් නැති රෙදි කෑලි එක්කොට සිවුර මසා ගනිති. එය පාංශුකූල සිවුර වේ. එකල බොහෝ භික්ෂූන් වහන්සේ අල්පේච්ඡ වූ චාම් දිවියක් ගතකළ භික්ෂූන් වහන්සේලා වූහ. අනුන් විසින් අත්හැර දැමූ වස්ත්‍රවලින් සකස් කළ පාංශුකූල සිවුරු ම දැරූහ. පාංශුකූල චීවර පමණක්ම දැරීම, ධුතාංග දහතුනෙන් එකකි. එබැවින් යම්කිසි භික්ෂුවක් කැමති නම් පාංශුකූල චීවර පමණක් ම දැරීමට හැකි ය. එසේ නොමැතිනම් ගහපති චීවර දැරීමත් බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන ලදී.

පාංශුකූල චීවර සියලු ම භික්ෂූන් විසින් දැරිය යුතු චීවරයක් නොවේ. තමන්ගේ කැමැත්ත අනුව භික්ෂුවකට පාංශුකූල හෝ ගහපති සිවුර දැරිය හැකි ය. දිනක් දෙව්දත් තෙරුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් සමඟ පැමිණ පංච වරයක් ඉල්ලා සිටිය හ. ඉන් එකක් වූයේ භික්ෂූන් වහන්සේ දිවි හිමියෙන් පාංශුකූල සිවුරු දැරිය යුතු බවට නීතියක් පනවන ලෙසයි. එහෙත් බුදුරජාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක.



එසේ ම සමහර දුෂ්කර ව්‍රත ආරක්ෂා කරන තාපසයන් මෙන් කුස තණ, පට්ටා වර්ග, උණ පතුරු, කෙසෙල් පතුරු, පොතු, හිසකෙස්, අඳුන් දිවිසම්, නපුරු සතුන්ගේ ලොම්, බකමුණු පිහාටු ආදියෙන් සකසා ගත් සිවුරු දැරීම වැනි දුෂ්කර ව්‍රතවලට සම්බන්ධ සිවුරු, පාංශුකූල චීවර වශයෙන්වත් දැරීම භික්ෂූන් වහන්සේට තහනම් කර ඇත.

## ගහපති සිවුර කියන්නේ කුමක් ද?

## හාමුදුරුවරු පාට පාට සිවුරු පොරවන්නේ ඇයි?

අද භික්ෂූන් වහන්සේලා දෙස බැලීමේ දී පාට කිහිපයකින් සිවුරු පොරවන බව පෙනේ. මේ පිළිබඳ අවබෝධයක් නොමැති සමහර ගිහි පිරිස් "හාමුදුරුවරුත් දැන් පාට පාට සිවුරු පොරවනවා" යනාදිය කියමින් පව් රැස්කර ගනිති. බුදුරදුන් වැඩසිටි කාලයේත් මෙවැනි පාට පාට සිවුරු පරිහරණය කළ බව පෙනේ. තැන් තැන්වලින් එක්කර ගත් පාංශුකූල රෙද්දෙන් මැසූ සිවුරේ තැන්තැන්වල මඩ පැල්ලම්, ලේ පැල්ලම්, කුණු පැල්ලම් ආදිය විය. මේවා සියල්ල නැති කිරීමට එකම පාටක් නොහොත් කහටක් එක් කිරීම සිදුකෙරිණි. ගස්වල මුල්, කඳ, පොතු, කොළ, මල්, ගෙඩි ආදිය කුඩා කැබලිවලට කපා ජල බඳුනකට දමා හොඳින් තැම්බීම සිදු කරයි. එහිදී එම කහට දියට මුසු වේ. එම ජලයෙහි මසාගත් සිවුර ගිල්වීමේ දී එම කහට සිවුරට උරාගනී. එසේ තැම්බීම සඳහා යොදාගන්නා ශාඛයේ පාට අනුව කහට පාට වෙනස් වේ. නිදසුනක් ලෙස කොස් ගසක පාට කහ පැහැතිය. කොස් මුල් පොතු ආදිය යොදා සාදාගත් සිවුර කහ පැහැති විය. ගම්මාළු, නුග, තේක්ක වැනි ගස්වල කහට බුරු පාටට හුරු ය. එම මුල්, කඳ, පොතු, කොළ, මල්, ගෙඩි ආදිය යොදා සාදාගත් සිවුරු තවත් පාටකි. එසේ එක් එක් ගස්වල කහට පාට අනුව සිවුරේ පැහැය වෙනස් වීම ස්වාභාවික සංසිද්ධියකි. බුදුරජාණන් වහන්සේ එවා අනුමත කොට ඇත. සිවුරු වර්ණ කිරීමේදී පඬු සකස් කර ගැනීමට ගස්වල මුල්, කඳ, පොතු, කොළ, මල්, ගෙඩි යන වර්ග හය අනුමත කර ඇත.

මුල්කාලයේ සිවුරේ පාට පිළිබඳ නිශ්චිත වර්ණයක් නොතිබිණ. එය හැඳින්වූයේ කාසායක, කසට, කහට සිවුර වශයෙනි. එසේ සිවුරට නියමිත වර්ණයක් සම්මත නොවීම නිසා ඡබ්බග්ගිය භික්ෂූහු සම්පූර්ණ නිල් (සබ්බ නීල), සියල්ල කහ (සබ්බ පීත), සියල්ල රතු (සබ්බ ලෝහිත), සියල්ල සුදු (සබ්බ ඕදිත), සියල්ල මදටිය පාට (සබ්බ මඤ්ජෙට්ඨ) සිවුරු භාවිත කළහ. එය දැනගත් බුදුරජාණන් වහන්සේ තනි නිල්, තනි කහ, තනි රතු, තනි මදටිය, තනි සුදු, තනි කහ වර්ණ සිවුරු දැරීම තහනම් කළහ.

පසුකාලය වන විට තාක්‍ෂණය දියුණු වීම නිසා ගස්වල පොතු අතු මුල් ආදිය තැම්බීම වෙනුවට 'පඬු' නමින් කුඩු වර්ගයක් නිෂ්පාදනය විය. එම කුඩු වර්ගය උණු වතුරට දමා දියකර එහි සුදු රෙද්දෙන් මැසූ සිවුර බහාලීම සිදු කරයි. එහි දී තමාට අවශ්‍ය පාට අනුව සිවුර පැහැ ගැන්වීම සිදුකර ගනී. ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේලා විශේෂයෙන් දුඹුරු පාටට හුරු සිවුරු ද ග්‍රාමවාසී

ස්වාමීන් වහන්සේලා බොහෝ විට කහ පැහැයට හුරු පාට සිවුරු ද සකස්කර ගනී. එය සිවුරු 'පඬුපෙවීම' ලෙස හැඳින් වේ.

තාක්ෂණය තවත් දියුණුවීමත් සමඟ පාට පාට නූල් හා පාට පාට රෙදි (සිවුරු රෙදි) නිෂ්පාදනය විය. මේ නිසා වතුර උණු කරමින්, ගස්වල පොතු ගෙඩි ආදිය සොයමින් වෙහස මහන්සි නොවී රෙදි ගෙන සිවුරක් සකස් කිරීම දැන් සිදුකර ගනී. අද වන විට තායි කපු රෙදි වැනි ඉතා සැහැල්ලු මෙන් ම ඇඟට පහසු තරමක් වටිනා රෙදිවලින් සිවුරු මැසීම සිදු කරයි. එවැනි සිවුරු පෙරවීම භික්‍ෂූන් වහන්සේලාට කැප ද? කෙටි පිළිතුර කැපයි යන්නයි.

බුදුරජාණන් වහන්සේ විසින් චීවරය අනුමත කිරීම පිළිබඳ විස්තර, මහාවග්ග පාළියේ අටවන චීවරක්ඛන්ධකයේ සඳහන් වේ. භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටින අවස්ථාවේ දී ජීවක වෛද්‍යවරයා පැමිණ වටිනා සිවුරක් පූජා කරනවා. එය රජතුමාගෙන් ලැබුණු ඉතා වටිනා වස්ත්‍රයකින් සැකසූ සිවුරකි. "බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේත් භික්ෂූන් වහන්සේලාත් පාංශුකූලික සිවුර දරන්නේ. මාගේ අගනා සීවෙය්‍යක වස්ත්‍ර දෙක ගහපති චීවර වශයෙන් පිළිගන්න. භික්ෂූන් වහන්සේලාටත් ගහපති චීවර පිළිගැනීමට අනුමත කරන්න" යයි ඉල්ලා සිටියේය. ජීවක වෛද්‍යවරයාගේ එම ඉල්ලීම පිළිගත් බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ගහපති චීවරය අනුමත කරමි. යමෙක් කැමැති නම් පාංශුකූල සිවුර දරන්න. යමෙක් කැමති නම් ගහපති සිවුර දරන්න. මහණෙනි, ලැබෙන සිවුරකින් සතුටුවීම මම පසසමි" යයි වදාළහ. ඒ අනුව දායකයන් පූජා කරන්නේ නම් වටිනා සිවුරක් පෙරවීම ස්වාමීන් වහන්සේට අකැප නැත.

ගහපති චීවර වශයෙන් සැලකෙන්නේ දායකයන් විසින් සංඝයාට පූජා කෙරෙන මසා නිම කරන ලද චීවර සහ සිවුරු මසා ගැනීමට පූජා කෙරෙන රෙදි ආදියයි. දායකයන්ගේ කැමැත්ත පරිදි, පෞද්ගලිකව එක් භික්ෂුවකට, විහාරස්ථානයකට හෝ පොදු ආයතනවලට හෝ සාංඝිකව පූජා කෙරෙන සිවුරු, ගහපති චීවර වශයෙන් හැඳින්වේ. එනිසා සිවුර වශයෙන් මසා නිම කළ චීවර ද සිවුර මසා ගැනීමට රෙදි ද ගහපති චීවර ම වන්නේය. එවැනි සිවුරු කඨින චීවර පූජාවලදීත් සංඝයාට පූජා කළ හැකි ය. එබැවින් කඨින චීවර පූජාව ද ගහපති චීවර පූජාවකි.

## කඨිනය චීවරය යනු කුමක් ද?

පෙරවස් වැසූ භික්ෂුවක් වස් කඩා නොගෙන (වස්සච්ඡේදනය නොවී) වප් පුරපසළොස්වක දින පවාරණය කළ පසු, දායකයන්ට ලැබෙන විශේෂ අවස්ථාවක් වන්නේ සංඝයාට කඨින චීවරයක් වශයෙන් භාවිතයට සුදුසු තුන් සිවුරුවලින් එකක් හෝ වස්ත්‍රයක් පූජා කිරීමට හැකි වීමයි. එම සිවුර 'කඨින චීවරය' නම් වෙයි. කඨින සිවුරේ ආරම්භය මහාවග්ග පාළියේ හත්වන කඨිනක්ඛන්ධකයේ සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටින කාලයේ පාවෙය්‍ය නුවර වාසය කරන භික්ෂූන් තිස් නමක් බුදුරජාණන් වහන්සේ හමුවීමට සැවැත් නුවර බලා පිටත් වූහ. ආරණ්‍යක, පිණ්ඩපාතික, පාංශුකූලික ධූතාංග ධරයන් වූ උන්වහන්සේලාගේ අපේක්ෂාව වූයේ සැවැත් නුවර වස් විසීමට ය. අතරමඟ දී වස් කාලය පැමිණි නිසාත්, වස් විසීමට සැවැත්නුවරට වැඩීමට කාලය නැති නිසා සාකේත නුවර වස් විසූහ. උන්වහන්සේලා, වප් පසළොස්වක දා පවාරණය කර ගංගාවලින් එතෙර වෙමින් වර්ෂාවෙන් තෙමී දිය සහිත සිවුරු ඇතිව ජේතවනාරාමයට වැඩම කළහ. උන්වහන්සේලා වෙත කරුණාවෙන් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට තුන් සිවුරුවලට අමතර සිවුරක් තිබුණේ නම් පහසු යැයි පෙරවස් විසූ භික්ෂූන්ට විශේෂ සිවුරක් වශයෙන් කඨින චීවරය අනුමත කළහ.

කඨිනයක් ලෙස පූජා කිරීමේ දී තනිපට සිවුර, දෙපට සිවුර, අඳන සිවුර යන තුන් සිවුරෙන් ඕනෑම සිවුරක් පූජා කළ හැකි ය. එහෙත් අපි බොහෝ විට යොදාගන්නේ තනිපට සිවුරයි.

මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි

# The Four Nutriments of Life

## Towards Liberation from Samsara



### General

A careful study of the doctrine of the Tathagata Gautama Buddha shows that some of the concepts which are not frequently discussed can be of paramount importance in realizing the true nature of life. However it is still possible to draw relationships between such important concepts with more familiar principles which are better known. In this regard the subject of " The Four Nutriments of Life" leads us to the very basis of existence and needs a proper analysis for further clarifications. Since a detailed study of the subject can assist a practitioner in moving towards liberation from Samsara, the subject can also be referred to as " Towards Liberation from Samsara through a study of Four Nutriments".

### Terminology

The term **'Nutriments'** in English and **'Ahara'** in Pali or Sinhala can be explained as resources that help us to survive in this world and maintain us in a level of **nourishment**. We are familiar with continuous '**hunger** and **thirst'** and also how we **'crave'** for edible food and drinks developing a greed or attachment known in the doctrine as **'clinging'**. In the doctrine **'Nutriments'** or **'Ahara'** have been given a wide interpretation in a deeper sense to include both '**physical and mental nutriments**'. It is also noteworthy that apart from the wide coverage of explanations an important position has been given to the subject of Nutriments in several discourses of the Sutta Pitaka.

**Discourses in the Sutta Pitaka**

The following are some of the important discourses which deal with the Four Nutriments:

Ahara Sutta in Samyutta Nikaya
Samma Ditthi Sutta in Majjima Nikaya

Dasaka Nipatha in Anguttara Nikaya
Dvayatanupassana Sutta in Sutta Nipata

Atthiraga Sutta in Samyutta N.
Moliya Phagguna Sutta in Samyutta N.

Kalara Katttiya Sutta in Samyutta N.
Maha Satipatthana Sutta in Majjima/Diga N

**Classification into four categories of Nutriments**

In all above discourses the 'Nutriments' or 'Ahara' have been classified into four categories as follows:-

(a) **Edible food and drinks** (Kabalinka Ahara). Proper food has to be consumed in proper quantities. This is an essential component of our nutriments. It is also the commonest form of Nutriment and is a basic need for our survival in the world.

(b) **Contact Nutriments** (Phassa Ahara) are essentials and include all contacts with the rest of the world through the six sense faculties. Contacts through the body such as clean air which human beings breathe and all other physical mental contacts are included. Here too the essential contacts have to be identified as against non-essential contacts. Contentment with essentials can prevent suffering caused by limitless urge for sense pleasures. .

(c) **Mental Volitions**- (Mano Sancetana). Man has the urge to plan, to aspire and to move forward with bigger success. Mental volitions include man's urge to conquer, build, invent, discover, transform and create again and again. There is a will to exist, re-exist and to continue to create larger entities. But failure to achieve targets and plans causes suffering. By avoiding unrealistic plans one can become contented and minimize suffering with realistic aspirations.

(d) **Consciousness** (Vinnana Ahara). Consciousness arises through sense faculties such as eye consciousness, ear consciousness, etc. As per the doctrine, consciousness carries the potential seeds of life. During a lifetime it commences as rebirth-consciousness and continues to provide nutriment through-out the life from the time of birth until death and even beyond death. This too is an essential nutriment which affect the individual through-out Samsara.

**Avoiding non-essential Nutriments**

All four types of nutriments are affected by the attachment of an individual to each one of them resulting in craving ( thanha) and clinging ( upadana). It is noteworthy that they include both physical nutriments and mental nutriments as mentioned above. As regards all four Nutriments it is necessary to note that they are essentials. But the actual need is only up to the level of requirement. By craving or clinging to a higher level which is beyond the need, the unsatisfied thirst and hunger for excessive nutriments cause suffering. What is to be adopted is equanimity towards nutriment, thus avoiding all clinging for excessive nutriment. Minimum essential levels of nutriment have to be provided in order to sustain life. At the same time non-essentials have to be discarded. Adopting a level of equanimity by being dispassionate is seen to be the solution to the problem of suffering through clinging to Nutriments.

**Negative effect of Undigested Edible Food**

Edible food that is consumed gets assimilated in the body. However the food that

is consumed may not get fully digested and absorbed. What is not digested gets discarded or rejected. This can be due to consumption of improper food in improper quantities. The discarded food will have a negative effect on the body causing disease and damage to the system. Mental nutriments such as contact nutriments and mental volitions act in the same way.

In this regard Ven. Nyanaponika in Vision of Dhamma ( p 216) states as follows:-

*" In the mind as well as in the body there is a constant process of grasping and rejecting, assimilating and dissimilating identifying with oneself and alienating. If we look closely at this process of nutrition, physical and mental, we shall notice that it is not only the eater who consumes the food, but also that in the course of assimilation, the food devours the eater. There is thus between them a process of mutual absorption. "*

Mental volitions include ideas, views and opinions which an individual keeps absorbing. When they get hardened he becomes addicted to his own views and become a victim of his own ideas. He loses control of himself, showing the validity of the concept of impersonality.

**Contact Nutriments**

Just like the thirst and hunger for edible food, man has the urge to gain pleasure through sense faculties eye, ear, nose, tongue, body and mind. Seeing a pleasurable picture or entertainment through music and dance are forms of this nutriment called sense contact. Some of the contacts with the body like breathing of air are most essential. Urge for excessive sense pleasures will cause suffering. Contentment and moderation in sense contacts will assist in liberation from suffering which arises through excessive urge for contact nutriments.

**Mental Volitions**

Mental volitions also lead to one's own views, opinions and ideas. When attachment to ideas reach a level of clinging the individual becomes a victim or even a slave of views created by himself. Hence the process of Nutriment shows how the human being becomes a totally helpless victim of his own craving for nutriments. This phenomenon clearly demonstrates the validity of the Theory of Impersonality or Anatta- the unique teaching of the Buddha. By being dispassionate towards views and opinions one can get rid of clinging and avoid suffering.

**Significance of Consciousness as a Nutriment**

From the time of birth into this world each individual inherits rebirth consciousness which provides a form of nourishment which guides his life till the death and continues through the cycle of birth and death. The cumulative effect of past actions which is a guiding factor in living the present life is seen from fluctuating fortunes in one's life. The reason for a person to suffer unexpected problems in life appears to be due to the nutriment of consciousness. Other nutriments namely, edible food, contacts through sense faculties and mental volitions are controllable by each individual through an approach of equanimity or being contented.

**Impermanence and Suffering seen through Nutrition**

If we consider hunger and thirst which are insatiable it is noteworthy that there is constant need to replenish the human body with edible food, indicating a very clear form of impermanence. The round of eating and becoming hungry again and again is a clear form of continuous suffering. We do not realize that there is continuous form of impermanence and suffering in the replenishment of food because of our greed for food which we try to satisfy

again and again. Even though the concepts of Impermanence and Unsatisfactoriness are comparatively easier to appreciate and understand, the concept of Impersonality is rather deep and the most revolutionizing concept. However the subject of nutriments is helpful in appreciating the validity of Impersonality which is also called the doctrine of Anatta Thus the four nutriments are examples of all three fundamental characteristics of the universe – Impermanence, Suffering and Impersonality.

**.One Thing Which Leads to Nibbana**

Anguttrara Nikaya's Dasaka Nipata emphasizes that 'the one thing' for which an individual can get dispassionate and can get liberated from Samsara, here and now, is " Four Nutriments"

Concept of four nutriments therefore helps us in progressing towards liberation from Samsara by becoming fully equanimous towards the four nutriments. It is also greatly beneficial in assisting the practitioners to appreciate the validity of the concept of impersonality or the Doctrine of **Anatta.**

In fact the whole civilization of mankind is one struggle in search of food. Samma Ditthi Sutta in Majjima Nikaya clearly states that the subject of four noble truths is clearly understood through the struggle for the nutriments.

May all beings be well and happy.!

**Das Miriyagalla**
(Based on a talk given at Maithri Hall on 11th November 2017 )

***For further Reading:-***

*The Vision of Dhamma -*
*Ven. Nyanaponika Thera , Buddhist Publication Society1994*

*What the Buddha Taught-*
*Ven. Walpola Rahula Thera, Gordon Fraser GalleryLtd 1978*

*Nibbana -The Mind Stilled-*
*Ven KatukurundeNyanananda Thera, PotgulgalaDDMB,2015*

---


සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මූලස්ථානයේ, සෑම පසළොස්වක පොහෝ දිනකම පවත්වනු ලබන උපෝසථ ශීල සමාධි වැඩසටහනට සහභාගිවන සියලුම පින්වතුන් සඳහා, පසුගිය වසර දහඅටක් (18) පුරා නොකඩවා උදේ දානය සපයා දුන්,

**සිරිමයුර හෝටල් ව්‍යාපාරයේ අධිපති, පරලෝසැපත්**
**කේ.එච්.එම්. ආරියපාල මුදලාලි මහතා හා චිත්‍රා පෙරේරා මැතිනියට**
**එපින් බෙලෙන් අජරාමර නිවන්සුව ලැබේවායි පතමු.**

එම මහඟු පුණ්‍යකර්මය නොනවත්වා සිදු කරනු ලබන එම දෙපළ ගේ
ආදරණීය පුත්
**කේ.එච්.ඒ. චන්දන මහතාට**
ඒ සඳහා අවශ්‍ය ධෛර්යය ශක්තිය, තෙරුවන් සරණින් ලැබේවායි පතමු!

# භික්ෂුණී ශාසනයේ ආරම්භය සංවර්ධනය හා පිරිහීම



මහා ප්‍රජාපතී දේවිය විසින් අරඹන ලද භික්ෂුණී ශාසනය ඉන්දියාවේ සියවස් හතරකට ආසන්න කාලයක් පැවතියත්, ඉන්දියාවෙන් අතුරුදන් වී යන තත්ත්වයට මඟ පෑදී තිබියදී ලක්දිවට පැමිණි මිහිඳු හිමියන්ගෙන් බණ දහම් ඇසූ අනුලාවෝ ඇතුළු පිරිස මහණ වීමට කැමැත්ත ප්‍රකාශ කළ ද, එම කාර්යය සිදු කිරීමට තම නැඟණිය වන සංඝමිත්තාවන් සිරිලකට වැඩමවීමට අශෝක මහරජුට හසුන් පත් යවන්නැයි දේවානම්පියතිස්ස රජුට මිහිඳු හිමියන් දැනුම් දීමෙන් ලාංකේය කාන්තාවන්ගේ අභිවෘද්ධියට මඟ පෑදුණු බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි.

එනම් තුන්වන ශත වර්ෂයේ දී (ක්‍රි.පූ. 237) මිහිඳු මාහිමියන් පොසොන් පෝය දා ශ්‍රී ලංකාවට වැඩම වීමෙන් පසු සඟමිත් තෙරණියගේ ආගමනයෙන් ශ්‍රී ලාංකික භික්ෂුණී ශාසනය ආරම්භ විය. ලංකා භික්ෂුණී ශාසනය පිළිබඳව තොරතුරු සපයා ගැනීම විරල වුවත් නොසිඳී ගලායන ඉතිහාසයක් ලංකාවේ මෙහෙණී සසුනට නොමැත.

නමුත් ඉන්දියාවේ භික්ෂුණී ශාසනය සියවස් හතරකට ආසන්න කාලයක් පැවතියත් ශ්‍රී ලංකාවේ සියවස් දොළහක් (12) පමණ කාලයක් මෙහෙණී සසුන පවත්වා ගෙන පැමිණි බව මහාවංශය, සමන්ත පාසාදිකාව හා දීපවංශය ආදී ඉතිහාසගත වාර්තාවන් නිසා දැනගැනීමට ඉඩ ප්‍රස්ථා හිමිව ඇත.

අනුලා දේවියගේ පැතුම ඉටුකර දීමට දේවානම්පියතිස්ස ලකියුරාණෝ මිහිඳු මාහිමියන්ගේ අනුශාසනා පරිදි සඟමිත් තෙරණිය කැඳවාගෙන ඒමට අරිට්ඨ කුමරු ඇතුළු පිරිසක් ඉන්දියාවේ ධර්මාශෝක රජු වෙත යැවීය. සඟමිත් තෙරණිය

පැමිණෙන තෙක් අනුලා දේවී ඇතුළු පිරිස දසසිල් රකිමින් දෙවන පිය රජු විසින් කරවන ලද උපාසිකාරාම මෙහෙණ වරට වී සිටියහ.

උඳුවප් මාසයේ දී (දෙසැම්බර් මස) සඟමිත් තෙරණිය ඇතුළු පිරිස තාම්‍රලිප්ත නගරයෙන් නැව් නැග ශ්‍රී ලංකාවේ දඹකොළ පටුන වරායට පැමිණියේ උඳුවප් පුන් පෝය දිනකදීය. සඟමිත් තෙරණිය සමඟ පැමිණි අය අතර උත්තරා, හේමා, ප්‍රසාද ජාලා, අග්නිමිත්තා, දායිකා, වේග්ගු, පබ්බතා, මත්තා, ධම්මදියා, මහාදේවී, පදුමා, හේමසා, උත්තලා, අඤ්ජලී හා සුමා ආදී තෙරණියන් පිරිසක් පැමිණියහ.

ඉන්දියාවේ සාංචි ස්තූපයේ නැඟෙනහිර වාහල්කඩ මුදුනේ නිරූපිත කැටයමකින් සංඝමිත්තාවන්ගේ ලංකා ගමන සනාථ කෙරෙන බව ග්‍රූන්ඩ්වේල් විසින් පෙන්වා දී ඇතැයි මහාචාර්ය ගෛගර් පඬිවරයා මහාවංශ ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් කරයි.

සඟමිත් තෙරණිය ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් පසු ලංකාවේ දී පැවිදිව උපසම්පදා වූ අය අතර සද්ධම්ම නන්දි, සෝමා, ගිරිද්දි, දාසියා, ධම්මා, ධම්මපාලා, මහිලා, සොහොනා, ධම්ම තාපසා, හරමිත්තා, සානා, කාලී හා උත්තරා යන නම් දීපවංශයේ සඳහන්ය.

ඒ අනුව යමින් දහස් සංඛ්‍යාත පිරිස් (කාන්තාවන්) පැවිදි බව ලැබූ අතර, මෙම පිරිසට රැඳී සිටීමට උපාසිකා මෙහෙණවර ප්‍රමාණවත් නොවීම නිසා දෙවනපෑතිස් රජු චූලඩ්ගන මහාඩ්ගණ, සිරිවඩ්ගණ, යන මන්දිර 3 ඇතුළු ප්‍රසාද 12 ක් කර වූ බව මහාවංශයේ වැඩිදුරටත් විස්තර කරමින් කියා සිටී. සඟමිත් තෙරණිය පැමිණි නැවේ උපකරණ එක ආරාමයක තැන්පත් කර ඇත.

සියලුම ආරාම මෙහෙණින් වහන්සේලාගෙන් පිරී ගිය අතර සඟමිත් තෙරණිය විවේකීව විසීමට කැමති හෙයින් චෛතියගිරියට පැමිණි බව ඇසූ රජු හත්ථාල්හක මෙහෙණවර කරවා පිදීය.

නගරයෙන් පිට විසීමට භික්ෂුණීන්ට අවසර නොතිබූ අතර, නගරයෙන් ඈත ගිරි ලෙන් ආදියෙහි ජීවත් වූ බවට සාක්ෂි සාධක පවා නැත.

සඟමිත් තෙරණිය ලක්දිවට පැමිණි පසු මෙහෙණි ආරාමයේ වැඩසිටි අය ද විනය පිටකය හා ධර්මය ඉගැන්වීමෙන් පසු ඒ අය ද, ධර්ම විනය භික්ෂුණීන් බවට පත්විය.

සඟමිත් තෙරණිය උත්තිය රජු දෙවන පිය රජුගේ බාල සහෝදරයාගේ රාජ්‍ය සමයේ දී නවවන වසරේ දී පිරිනිවුවාය. එතැනින් පසු භික්ෂුණී ශාසනය පසුබෑමකට පත්විය. එතැන් සිට දුටුගැමුණු රාජ්‍ය කාලය දක්වා නිහඬය. ඒ රජු සමයේ දී එහි නවෝදයක් ඇතිවිය. මහිලා, සමන්තා, ගිරිකාලී, දාසි හා කාලී යන මෙහෙණින් වහන්සේලා රුහුණේ සිට අනුරාධපුරයට පැමිණ විනය ඉගෙනගත් බවත්, මහිලා හා සමන්තා කාවන්තිස්ස රජුගේ දියණියන් මෙන්ම දුටුගැමුණු රජුගේ සොහොයුරියන් බව සඳහන් වේ.

ගිරිකාලී මෙහෙණිය කාවන්තිස්ස රජුගේ පුරෝහිතයාගේ දියණිය වේ. දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද මිරිසවැටි විහාර පූජාවට භික්ෂුණීන් 90,000 (අනූදහසක්) පැමිණි බව මහාවංශය කියයි.

සද්ධාතිස්ස රජු සමයේ දී මෙහෙණින් වහන්සේලාට විශේෂ ආරාම තනවා දුන් බවත්, එතුමාගේ වැඩිමහල් පුතු වූ ලජ්ජිතිස්ස (බු.ව. 425 - 434) හාල් හා අනිකුත් අවශ්‍ය දෑ ආරාම වෙත ගෙන දුන්නේ මෙහෙණින් වහන්සේලාගේ ජීවන මාර්ගය පිණිසමය.

වළගම්බා රජු සමුයේ දී සමුද්ධ නාවා, දේවී, සීවලා යන අයට භික්ෂුණී ආරාම 2 ක් තිබූ බවත් සඳහන් වෙයි. එපමණක් නොවේ මහානාම රජු සමයේ (ක්‍රි.ව. 412 - 434) ලංකාවේ විසූ දේවසරා භික්ෂුණිය ප්‍රධාන කණ්ඩායමක් චීනයට ගොස් භික්ෂුණී ශාසනය පිහිට වූ බවත්, චීන කාන්තාවන් මහණ කරවීම, ආදිය සිදුකළ බවත් චීන භික්ෂුණීන් උපසම්පදා තත්ත්වයට පත් කළ බවත්, වසර 12 ක කාලයක් චීනයේ ගතකළ බව ද ශාසන ඉතිහාසයේ දැක්වේ.

පළමුවන මුගලන් රජු (ක්‍රි.ව. 298 - 315) 'රාජනී' නම් මෙහෙණවරක් ඉදිකර සාගලික භික්ෂුණීන්ට පූජා කළ බව චූලවංශය සඳහන් කරයි. එසේම දෙවන අක්බෝ රජු සමයේ දී කලිඟු රට රජතුමා, බිසව, ඇමතියා ද ශ්‍රී ලංකාවට පැමිණ

# බෞද්ධාලෝකය



සඟමිත් තෙරණිය ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් පසු ලංකාවේ දී පැවිදිව උපසම්පදා වූ අය අතර සද්ධම්ම නන්දි, සෝමා, ගිරිද්දි, දාසියා, ධම්මා, ධම්මපාලා, මහිලා, සොභොනා, ධම්ම තාපසා, හරමිත්තා, සානා, කාලී හා උත්තරා යන නම් දීපවංශයේ සඳහන්ය.

පැවිදි වූ බව මහාවංශය සඳහන් කරයි. මේ සමයේ දී අක්බෝ රජ බිසව කලිඟු රජ බිසවට උවැටන් කළ බව ද කියැවේ.

තුන්වන දෙටුතිස් රජ දවසේ දී රජ මෙහෙසිය රජුගේ ඉල්ලීම පරිදි ශාසනයේ පැවිදිව අභිධර්මය ඉගෙන ගත්තේය. එම බිසෝ මෙහෙණිය ධර්මාසනාරූඪව අභිධර්මය දේශනා කළ බව කියැවේ. එසේම හතර වන අක්බෝ රජුගේ -'ජෙට්ඨා'- නම් මෙහෙසිය - 'ජෙට්ඨාරාම' නම් මෙහෙණවරක් කරවා ඒ ආරාමයට පත්ත පාසාණ ප්‍රදේශයේ වූ ගම් දෙකක් ද බුද්ධ හෙළ නම් ගම ද ආරාමිකයන් සියයක් ද දුන් බව සඳහන්ය. එම විහාර මෙහෙණවරහි කටයුතු කිරීමට සියයක් දෙනා සිටීමෙන් පෙනී යන්නේ එහි වැඩ වාසය කළ භික්ෂුණීන්ගේ පිරිස විශාල සංඛ්‍යාවක් සිටින්නට ඇති බවය.

දෙවන දප්පුල රජු සමයේ දී ඒ රජුගේ සේනා නම් මෙහෙසියක් සිටි බවත්, ඇය 'ශිලාමේඝ' නම් මෙහෙණවරක් කරවා මෙහෙණින් වහන්සේලාට සිව්පසය දුන් බවත් කියැවේ. සිව්වන කාශ්‍යප රජ තිස්සාරාම මෙහෙණවර කරවා එහි සිටි භික්ෂුණීන්ට මිරිසවැටිය හා මහා බෝධිය භාර කළ බව චූලවංශය සඳහන් කරයි. එයට අමතරව සිව්වැනි කාශ්‍යප රජු විසින් කරවන ලද ගෝවැව ගල් සන්නස ද එයට සාක්ෂි දරයි.


හතරවන මිහිඳු රජතුමා සෙල්ලිපියේ භික්ෂුණීන් සඳහා පිහිට වූ දාන ශාලාවක් හා උපස්ථාන ශාලාවක් ගැන සඳහන් කරයි. එසේම මොහුගේ ජේතවනාරාම ශිලා ලිපියෙහි 'අසරණ මෙහෙණ ගණට' - මෙහෙණවරක් කර වූ බව සඳහන් වෙයි. මෙහිදී අසරණ යන්න යෙදීමෙන් පෙනී යන්නේ භික්ෂුණී සමාජය දුර්වල තත්ත්වයක පැවති බවයි.

සිව්වන මිහිඳු රජුගෙන් පසු භික්ෂුණී සමාජය ගැන අසන්නට ශාසන ඉතිහාසයේ ඉඩ නොලැබේ. එයින් කියැවනුයේ භික්ෂුණී ශාසනය නොපැවතී බවයි. අනුරාධපුර අග භාග්‍යය වන විට රටේ පැවති අභ්‍යන්තර අවුල් වියවුල් නිසා සහ විදේශ ආක්‍රමණ නිසා පිරිහීමට පත්විය. හතරවන මිහිඳු රජුගෙන් පසු ලංකා ඉතිහාසයේ බෞද්ධ ආධිපත්‍ය ගිලිහී යෑම නිසා භික්ෂුණී ශාසනය අතුරුදන් වන්නට විය.

පොළොන්නරු යුගයේ දී මහා පැරකුම්බාවන්, මහා විජයබාවන් ශාසන ශෝධනය කරවා ශ්‍රී ලංකාව යළි එක්සේසත් කළ මෙහෙය නිසා භික්ෂුණී ශාසනය නගාලීමට මහත් වෙහෙසක් දැරූ බව ශාසන ඉතිහාසය තුළ දකින්නට ඇත.

භික්ෂු සංවිධානයේ සංවිධානාත්මක භාවය වළගම්බා රජ සමයේ දී පරිහානිය කරා යෑම නිසා භික්ෂුව කෙරෙහි තිබූ මහජන ගෞරවය නැතිවිය. එය පරිහානිය කරා යාමට මඟ පෑදීය. මේ තත්ත්වය මත පසු කාලයේ දී මෙහෙණිවරුන්ව රජ කුමාරවරුන් පැහැර ගෙන යෑම සිදු වූ බව සඳහන් කරන ඉතිහාසය ඒ වන විට භික්ෂුණීන්ගේ අධ්‍යාත්මික පිරිහීමකට පත්ව තිබීම නිසා බව ඉතිහාසය පෙන්වා දෙයි. එයට අමතරව සාගත, ස්වභාව ධර්මයේ බලපෑම් මෙහෙණි ශාසනයේ පරිහානියට හේතු සාධක විය.

පොතපත ඇසුරින් සකස් කළේ
රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති -
දිසානායක හේරත්
හතර ඇළ, හිදෝගම, අනුරාධපුරය.



# කෝට්ටේ යුගයේ පිරිවෙණ් අධ්‍යාපනය සහ සාහිත්‍ය ප්‍රබෝධය

කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍ය දියුණු වූයේ පිරිවෙන් අධ්‍යාපනය නිසාය. බුදුරජුගේ දවස 'පිරිවෙණ' යන්න ව්‍යවහාර කර ඇත්තේ සමස්ත මුළු යුගයේ අධ්‍යාපනය සඳහාය. එහෙත්, එකල පිරිවෙණ යන නමින් සඳහන් වූයේ නැත.

ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් පසු අධ්‍යාපනය පවත්වා ගෙන යන මධ්‍යස්ථානය මහා විහාරය බව අවිවාදයෙන්ම පිළිගත යුතුය. එදා මිහිඳු මාහිමියන් විසින් අනුරාධපුර මහ මෙව්නාවේ පිහිටුවන ලද මහා විහාරය ථෙරවාදී අධ්‍යාපනයේ මූලස්ථානය විය. එදා අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ ලෝවාමහාපාය පිහිටි ස්ථානයේ බව බෞද්ධ පොත පත සාක්ෂි දරයි. දේවානම්පියතිස්ස රජු කල මේ ස්ථානයේ එම අධ්‍යාපන මධ්‍යස්ථානය විය.

ධර්මය ඉගැන්වීමේ දී ඒ ආරම්භක යුගය ධර්මයේ ඒ ඒ කොටස් ඉගැන්වූ අධ්‍යාපන 'ගණ' යන මැයෙන් සඳහන් කෙරිණි. ඒ කොටස් ඉගැන්වූ ආචාර්යවරුන් 'විනය' - 'සූත්‍ර' - 'අභිධර්ම' වශයෙන් ඉගැන්වීමෙහි යෙදුණ බවද කියැවේ.

ඒ මහා විහාර අධ්‍යාපන ආයතනයෙහි සම්භාවනීය ආචාර්යවරුන් වූයේ 'චූල නාග', - 'ධම්ම රක්ඛිත' - 'උපතිස්ස' - 'මහා සම්මත' - 'මහා පදුම' යන තෙරවරුන් වහන්සේලාය. මෙම මහා විහාරය පසු කලක අභයගිරිය, ජේතවනය ආදී වශයෙන් නිකායන්වලට බෙදී ගිය පසු ඒ ඒ ආයතනවල ස්වාධීන ඉගැන්වීම් ක්‍රම පද්ධතියක් ක්‍රියාත්මක වූ බව සඳහන්ය.

ඒ අතීතයේ අධ්‍යාපන ආයතන සඳහා 'ගණ' යන්න ව්‍යවහාර වී ඇතත් 'පිරිවෙණ' යනුවෙන් භාවිතයේ පැවති බව හමු නොවේ.

01. පණ්ඩුපලාස

02. සාමණේර

03. උප සපත්

04. නිස්සය මුව වහක

ආදි ශිෂ්‍ය කණ්ඩායම්වලට ධර්ම විනය සම්බන්ධව වෙන වෙනම නිර්දේශ පත්‍ර අනුගමනය විය. පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් මඟින් එම අධ්‍යාපන නිර්දේශ අවධාරණය කර ඇත.

එහෙත් කෝට්ටේ යුගය මේ බෞද්ධ අධ්‍යාපන ආයතන සඳහා 'පිරිවෙණ' යන්න ව්‍යවහාර වූ බවත්, එම අධ්‍යාපන ආයතනවලින් ගිහි පැවිදි අය ඉගෙනීමට යෙදන බවත් සඳහන් වෙයි.

කෝට්ටේ යුගය බිහිවීමට හේතු සාධක වශයෙන් උතුරේ ආර්ය චක්‍රවර්තීගේ ද්‍රවිඩ රාජ්‍යයෙන් එල්ල වූ සතුරු උවදුරු නිසා සඳහන් කෙරේ. එවැනි තත්ත්වයන් මැද මහා වීදාගම මාහිමියන්ගේ බලවත් සහයෝගය ඇතිව ක්‍රි.ව. 1412 දී සවන පැරකුම්බා (VI වන පරාක්‍රමබාහු) කෝට්ටේ රජ වූ පසු එතැන් සිට ක්‍රි.ව. 1580 දක්වා එය රාජධානියක් වශයෙන් පුරා අවුරුදු 165 ක් පැවතිණි. එය මෙසේ දැක්විය හැකිය.

01. සවන සිරි පැරකුම්බා - (ක්‍රි.ව. 1412 සිට 1467)

02. ජයබාහු (දෙවැනි) - (ක්‍රි.ව. 1467 සිට 1469)

03. හයවැනි බුවනෙකබාහු - (ක්‍රි.ව. 1469 සිට 1476)

04. හත්වැනි පණ්ඩිත පරාක්‍රමබාහු - (ක්‍රි.ව. 1476 සිට 1485)

05. අටවැනි වීර පරාක්‍රමබාහු - (ක්‍රි.ව. 1485 සිට 1505)

06. ධර්ම පරාක්‍රමබාහු (IX) - (ක්‍රි.ව. 1467 සිට 1469)

07. හත්වන විජයබාහු - (ක්‍රි.ව. 1528 සිට 1529)

08. අටවන බුවනෙකබා - (ක්‍රි.ව. 1529 සිට 1550)

09. දොන් ජුවන් ධර්මපාල - (ක්‍රි.ව. 1550 සිට 1580)

පුරා අවුරුදු 165 ක් පැවැති පහතරට ප්‍රථම රාජ්‍ය වන කෝට්ටේ රාජ්‍යය දීප්තිමත් රාජ්‍යයක් සේ සැලකෙන අවධිය වන්නේ සවැනි සිරි පැරකුම්බාවන්ගේ රාජ්‍ය පාලනය පැවැති කාලයයි. එම කාලය අවුරුදු 55 කි. ඉන්පසු සාමකාමී පරිසරය කෙමෙන් අවසන් විය.

සවන පැරකුම්බාවන් ශ්‍රී ලංකාව එක්සේසත් කරමින් ගොඩනැගූ පරිසරය සිංහල භාෂා සාහිත්‍ය සංවර්ධනයට අතිශයින් හිතකර විය. සවැනි සිරි පැරකුම්බා සාහිත්‍යධරයෙකි; උගතෙකි; පඬිවරයෙකි. අනිකුත් සාහිත්‍යධරයන්ට, පඬිවරයන්ට, උගතුන්ට අතහිත දුන්නේය. කෝට්ටේ යුගයේ සිංහල භාෂා සාහිත්‍ය ප්‍රබෝධයට බලපෑ ප්‍රධාන සාධකය එය විය. මේ යුගයේ දී 'ෂඩ් භාෂා පරමේශ්වර' උපාධියෙන් පිදුම් ලද මාහිමිවරු තෙනමක් (තුන්දෙනෙක්) වැඩ සිටියහ.

01. උතුරු මූල මහ තෙරිඳු

02 තොටගමුවේ සිරි රහල් මාහිමි

03. තිලක පිරිවෙන්පති හිමි

යනු වී තිදෙනාගේ ආකර්ෂණීය පෞරුෂය ද කෝට්ටේ යුගයේ භාෂා සාහිත්‍ය ප්‍රබෝධයට බල පෑ බව කියන්න පුළුවනි. ඉහත නම් සඳහන් තිදෙනා වහන්සේලා මෙන්ම සවැනි සිරි පැරකුම්බා රජු හැරුණු විට තවත් ඉතා ප්‍රසිද්ධ ගිහි පඬිවරුන් රැසක්ම සිටි බවට මෙහි පහත දක්වමි.

01. සිද්ධාර්ථ විමලකීර්ති ධම්මදින්නා හිමි

02. නන්නූරුතුනයා මිණි සන්නස් මැති

03. ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී

04. දෙවිනුවර තිලක පිරිවෙන්පති හිමි

05. වීදාගම මෛත්‍රී හිමි

06. වෑත්තෑවේ හිමි

07. කෑරගල පද්මාවතී පිරිවෙන්පති වනරතන නාහිමි

08. වීදාගම ත්‍රී සිංහල කවි තිලක

09. උස්සාපිටියේ මහ පියා පිරිවෙන්පති නාහිමි

10. ගලතුරුමුල මේධංකර හිමි

11. බුවනෙකබා හිමි

12. සප්තරත්න පතිරාජ පිරුවෙන්පති හිමි

13. ගතාරා පිරුවෙන්පති

14. නියඳවනේ එුස්සදේව හිමි

15. එරබත්තොට ධර්මරාජ පිරුවෙන්පති හිමි

16. පංචමූල පරිවේණාධිපති

එකල පතපොත ලිවීම සඳහා ලේඛකයින් උනන්දු කරවූ ඒ සඳහා ඔවුන්ට අතහිත දුන් ගිහි-පැවිදි විශාල පිරිස අතර පහත දැක්වෙන අයට විශේෂත්වයක් තිබුණි.

01. වික්‍රමබාහු මහ ස්ථවිර

02. වීරසුන්දර කුමාර

03. පනික්කි මැතිඳු
04. උලකුඩය දේවි
05. හලාවත ජයපාල මැතිඳු
06. කවිගජ ශේඛර

කෝට්ටේ යුගයේ සාහිත්‍ය දියුණුවට බල පෑ ප්‍රධාන පිරිවෙන් හයක් පැවැති අතර, ඒ පිරිවෙන්වල ප්‍රධානත්වය දැරූ අය මෙසේ දැක්විය හැකිය.

01. තොටගමුවේ විජයබා පිරිවෙණ - ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ රාහුල සඟරාජ හිමි
02. කෑරගල පද්මාවතී පිරිවෙණ - කෑරගල වනරතන හිමි
03. වීදාගම ඝනානන්ද පිරිවෙණ - දෙවිනුවර තිලක හිමි
04. දෙවිනුවර තිලක පිරිවෙණ - දෙවිනුවර තිලක හිමි
05. පැපිළියානේ සුනේත්‍රා දේවී පිරිවෙණ - සුනේත්‍රාදේවි බිසව
06. ජයවර්ධනපුර සිරි පැරකුම්බා පිරිවෙණ - සවැනි පැරකුම්බා මහරජ

පැවිදි දිවිය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති ධර්ම විනය මැනවින් හදාළ භාෂා හා පුළුල් සාහිත්‍ය ඥාණයෙන් සමන්විත සම්භාව්‍ය පඬිවරයෙක් බිහි කිරීම ආරම්භක යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථය වූ අතර, සමාජයට මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි පිරිපුන් පැවිදි උගතුන් බිහි කිරීම සෑම පිරිවෙණකින්ම සිදුවිය. එසේම ගිහි පිරිසට ද එහි දායකත්වය ලබාදීම ද පසු කලක සිදුකෙරුණු බව පෙනේ.

එසේම පිරිවෙන් පිළිබඳව සන්දේශ සාහිත්‍යයේ ද දැක්වේ. අතීතයේ දී තොටගමුවේ විජයබා පිරිවෙණෙහි පුළුල් විෂය මාලාවක් භාවිත වූ අතර, භාරතයෙන් බ්‍රහ්මණයන් පැමිණ නක්ෂත්‍රය හා සංස්කෘත භාෂාව ද හදාළ බව දැක්වේ.

කෝට්ටේ යුගයේ බිහිවූ අදටත් අප අතර පොත්පත් රැසක්ම පරිශීලනය වේ. අද එහි පාසල් විභාග හා පාසල් විභාග අතර පමණක් නොව, විශ්වවිද්‍යාල අතර ද සැළලිහිණිය, බුදුගුණ අලංකාරය, හංසය වැනි පොත පත උදාහරණ වශයෙන් පෙන්විය හැකිය.

කෙසේ වෙනත් කෝට්ටේ යුගයේ ලියැවුණු පොතපත අතර විමසීමක් මෙහි ඉදිරිපත් කරමි.

01. සංදේශ සාහිත්‍යය (කාව්‍යය)
පරවි සංදේශය - සැළලිහිණි සංදේශය - කෝකිල සංදේශය - ගිරා සංදේශය - හංස සංදේශය

02. ශතක කාව්‍යය -
එළු සිලෝ ශතකය - භක්ති ශතකය

03. ජාතක කාව්‍යය
කාව්‍යශේඛරය - ගුත්තිලය

04. ධර්ම කාව්‍යය
බුදුගුණ අලංකාරය - ලෝවැඩ සඟරාව

05. ප්‍රහේලිකා /තේරවිලි කාව්‍යය
දහම් ගැට මාලාව - දහම් ගැට - දහම් ගැට පදාර්ථ

06. කාව්‍යෝපදේශ ග්‍රන්ථ
වෘත්තරත්නාකර පඤ්චිකාව - කව් ලකුණු මිණ - කව් ලකුණු මිණිමල

07. නිඝණ්ඩු ග්‍රන්ථ
රුවන් මල - නාමාවලිය

08. පර්යේෂණ ග්‍රන්ථ
1. බුද්ධිප්ප සාධනී ටීකාව
2. පඤ්චිකා ප්‍රදීපය

09. ධර්ම ග්‍රන්ථ
1. සද්ධර්ම රත්නාකරය
2. චුල්ල බෝධි වංශය
3. එළු අත්තනගලු වංශය
4. කර්නානිසංසය

යනාදී සාහිත්‍ය පොත් රැසක් කෝට්ටේ යුගයෙන් අපට දායාද කර ගනී. ගද්‍ය සාහිත්‍යයට වඩා පද්‍ය සාහිත්‍යයට ප්‍රධාන ස්ථානයක් හිමි විය.

**ශාස්ත්‍රපති - ලොකුබණ්ඩාර මුණසිංහ**

(මුළු දිවයිනටම සාම විනිසුරු)

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඉල් - උඳුවප්



# බොදු පිළිවෙතින් හෙළිවන සමාජ සේවාව අගයමු

විල් දිය දහසකදී සුවහසක් මල් නෙළුම් පිපුණා ද එකී මල් සුවඳ ගම් දනව් සිසාරා පැතිරුණා ද සුන්දර ගෙත්තමක් සේ විචිත්‍රවත් රටා මැවුව ද ලොව එතෙක් මෙතෙක් බිහිවූ එකම පද්මෝදාරය වන බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට බොදු පිළිවෙතින් හෙළි වන සමාජ සේවාව පිළිබඳව විමසා බැලීම අද වත්මන් වූ වල්මත් සමාජයට යෝග්‍යය.

බුදුරජාණන් වහන්සේගේ බුද්ධ චරිතය වූ කලී දස දෙසට එළිය කරන්නා වූ ප්‍රඥා ප්‍රදීපයක් සේ අගය කළ හැකිය. බුද්ධ චරිතය තුළින් අපහට මාහැඟි සදුපදේශ රැසක් මෙන්ම ආදර්ශ ද ලබාගත හැකිය. බුදු පිළිවෙතින් සැරසීම අපගේ දිවිය සිල් සුවඳින් ඔපවත් කරනු ඇත. බුදුරජාණන් වහන්සේ භික්ෂු - භික්ෂුණී උපාසක - උපාසිකා යන සිව් පිරිසටම මාර්ගෝපදේශකයාණන් විය. තාදි ගුණය, මහා කරුණාව, පුරිස ධම්මසාරථී ගුණය, ඉවසීම හා අසරණ සරණ ගුණය... ආදී ගුණ කඳ බුද්ධ චරිතය සුපෝෂණය කරන්නට විය.

එමඟින් වත්මන් සමාජ ප්‍රවාහයේ ගමන් ගන්නා අපට මනා ආදර්ශ සපයන්නා සේම මා හැඟී සමාජ සේවාවක් ද ඉටු කරනු ඇත. අප ද ඉහත සඳහන් කරන ලද ගුණයන්ගෙන් පෝෂණය වූ විට සමාජයේ එකිනෙකා අතර සබැඳියාව මනා සේ පවත්වා ගැනීමට දොරගුළු විවර වනු ඇත. මක් නිසා ද යත් මල් ගොමු අතරේ පියාසලා යන මීමැසි සමූහයා ගුමු ගුමු නද නන්වන්නා සේ පුද්ගල සිත තුළ විසිතුරු සිතිවිලි ජනිත වී ගැටුමෙන් තොරව සාමය සමඟිය රජයන බැවිනි. ගිහියන් වන අප ද බුදු සිරිතෙන් ආදර්ශ ගෙන ඉවසීමේ ගුණය ප්‍රගුණ කළ විට එකිනෙකා අතර විරසක, ගැටුම්, කෝලාහල අවම වනු ඇත. මන්ද යත් අන්‍යය මත ඉවසන, ගරු කරන පුද්ගලයන් සමාජයේ බිහිවන බැවිනි.

එවිට සමාජයේ සාමය සමඟිය පැතිර යන්නේ බුදුරජාණන් වහන්සේ කැමති ප්‍රඥා ප්‍රදීපයේ ආලෝකයෙනි. එසේම ඉවසීමේ මෙන්ම කම්පා නොවීමේ ගුණය ද බෞද්ධ දිවියට අත්‍යවශ්‍යය මෙවන් ගුණාංග අප දිවියට එක්කර ගැනීම තුළින් බොදු පිළිවෙතක ගමන් කිරීමට දොරටු විවර වනු ඇත. පංචශීලය ගිහියාගේ නිත්‍ය ශීලයයි. පංචශීල ප්‍රතිපදාව තුළින් පසක් වන්නේ ද බොදු පිළිවෙතින් හෙළිවන සමාජ සේවයයි. නිදසුනක් ගතහොත් ප්‍රාණඝාතයෙන් වැළකුණු සමාජයේ කවර මොහොතක හෝ කවරකු විසින් තම ජීවිතය විනාශ කරයි යන බියෙන් තොරව ජීවත් වීමට හැකිය. එවිට එම සමාජයේ වෙසෙන්නේ සතුන්ට අනුකම්පාව දක්වන අන් අයගේ ජීවිත ආරක්ෂා කරන පුද්ගලයන්ය. එසේම සොරකමින් වැළකුණ සමාජයේ ද තම සම්පත් සොරා කෑමට ලක්වේ යැයි බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට හැකියාව ලැබේ.

කාම මිථ්‍යාචාරය සමාජයෙන් දුරස් වූ විට සමාජයේ කාම අපරාධ අවම වී අඹුසැමි විශ්වාසය තහවුරු වනු ඇත. මුසාවාදයෙන් තොර වූ විට සියල්ලන්ගේම සන්නිවේදන අයිතිය සුරැකෙනු ඇත. දූෂිත සමාජයක ලක්ෂණයක් වූ සුරාපානය තුළින් පුද්ගලයන් දුරස් වූ විට ගැටුම් අවම වී සාමය දස දිගාන්තය පුරා පැතිර යනු ඇත. මෙසේ බලන කල පංචශීල ප්‍රතිපදාව අප දිවියට වැළඳ ගැනීම තුළින් ඉටුවන සමාජ මෙහෙවර ඉමහත්ය.

විකසිත පුෂ්පයක් වටා බඹරුන් දෙබරුන් සැරිසරන්නේද එම පුෂ්පය වටාම සමනලුන් මල් රටා මවමින් පියඹන්නේ ද එහි රොන් තමා සන්තක කර ගැනීමටය. එසේම අප බුදුදහම වටා එහි හරය, සාරය උරා බීමට එකිනෙකට වෙනස් බොහෝ දෙනා රොක්වන්නේ එය කිසිම දිනක මිලින නොවන සමාජයේ ඇති සුවඳවත්ම පුෂ්පය නිසාවෙනි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ගිහි විනය ලෙස හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රය සර්ව කාලීන වටිනාකමක් ඇති සූත්‍ර දේශනාවකි. එහි සඳහන් ෂඩ්විද යුතුකම් සමාජයේ යහපත් සම්බන්ධතා පවත්වා ගැනීමට උපකාරී වේ. ගිහි පැවිදි යුතුකම්, අඹුසැමි යුතුකම්, මාපිය දූ දරු යුතුකම්, හිතමිතුරු යුතුකම්, සේව්‍ය සේවක යුතුකම් හා ගුරු සිසු යුතුකම් ආදී යුතුකම් එකිනෙකා ඉටු කිරීම සබඳතා දියුණු වීමට මෙන්ම සුරක්ෂිත වීමට ද උපකාරී වේ. නිදසුනක් ගතහොත් සේව්‍ය සේවක යුතුකම්හි සේවකයා විසින් සේව්‍යයාට මෙසේ සංග්‍රහ කරයි.

01. ස්වාමියාට පළමුව පිබිදෙයි.

02. ස්වාමියාට පසුව නිදයි.

03. දුන් දේ පමණක් ගනියි.

04. ස්වාමියාගේ ගුණ වර්ණනා කරයි.

05. සෑම කටයුත්තකට දක්ෂ වීම

මෙලෙස යුතුකම් ඉටු කරන විට සමාජයේ යහපත්ව ජීවත් වීමට මෙන්ම බුදුරජාණන් වහන්සේ ගැටෙති.

එම කරුණු අවබෝධ කොටගෙන පිරිහීමේ දොරටු තුළින් ඈත්වී සමාජයේ සුසිරිත් තුළින් පෝෂණය වනු ඇත.

**ඉත්ථීධුත්තෝ සුරාධුත්තෝ**
**අක්ඛධුත්තෝච යෝනරෝ**
**ලද්ධං ලද්ධං විනාසේති**
**තං පරාභවතෝ මුඛං**

යමකු සුරාවට සූදුවට යොමු වුවහොත් නිසැක වශයෙන් පිරිහීමට පත්වන බව මෙමඟින් අවධාරණය කරයි. එසේම බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද මහා මංගල සූත්‍රය ද බෞද්ධයන් වන අපගේ දිවිය බොදු පිළිවෙතින් සැරසීමට උපකාර වන සූත්‍ර දේශනාවකි. 'මාතා පිතූ උපට්ඨානං ඒතං මංගල මුත්තමං' යනුවෙන් මංගල සූත්‍රය දෙමාපියන්ට සැලකීම මංගල කරුණක් ලෙස අවධාරණය කරයි. එසේම දන්දීම, ඉවසීම, කළගුණ සැලකීම... ආදිය ද උතුම් මංගල කරුණු වේ. මෙමඟින් ද අප දිවිය සාරදම්, ගුණදම් තුළින් සුපෝෂණය වන්නේ හිරු කුමරුගේ සම්ප්‍රාප්තියක් සමඟ ලොව එළිය වන්නාක් මෙනි.

කරණීය මෙත්ත සූත්‍රය මඟින් ද මාහැඟි සදුපදේශ රැසක් ධ්වනිත කරයි. ලද දෙයින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය වීම, අඩු බලාපොරොත්තු ඇත්තකු වීම... ආදී පිළිවෙත්

රැසක් එමඟින් අප දිවියට ඇඳාගත හැක. එමෙන්ම සතර බ්‍රහ්ම විහරණ ද උතුම් බොදු පිළිවෙතකි. එමඟින් වංචාව, හිංසාව, ඊර්ෂ්‍යාව දුරුවී මෛත්‍රිය, කාරුණික බව, අන් සැපතට ඊර්ෂ්‍යා නොකිරීම, මැදහත් බව ආදී ගුණාංග සමාජයේ මුල්බැස ගෙන ඇත. එවිට අසරණයන්ට පිහිටවන, වැඩිහිටියන්ට ගරු කරන, උපකාර කරන පද්මෝදාරයේ එක්පෙතියකට හෝ හිමිකම් කීමට දොරටු විවර වේ.

මහා සයුරට දියවර සපයන්නා වූ දිය අගලය බඳු වූ බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද වේළුද්වාර සූත්‍රයෙහි සඳහන් අත්තූපනායික ධර්ම පර්යාය යහපත් වූ බොදු පිළිවෙතකි. තමා අකමැති දුක් වේදනා අන් අයට විඳීමට සැලසීමෙන් වැළකීම මෙමඟින් සිදුවේ. නිදසුනක් ගතහොත් අප සතු දෙයක් තවකෙකු සොරකම් කිරීමට අප අකමැතිය. එසේම අන් අය ද එසේමය. මේ බව වටහා ගත් පුද්ගලයා සොරකමින් වළකියි. අන් අය ද ඉන් වළකාලයි. සොරකමින් වැළකීමේ ආනිසංස කියාදෙයි. එවිට සමාජයේ දුශ්චරිත වියැකී යන්නේ සූර්යාලෝකය හමුවේ කණාමැදිරි ආලෝකය වියැකෙන්නා සේය. මෙබඳු බොදු පිළිවෙත් තුළින් සමාජය වඩාත් සදාචාර සම්පන්න වේ. එය මහත් වූ සමාජ සේවාවක් සේ අගය කළ හැකිය.

හංසයා දියෙන් කිරි බිඳු වෙන්කර ගන්නේ යම්සේ ද, අප ද අධර්මය රජයන සමාජය තුළ ධර්මය වෙන්කර ගෙන කටයුතු කළ යුතුයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ව්‍යග්ඝපජ්ජ සූත්‍රය මිනිසාගේ මෙලොව හිතසුව පිණිස කරුණු සතරක් ද, පරලොව හිතසුව පිණිස කරුණු සතරක් ද දේශනා කරන ලදී. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා යනු මෙලොව දියුණුව ඇති කරන සම්පත්ති සතරයි. මෙමඟින් අපගේ දිවිය සඳහම් දියෙන් නහවාලීමට දොරගුළු විවර වේ. එසේම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද පරාභව සූත්‍රයේ ගාථා දොළසකින් පුද්ගලයා පිරිහීමට පත්වන ආකාරය මැනවින් විග්‍රහ කොට ආදී වටිනා සාරධර්ම නැමති ආභරණය පැලඳ ගැනීමට අප හට මංපෙත් විවර වනු ඇත. එසේම සතර සංග්‍රහ වස්තු ද උතුම් බොදු පිළිවෙතක් සේ අගය කළ හැකිය. දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව යනු එකී සිව් සතරාවතයි. මෙවන් පිළිවෙත් අප දිවියට එක්කර ගැනීම තුළින් පරිත්‍යාගය, පරෝපකාරය, යහපත් වචනය, අන් සැපතට උපකාර කරන, සියලු දෙනා හටම සමාන ලෙස සලකන පුද්ගලයන් සමාජයේ බිහිවනු ඇත. මෙකී බොදු පිළිවෙත් තුළින් සිදුවන සමාජ සේවාව මිල කළ නොහැකි රන් ආභරණයකි.

සත් දිනක් බඩගින්නේ සිටිමින් කුසපොත්ත ඇඟටම ඇළලී ගිය අයකුට ඇල්දියෙන් පොඟවා ගිලින්නට බත් පතක් ලැබුණ ද ඔහුට එයට ගත සිත යන දිව බොජුනක් සේ රස දැනෙන්නේ යම් සේ ද බෞද්ධයන් වන අප හට එක බුදු වදනක් වුව දම් අමා වැස්සක් වනු ඇත. විලිබිය හෙවත් ලැජ්ජා - භය ලෝක පාලක ධර්මයන්ය. ලොව සදාචාරය ඇතිවන සේ පාලනය වන්නේ එමඟිනි. මේ ආකාරයට අපද පවට ලැජ්ජාව හා බිය ඇතිකර ගැනීම තුළින් සමාජය වඩාත් සදාචාර සම්පන්න වේ. එසේම මෙකී පිළිවෙතින් ද ඉමහත් සමාජ සේවාවක් ඉටුවනු ඇත.

සතර අගතියෙන් තොර වීම ද උතුම් බොදු පිළිවෙතකි. ඡන්දය, ද්වේශය, මුළාව, නිය සමාජයෙන් වියැකී ගොස් යහපත් ගුණදම් තුළින් සමාජය සුපෝෂණය වන බව විහරණයකි. එසේම වසල සූත්‍රයේ සඳහන් වසල ධර්ම තුළින් ඉවත් වීම ද උතුම් බොදු පිළිවෙතකි.

නිදසුනක් ගතහොත් ණය හිමියෙකු ණය ගැතියාගෙන් ණය මුදල ඉල්ලා සිටි විට මා ඔබෙන් ණය නොගත්තේ යැයි වංචනිකව ක්‍රියා කිරීම වසල ධර්මයකි. එසේම ආගන්තුකයන්ට තම නිවසට පැමිණි විට සංග්‍රහ නොකිරීම ද වසල ධර්මයකි. 'අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ'. ආගන්තුකයන්ට වංචනික ලෙස වසල සූත්‍රය ඔවදන් සපයයි. එමඟින් සමාජයට සිදුවන යහපත ඉමහත්ය.

පොසොන් පෝදා පෑයූ පොසොන් සඳ කිරණින් ලක්දිවම නැහැවී ගියේ මන්ද යත් මහින්දාගමනයත් සමඟය. එමඟින් අපට වටිනා

සංස්කෘතියක් මෙන්ම සාරධර්ම රැසක්ම උරුම විය. පරිත්‍යාගය, පරෝපකාරය, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට ගරු කිරීම ආදී සාරධර්ම ඒ අතර වේ. එසේම දුමින්දාගමනය වූ කලි අවබෝධයෙන් සිරිත් විරිත්වලට බෞද්ධයා යොමු කරන ලද වටිනා සිදුවීමකි. මෙමඟින් ආදර්ශ ලබාගන්නා බෞද්ධයා මඟින් සමාජයට සිදුවන්නේ අමිල මෙහෙයකි. එසේම බෞද්ධයාගේ අත්පොත වන ධම්මපදය ආදර්ශයට ගෙන කටයුතු කිරීම තුළින් මහත් සමාජ සේවාවක් ඉටුවේ.

සුකරානි අසාධූනී<br>
අත්තනෝ අහිතානිච<br>
යං වේ හිතංච සාධුංච<br>
තං වේ පරම දුක්චරං

මෙමඟින් ඔවදන් ලබාදෙන්නේ තමාට අයහපතක් වන නරක දේ කිරීම ඉතා පහසුය. තමාට වැඩදායක වනදේ කිරීම ඉතා අපහසුය. නමුත් කෙතරම් අපහසු වුවත් යහපත් දේ කිරීමට අප නිරන්තරයෙන්ම යොමුවිය යුතුය. මෙසේ බලන කල ධම්මපදය තුළින් ද අගනා මෙහෙයක් ඉටුවන බව ගම්‍ය වේ. එසේම බෞද්ධයා ධනය ඉපයීම කළ යුත්තේ මල නොතලා රොන් ගන්නා බඹරුන් මෙනි. ධාර්මිකව ධනය ඉපයිය යුතු අතර, අරපිරිමැස්මෙන් ධනය පරිහරණය කිරීම ද උතුම් බොදු පිළිවෙතක් සේ අගය කළ හැකිය. මෙසේ බලන කල බොදු පිළිවෙත් තුළින් ඉමහත් සමාජ සේවයක් ඉටුවනු ඇත.

ඉහත සඳහන් කරන ලද සියලු කරුණු ඔස්සේ ලබාදෙන අධ්‍යාත්මීය, සමාජීය, සංස්කෘතික ගුණ වගාව ඔස්සේ කෙනෙකුගේ කඳුළකට තවත් ඇසක් තෙත්වන හෘදයාංගම බව සමාජයේ ස්ථාපිත වන්නේ කවදාද? එදා සිට තම කුසින් උපන් පුතකුගෙන් 'මැනලද පුතේ කිරි දුන්නේ මා නුඹට' යන වදන කිසිඳු මවකට අසන්නට තරම් සෝචනීය තත්ත්වයක් සමාජයේ ස්ථාපිත නොවනු ඇත. එසේම 'ඇසින් ගිලිහෙන කඳුළකින් වුව කැපිය නම් කැටයමක් අපේ මිනිසුන් කරනු ඇත එය මුදල් ගැන වූ සිහිනයක්' මෙවන් ආකල්ප සමාජයෙන් වියැකී යනු නොඅරහසකි.

'රූපං ජීරති මච්චානං<br>
නාම ගොත්තන් නජීරති'

එම්.කේ.ඒ. නෙත්මි චමෝද්‍යා

බෞද්ධ සම්මේලන ශත වර්ෂ පූර්ණ දහම් පාසල් ශිෂ්‍ය රචනා තරගයට ඉදිරිපත් කළ රචනාවකි.


## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ නව නිලධාරී මණ්ඩලය පත්වීමෙන් පසු පැවැත්වූ ප්‍රථම උපදේශක මණ්ඩල රැස්වීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ නව නිලධාරී මණ්ඩලය පත්වීමෙන් පසු උපදේශක මණ්ඩලයේ රැස්වීමක් පසුගියදා සම්මේලන මූලස්ථානයේදී ශ්‍යාමෝපාලී මහනිකායේ අස්ගිරි පාර්ශවයේ අනුනායක බුද්ධශ්‍රාවක භික්ෂු කතිකාචාර්ය අධ්‍යාපනපති පූජ්‍ය ආනමඩුවේ ධම්මදස්සාභිධාන අනුනායක ස්වාමීන් වහන්සේගේ මූලාසනයෙන් පැවිදි, ගිහි උපදේශක සභා සාමාජිකයින්ගේ හා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩලයේ මූලිකත්වයෙන් සම්මේලන මූලස්ථානයේදී පැවැත්විය.










## කාමනීය ජාතකය



'ලාභයෙන් පිරිහුණා යැයි සිතා හටගත් ශෝකය නිසා උපන් ව්‍යාධිය' තව ද මුළු ලොවට රසායන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් කාමනීය නම් බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බෑණා වන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එපා යැයි කියා අතහැර දැමූ රාජ්‍ය නැවත ඇවිත් අරගෙන ලෝභ, ද්වේෂ, මෝහ ඇතිව රාජ්‍යය කරන්නාහ. ලෝභයෙන් රාජ්‍ය කරන නිසා ශක්‍ර දේවේන්ද්‍රයෝ දැන මම ගොසින් මේ රජ්ජුරුවන් රවටා දමා එන්නේ නම් යහපතැයි සිතා බ්‍රාහ්මණ වේශයෙන් අවුත් කියන්නා "දේවයන් වහන්ස බොහෝ ඇත්, අස්, රථ, පාබළ සෙනඟින් සමෘද්ධ වූ මුතු මැණික් සංඛ සිලා ප්‍රවාලා" අනන්ත රත්නයෙන් සමෘද්ධ වූ මද සේනාවකින් ජයගත හැක්කා වූ උත්තර පංචාල නුවරය, ඉඳිපත් නුවරය, කේක නම් රාජධානිය යන තුන් රටක් දැක නුඹ වහන්සේට කියන්න සිතා පැමිණියෙමි. එසේ හෙයින් ප්‍රමාද නොකොට හෙට උදෑසනක් සේ චතුරංගනී සේනා සමෘද්ධ කොට නික්මෙන්නට උවමැනැයි" කීහ.

රජ්ජුරුවෝ ඒ අසා සතුටුව උදෑසනක් සේ මා කරා එවයි කියා යැවූහ. ශක්‍ර දේවේන්ද්‍රයෝත් තමන්ගේ ශක්‍ර භවනට නැගී ගියාහ. රජ්ජුරුවෝත් පසු දවස් චතුරාංගනී සේනාව සන්නද්ධ කොටගෙන "ඊයේ අපට රාජ්‍ය තුනක් දෙන්නේ යැයි කියූ බ්‍රාහ්මණ මාණවකයා කොහිදැයි" කියා අමාත්‍යයන් අතින් විචාළහ. අමාත්‍යයෝ කියන්නාහු "අප විසින් උන්ට බත් බුලත් දෙන්ට සැලැස්වූයේ නැත ස්වාමීන් විසින් සලස්වා වදාළේ දැයි" විචාලහ රජ්ජුරුවෝ මා එසේ කළ දෙයක් නැත එසේ වුවත් එක් තැනක ඉඳීය. ගොසින් බලවැයි කීහ. යහපතැයි අමාත්‍යයෝ ඒ ඒ තැන බලා නුදුටුවාහ. එසේ වී නම් අප විසින් කිසිදු සංග්‍රහයක් නොකළ නිසා වෙනත් රටකට ගියා යැයි සිතා බොහෝ කනගාටුවට පැමිණ මා විසින් බොහෝ ලාභයෙන් පිරිහෙන ලදැයි කලකිරී ඒ නිසාම ළය හුණුව රක්තපිත්ත අතිසාරයට පැමිණියාහ. බොහෝ වෛද්‍යවරුන් විසින් පිළියම් කරන ලදුවත් සහනයක් නොදුටුවාහ. එපවත් ශක්‍රයෝ දැන මා එතැනට ගොසින් රජ් ජුරුවන්ගේ ශෝකයත් අරවාලා, ලෙඩත් සුව කොට, රජ්ජුරුවන්ගේ ලෝභී සිතත් අරවා එමියි සිතා බ්‍රාහ්මණ වේශයක් ඇරගෙන රජ්ජුරුවන්ගේ

මාලිගාව දොරකඩ සමීපයේ සිට වෙදකම් දන්නා වෙදෙක්මි, රජ්ජුරුවන්ගේ අතීසාරය සුව කරන්නට ආමියි කීහ. රජ්ජුරුවෝ එපවත් අසා මහා වෙදවරුන් පිළියම් කරන ලදුව සුව කොට ගත නුහුණු ව්‍යාධිය සුව කරන්ට මුන්ට පිළිවන්ද? යම් ලාභයක් කොට පියා යවාපියවැයි කීහ. එපවත් ශක්‍රයෝ අසා "මං ලාභයක් තකා ආවෙම් නොවෙමි. රජ්ජුරුවන්ගේ ලෙඩ සුව කරන පිණිස ආමී" කීහ. එබස් රජ්ජුරුවෝ අසා "එසේ වී නම් කැඳවයි" කියා තමන් ළඟට ගෙන්වා ගත්හ. ශක්‍රයෝත් රජ්ජුරුවන් ළඟට අවුත් රජ්ජුරුවන්ට කියන්නාහු "දේවයන් වහන්ස රක්තපිත්ත අතීසාරය ඇතිවන කළ හයින්, ශෝකයෙන් හා ආදී වූ දෙයින් ඇතිවන්නේය. නුඹ වහන්සේට ඇති වූයේ කවර කාරණයක් මුල්වද? ඒ කීවොත් නිදන් දැන පිළියම් කරන්නේ" යැයි කීහ. එබස් රජ්ජුරුවන් අසා "එක්තරා බ්‍රාහ්මණ මානවකයෙක් මා කරා එළඹ පංචාල රට හා ඉඳිපත් නුවර හා කීකය නම් රට හා යන රට තුනක් මට සාදා දෙමියි" කීහ. "මමත් ඔහුට කිසි සංග්‍රහයක් නොකළෙමි. ඒ තෙමේ ඒ නිසා කටයුත්තක් කීමට සංග්‍රහයක් නොකළ සේකැයි සිතා ඔබ්බේ රටකට ගියා වනැයි සිතා මා විසින් අපරික්ෂාකාරී වීමෙන් මේ නිසා ලාභයකින් පිරිහී ගියෙමියි සිතා උපන්නා වූ ශෝකය මුල් කොටගෙන මේ ව්‍යාධිය ඇතිවී යැයි" කීහ. එබස් ශක්‍රයෝ අසා "රජජුරුවෙනි, බරණැස් නුවරට හා ප්‍රාර්ථනා කරන්නා වූ නුවර තුන ඇතුළුව රාජ්‍ය සතරකට තොපි රාජ්‍ය කරවා නමුත් සතර නුවරින් පිළිසතරක් අඳුද? සතර නුවරක රාජ්‍ය කෙරෙම් සිතා මණ්ඩා සතරකින් බත් කවුද? යාන් සතරක සැතපෙව්ද? වාහන සතරකට නැඟී යවුද? එසේ නොයන විසින් තමා කෙරේ පැමිණි රාජ්‍යයට  ලෝභ කිරීමෙන් පැමිණියා වූ ආයාස දුටු සේක් වේද? එසේ විසින් නුඹ වහන්සේගේ ව්‍යාධියට මා හැර දඹදිව අනික් වෛද්‍යවරයෙක් පිළියම් කළ නොහෙයි" කීහ. එවිට රජ්ජුරුවෝ "යහපතැයි වෛද්‍යාණෙනි, තොප විසින් දන්නා යම් උපායකින් මාගේ සෝක සංසිඳුවා ව්‍යාධිය සුව කරව"යි කීහ. එවිට ශක්‍රයෝ යහපතැයි කියා රජ් ජුරුවන්ට අවවාද කියන්නාහු "මහරජ්ජුරුවනි යම් සේ ලෝභ, ද්වේශ, මෝහාදී වූ දෙය නුවණැත්තන් විසින් ප්‍රසංසා කරනු නොලැබෙයි. ඉඳුරාම එයත් අකුසලයට භාජනව තිබෙයි කියා නරකාදී වූ දුකට පමුණුවා ලවැයි" කියා නරක දක්වා රජ්ජුරුවන් භය ගැන්වූහ. ඉක්බිති "රජ්ජුරුවෙනි, ඉනිබ්බේ තොප විසින් රාග, ද්වේෂ, මෝහාදී වූ පාපයන් දුරුකොට දසරාජ ධර්මයෙන් අකෝප්‍යව රාජ්‍ය කොට, ශක්‍ර සම්පත් අත්පත් කරව"යි කීහ. රජ්ජුරුවෝත් ශක්‍රයන්ගේ බස් අසා තමන් සිත ලෝභය අත්හැර දැමුවේය. ඒ මොහොතේම ව්‍යාධියත් සන්සිඳුනේය. ශක්‍රයෝත් තමන්ගේ දිව්‍ය භවනයටම ගියහ. රජ්ජුරුවෝත් දැහැමින් සෙමින් රාජ්‍යය කොට මිය පරලොව ගියාහයි වදාරා මේ 'කාමනීය ජාතකය' නිමවා වදාළ සේක.

**පූජ්‍ය මකුද්දල උපරතන ස්ථවිර**

---

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සාමාජික හා සාමාජික සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය**

**දිවයිනේ සියලුම බෞද්ධ සමිති සංවිධානයන්ට අප හා එක්වී බුද්ධ ශාසනයේ උන්නතියට ඔබේ දායකත්වය ලබාදෙන ලෙසට කරන ගෞරවණීය ආරාධනයයි.**

ලිපිනය:

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

රකථන අංක: 011 2691695/ 011 2667017/ 076 5611374
ෆැක්ස් 011 2688517 web www.acbc.lk
විද්‍යුත් ලිපිනය acbc380@gmail.com
buddhistinfo380@gmail.com

# ආයුර්වේදීය ස්වස්ථතාව සහ නිද්‍රා චර්යාව



**වෛද්‍ය කේ. ඉන්ද්‍රා චන්ද්‍රමාලි** – Ayurvedic Doctor & Counsellor DA, MA (Kelaniya)

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රෝග සුව කිරීම මෙන්ම රෝග ඇතිවීම වළක්වා පුද්ගලයාගේ ස්වස්ථ බව සංරක්ෂණය කිරීම පිණිස අදාළ සදාචාර සම්පන්න ආචාරධර්ම පද්ධතියක් ඇතුළත් ජීවන මාර්ගයක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව සෑම පුද්ගලයෙකුම තමාගේ පෞද්ගලික සෞඛ්‍ය රැකගැනීම සඳහා පිළිපැදිය යුතු උපදෙස් අතර යහපත් නින්දක් ලැබීම ද ඉතා වැදගත් කාරණාවකි. නින්ද පිළිබඳ කථා කිරීමේ දී අලුයම අවදි නොවීමත්, දහවල් කාලයේ නිදා ගැනීමත්, රාත්‍රී කාලයේ නිදිවැරීමත් සෞඛ්‍ය විරෝධී වේ.

ආයුර්වේදයට අනුව නිරෝගී පුද්ගලයාගේ දෛනික කටයුතු නිසි ලෙස ඉටුකර ගැනීම සඳහා අලුයම පිබිදීම (බ්‍රහ්ම මුහුර්තයෙන් හෙවත් උදෑසන 4.45 - 5.00 අතර කාලයෙහි අවදිවීම) උපකාරී වේ. දහවල් කාලයේ නිදා නොගැනීමත්, රාත්‍රියේ දී නිදාගැනීමේ අවශ්‍යතාව පැමිණි කල්හි නිදානොගෙන අපහසුවෙන් දරා නොසිටීමත් නීරෝගි බව ආරක්ෂා වීමට හේතු වේ.

## නින්ද යනු කුමක්ද?

පුද්ගලයාගේ කායික මානසික විවේකය සඳහා ප්‍රමාණවත් නින්දක් ලැබිය යුතුය. නිද්‍රාවේගධාරණය මෙන්ම අතිනිද්‍රාව (වැඩියෙන් නිදාගැනීම) සහ අනිද්‍රාව (නින්ද නොයෑම හෝ ඉතා සුළු වේලාවක් නින්ද යෑම) රෝගකාරක අවස්ථා වෙයි. එසේම සමහර රෝගවල රෝග ලක්ෂණ ලෙස ද නින්දේ විපර්යාස ඇතිවේ. මෙවැනි කාරණා ද මුල් කරගෙන ආයුර්වේදයෙහි නින්ද පිළිබඳ පැහැදිලිව දක්වා ඇත.

ආයුර්වේද මතයට අනුව තමෝගුණය (මනස් ගුණයකි) සහ සෙම් දෝෂය යන දෙක මනස තුළ වැඩිවීමෙන් මනස, අරමුණු හා ගැටෙන ඇස, කන ආදි ඉන්ද්‍රියයන් සම්බන්ධයෙන් තාවකාලිකව වෙන්වීම නින්ද නම් වේ. මේ දෙකෙහි ක්‍රියාව අවසන් වූ පසු නින්ද අවසන් වේ. එනම් පුද්ගලයා අවදි වෙයි.

## නින්දේ අවශ්‍යතාව

දිවා කාලයෙහි විවිධ කාර්යයන්හි නිරතවීමෙන් ලබන වෙහෙස දුරුකර කායික හා මානසික විවේකය ලබනු පිණිස රාත්‍රී කාලයෙහි පුද්ගලයාට සුවදායක නින්දක් අවශ්‍ය වේ. මුලදී සඳහන් කළ පරිදි නිද්‍රා වේගය වැළැක්වීමෙන් ශාරීරික ශක්තිය පිරිහී ගොස් පුද්ගලයාගේ ප්‍රසන්න බව නැති වෙනවා මෙන්ම, විවිධාකාර රෝගවලට ද ගොදුරුවනු ඇත. සාමාන්‍යයෙන් කුඩා ළදරුවෙකුට පැය 15 - 16 අතර කාලයක් ද, පාසල් වයසේ දරුවෙකුට පැය 8 - 10 අතර කාලයක් ද, වැඩිහිටියෙකුට පැය 7 - 8 අතර කාලයක් ද වශයෙන් ප්‍රමාණවත් නින්දක් ස්වස්ථ පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය වේ.

දහවල් නින්ද

දහවල් කාලයේ නිදා ගැනීම ද අහිතකර වේ. දිවා නිද්‍රාව නිසා සෙම කෝප වේ. එවිට සෙම් රෝග හට ගනියි. එමඟින් දියවැඩියාව, හිසරදය ආදී රෝග හට ගැනීමේ ඉඩකඩ වැඩිවේ.

සුවදායක නින්දකින් ලැබිය හැකි ප්‍රයෝජන මොනවා ද?

- සුවදායක නින්දකින් පසු සිරුර ශක්තිමත් වේ. එවිට අපගේ දෛනික කටයුතු ඉතා ප්‍රබෝධයෙන් කිරීමේ හැකියාව ලැබේ. ශරීරය පුෂ්ටිමත් වේ. අධික ලෙස කෘශ නොවේ.
- මොළයේ ක්‍රියාකාරීත්වය යහපත් වනු ඇත. එවිට මතක ශක්තිය වර්ධනය වේ.
- ආහාර රුචිය හා ආහාර දිරවීමේ ශක්තිය වර්ධනය වේ.
- මුහුණ ප්‍රසන්න වේ. ශරීරය සැහැල්ලු වේ. ශරීර වර්ණය ඇතිවේ.
- ආතතිය අඩු වේ. මානසික ප්‍රසන්න බව ඇතිවේ.
- රුධිර පීඩනය පාලනය වේ.
- ප්‍රතිශක්තිකරණය වර්ධනය වේ.
  නින්දේ වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු මොනවාද?
- රාත්‍රී ආහාරයට දිරවීමට අපහසු බර ආහාර වර්ග ගැනීම.
- වාත කෝපයට හේතු වන අති මෛථුන සේවනය, වැටීම් තැලීම් ආදිය, අධික ලෙස රක්තය පිටවීම ආදිය.
- පාරිසරික උෂ්ණත්වය ඉහළ යෑම.
- පඤ්චකර්ම විධි වැරදි ලෙස යෙදීම.
- නිදන කාමරයේ ප්‍රසන්න බව අඩුවීම.
- කායික මානසික ව්‍යායාමයෙන් තොරවීම.
- අධික භය, ශෝකය, ක්‍රෝධය ආදි දුශ්සිතිවිලි නිසා මානසිකව ඇතිවන වියවුල් බව.
- මහලු වයස
- අතිශයින් තියුණු ඖෂධ වර්ගවල ගන්ධය දීර්ඝකාලීනව ආඝ්‍රාණය කිරීම.
- අධික ලෙස දුම්පානය.
- අධික ලෙස ආහාර නොගෙන සිටීම.

## සුවදායක නින්දකට ප්‍රතිකාර

- පෝෂ්‍යදායි ආහාර ගැනීම.
- මීකිරි, කිරි, ගිතෙල්, සූකිරි, රටඉඳි වැනි ආහාර ගැනීම.
- නිසි ලෙස කායික ව්‍යායාම්වල යෙදීම.
- නින්දට පෙර මඳ උණුසුම් ජලයෙන් දෙපා සේදීම.
- නීල්‍යාදී තෙල, කේතකී තෙල වැනි තෙලක් වෛද්‍ය උපදෙස් මත හිස ගැල්වීම.
- මානසික විවේකය. ඒ සඳහා භාවනාව යෝග්‍ය වේ. විශේෂයෙන් මෛත්‍රී භාවනාව සුවදායක නින්දකට හේතු වෙයි. මෛත්‍රිය වඩන පුද්ගලයා සැපසේ නිදයි. සැපසේ අවදි වෙයි. යනුවෙන් මෙත්තානිසංස සූත්‍රයෙහි සඳහන් වේ.

ඒ අනුව යහපත් නින්ද පුද්ගලයාව රෝගවලින් ආරක්ෂා කරයි. එසේම කායික මානසික ශක්තිය වර්ධනය කර ක්‍රියාශීලී සුන්දර කෙනෙකු කිරීමට දිනකට ප්‍රමාණවත් නින්දක් අවශ්‍ය බව පැහැදිලි වේ.

# සෝවාන් සිතේ ශ්‍රද්ධාව



නාලක ජයසේන

සෝතාපන්න ඵලයට පත් වූ අයෙකු තුළ පිහිටන අංග හතරක් පිළිබඳව අපි පෙර ලිපිවල දී සාකච්ඡා කෙළෙමු. ඒවා නම්,

1. බුද්ධත්වය කෙරේ අචල ශ්‍රද්ධාව
2. ශ්‍රී සද්ධර්මය කෙරේ අචල ශ්‍රද්ධාව
3. සංඝ රත්නය කෙරේ අචල ශ්‍රද්ධාව
4. ආර්යකාන්ත ශීලය

එනමුත්, සූත්‍ර දේශනා තවදුරටත් අධ්‍යයනයේ දී මෙම අංග විස්තාරණය කොට අංග හතළිහක් වශයෙන් දක්වා ඇත. ඒ මෙසේය,

1. බුදුගුණ නවය කෙරේ ඇතිවන අචල ශ්‍රද්ධාව
2. දහම් ගුණ හය කෙරේ ඇතිවන අචල ශ්‍රද්ධාව
3. සඟ ගුණ කෙරේ ඇතිවන අචල ශ්‍රද්ධාව
4. පංච ශීලය
5. පටිච්ච සමුප්පාදය කෙරේ අචල ශ්‍රද්ධාව/අවබෝධය

එසේම සෝවාන් ඵලයට පත් වූ සිතෙහි සසරට අප බැඳ තබන සංයෝජන හෙවත් බැමි/රැහැන් තුනක් නොමැති බව ද අපි දනිමු. ඒවා නම්,

1. සක්කාය දිට්ඨිය - මමය යන හැඟීමට ඇති බැඳීම
2. විචිකිච්ඡා - සසර හා දහම කෙරේ සැකය
3. සීලව්‍රත පරාමාස - මිථ්‍යාදෘෂ්ටික සීලය

මේ අනුව සෝවාන් ඵලපත් ආර්යයෙකුගේ සිතේ ඇති ගුණ දහම්වල ශ්‍රද්ධාව ඇති ස්ථානය පැහැදිලි වෙයි. තව ද කෙනෙකු සෝවාන් මාර්ගය වඩයි ද ඔහු තුළ ශ්‍රද්ධාව බලවත් වුවහොත් සද්ධානුසාරී වන බවත් ප්‍රඥාව බලවත් වුවහොත් ධම්මානුසාරී වන බවත් දහමේ දැක්වෙයි. මෙම ලිපියෙන් තවදුරටත් සාකච්ඡා කරනුයේ, සෝවාන් සිත තුළ ඇති බුදුගුණ ප්‍රසාදය පිළිබඳය.

සාමාන්‍ය සිතක හා සෝවාන් සිතක ඇති බුදු ගුණ පැහැදීමේ සංසන්දනාත්මක වෙනස්කමක් ඇත. සාමාන්‍ය සිතක් හෙවත් අශ්‍රැතවත් පෘථග්ජන සිතක් හෙවත් මගපල පිණිස අවදි නොවූ සිතක් ගත් කල එහි ඇතිවන ශ්‍රද්ධාව ඕනෑම මොහොතක වෙනස් විය හැකිය. අඩු විය හැකිය. තවත් විටෙක වැඩි විය හැකිය. ඇතැම් විට නැති විය හැකිය.

නැවත ඇති විය හැකිය. බාහිර කරුණු මත වෙනස් විය හැකිය. එය සුළඟට හසු වූ පුළුන් රොදක් මෙනි. උතුරු දෙසින් දකුණු දෙසට සුළං හමන විට පුළුන් රොද උතුරේ සිට දකුණට පාව යයි. වෙනත් දිශාවකට ද සුළං හමන්නේ නම් එයම සිදුවෙයි. එහෙත් පොළොවේ ශක්තිමත්ව සිට වූ ඉන්ද්‍රඛීලයක් සලකා බලන්න. කවර දෙසකින් සුළඟක් නොව, සුළි සුළඟක් හැමුව ද එය නොසෙල්වෙයි. සෝවාන් සිතේ ශ්‍රද්ධාව ද එසේය.


ශ්‍රද්ධාව ඉන්ද්‍රියයක්, බල ධර්මයක් යනාදී ලෙස විවිධාකාරයෙන් බුදු හිමි දේශනා කර ඇත. ඒ සෑම තැනකම එය යෙදෙන්නේ මුලින්ය. නිදසුන් ලෙස ශ්‍රද්ධා, වීර්ය, සති... යනාදී ලෙසයි. ඒ අනුව පැහැදිලි වන්නේ පැහැදීම යන්න සියලු ධර්මානුධර්ම කෙරෙන් මූලික වන බවයි. මෙහිදී විශේෂත්වය වන්නේ සෝවාන් ශ්‍රාවකයා තුළ බුදු ගුණය කෙරෙහි ශ්‍රද්ධාව ඇති වීම පමණක් නොව, එම ශ්‍රද්ධාව ඇති වූ බුදු ගුණ ද එම ශ්‍රාවකයාගේ ජීවිතය තුළ පිහිටීමයි.

එය සිදු වන්නේ මෙසේය. සුගත බුදු ගුණය ඇසුරෙන් එය මෙසේ පැහැදිලි කළ හැකිය. සුගත යනු බුදු හිමි සුන්දර නිවනට වැඩම වූ බැවිනි. සුන්දර වූ සිතක්, කයක්, වචනයක් සහිත වූ බැවිනි. සුන්දරත්වය යනු මෙහි නිකෙලෙස් වීමයි. එම සුගත ගුණය තමා තුළ වැඩීම යනු එම ශ්‍රාවකයාගේ හදවත තුළ නිකෙලෙස් ගුණය නැගී ඒමයි. බුදුගුණ වඩන සිතකට වැරදි කළ නොහැකිය. මක්නිසාද යත් එම ගුණ අවංකවම හෘද සාක්ෂ්‍යය තුළ වැඩෙන විට ශ්‍රාවක සිත තුළ කය තුළ හා වචනය තුළ එය ස්ථාපනය වීමයි.

සෝවාන් පලය යනාදී මාර්ගඵල යනු ධ්‍යාන මෙන් පිරිහෙන්නාක් නොවෙයි. එබැවින් යම් මාර්ගඵල ලාභියෙකුගේ සිතේ ඇතිවන ගුණ අවසන් වන්නේ නිර්වාණයෙනි. ශ්‍රද්ධාවන්ත මනස තුළ බුදු ගුණය හෝ වෙනයම් ගුණයක් වැඩේ නම් එය ද නිවන අරමුණු කරගෙනය. එබැවින් අප ද අපගේ සිත තුළ බුදු ගුණ මනසිකාරය කරමින් එම ගුණය ජීවිතයට ගැළපීමට පුරුදු පුහුණු විය යුතුය.

> සාමාන්‍ය සිතක් හෙවත් අශ්‍රුතවත් පෘථග්ජන සිතක් හෙවත් මගපල පිණිස අවදි නොවූ සිතක් ගත් කල එහි ඇතිවන ශ්‍රද්ධාව ඕනෑම මොහොතක වෙනස් විය හැකිය. අඩු විය හැකිය. තවත් විටෙක වැඩි විය හැකිය. ඇතැම් විට නැති විය හැකිය.
> නැවත ඇති විය හැකිය. බාහිර කරුණු මත වෙනස් විය හැකිය. එය සුළඟට හසු වූ පුළුන් රොදක් මෙනි. උතුරු දෙසින් දකුණු දෙසට සුළං හමන විට පුළුන් රොද උතුරේ සිට දකුණට පාව යයි. වෙනත් දිශාවකට ද සුළං හමන්නේ නම් එයම සිදුවෙයි. එහෙත් පොළොවේ ශක්තිමත්ව සිට වූ ඉන්ද්‍රඛීලයක් සලකා බලන්න. කවර දෙසකින් සුළඟක් නොව, සුළි සුළඟක් හැමුව ද එය නොසෙල්වෙයි.

සම්බුදු හිමි අනුත්තරෝ වන්නේ තුන් ලොවටම උත්තර වූ බැවිනි. අපි උන්වහන්සේට අනුත්තරෝ යැයි කියා වඳිමු; පුදමු. සාම්ප්‍රදායිකව අනුත්තරෝ බුදු ගුණයෙන් අපල දුරු වේවායි වන්දනා කරමු. එහෙත්, ඒවා ආමිස පූජාය. ප්‍රතිපත්ති පූජාව යනු එම ගුණයෙන් මතුවන පිළිවෙත් තමා තුළ වගා කර ගැනීමයි. තුන්ලොවටම බුදු හිමි උත්තරීතර වූයේ සම්බුද්ධත්වයෙන් ශාස්තෲ වීමෙනි. එසේම කාම රූප අරූප යන භව තුනෙන් එතෙර වූ බැවින් ද දෙව් බඹ මිනිස් ලෝවලින් යා හැකි, යා යුතු උපරිම තැනට ගිය බැවින් ද අනුත්තරෝ වන්නේය. එම අනුත්තර ගුණය තමා තුළ වඩා ගැනීම යනු සමථ විපස්සනා වඩමින් නිවන් මග පූරණයයි. ශ්‍රද්ධාවෙන් ඇරඹෙන එම නිර්වාණ මාර්ගය වීර්යයෙන් වැඩෙනාකාරය ඉදිරි ලිපිවල දී සාකච්ඡා කරමු.



# මුනි සිරිපා සිරිත

අප භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් මහ රහතුන් වහන්සේ සමග බුද්ධත්වයෙන් අටවැනි වර්ෂයේ දී මෙරටට වැඩම කොට සුමන සමන් දිව්‍ය රාජයාණන්ගේ ඇරයුමින් සමන්තකූට මස්තකයෙහි උන්වහන්සේගේ වම් සිරිපතුල් ලකුණ පිහිටුවීමෙන් පූජනීයත්වයට පත් සමන්ගිර මෙරට බෞද්ධ සිද්ධස්ථාන අතුරින් ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙයි. ශ්‍රී ලංකාවේ පමණක් නොව, ලෝකවාසී බෞද්ධ ජනතාවගෙන් ද වන්දනාමානයට පාත්‍රවන එම පුණ්‍ය භූමිය සුරකිනු ලබන්නේ සෝවාන්ඵලලාභී ආර්යශ්‍රාවක සුමන සමන් දිව්‍යරාජෝත්තමයාණන් වහන්සේ විසිනි.

මෑත ඉතිහාසයේ බෝධිසත්වගුණෝපේත අතිගෞරවාර්හ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් සිදුකළ අත්‍යුධාර සේවාවේ එක් ප්‍රතිඵලයක් ලෙස කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් කුට්ටාපිටිය ගම්වරය ඇතුළු ශ්‍රීපාදස්ථානය උන්වහන්සේ වෙත පූජා කරනු ලැබූ අතර, සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් එම පදවිය තම ප්‍රිය ශිෂ්‍යපුත්‍ර වූ අතිගෞරවාර්හ වේහැල්ලේ ධම්මදින්න පහතරට නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පවරන ලදී. වේහැල්ලේ නාහිමියන් උපසම්පදාව ලැබීමට ද ප්‍රථමයෙන් ගණින්නාන්සේ කෙනෙකු ලෙස සිටි අවධියේ දී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් කතරගම කිරි වෙහෙර උන්වහන්සේ වෙත සන්නස් ලියා පුදකළ අතර, තිස්සමහාරාමය රාජමහා විහාරය, වේහැල්ලේ වේළුවනාරාමය, කසාගල රාජ මහා විහාරය ආදී විහාර ගණනාවක ආධිපත්‍යය උන්වහන්සේ විසින් හොබවා ඇත. ඒ අනුව අද දක්වාත් ශ්‍රීපාදස්ථානය ආරක්ෂා කිරීමේ වගකීම උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වන වේහැල්ල මහ සඟ පරපුරේ මහාසංඝරත්තනයට පැවරී ඇත. ඒ අනුව එදා සිට අද දක්වා



දෙවිහාමුදුරුවන් වැඩමවීමේ පෙරහැර
සිරිපා මළුවට ගමන් කළ මොහොත



දෙවි හාමුදුරුවන් වැඩම වීමේ පෙරහැර

ශ්‍රීපාදස්ථානාධිපති නාහිමිවරු දහහත් නමක් මෙම භාරධූර කර්තව්‍ය ඉටුකොට තිබෙන අතර, අතිගෞරවාර්හ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද එහි අධිපතීන් වහන්සේ නමක් ලෙස කටයුතු කරන ලදී. දොළොස්වැනි අධිපතීන් වහන්සේ වූ උන්වහන්සේ එම තනතුරට පත් වූයේ ද වේහැල්ලේ සඟ පරම්පරාව සමඟ ඇති සහසම්බන්ධය නිසාය. වර්තමානයේ දහඅට වැනි ශ්‍රීපාදස්ථාධිපති නායක ස්වාමීන්ද්‍රයන් ලෙස කටයුතු කරනු ලබන්නේ සබරගමු රත්නපුර මහා දිසාවේ ප්‍රධාන සංඝනායක අතිගෞරවාර්හ බෙංග මුවේ ධම්මදින්න නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වන අතර, උන්වහන්සේ විසින් ශ්‍රීපාදස්ථානයේ උරුමය සුරක්ෂිත වන අයුරින් ගෞරවාන්විතව එම කටයුතු ඉටුකරනු දක්නට ලැබීම අප ලද මහත් භාග්‍යයකි.

පුරාණ චාරිත්‍රානුකූලව සිරිපා සමය උඳුවප් මස පුර පසළොස්වකින් ආරම්භව වෙසක් මස පුර පසළොස්වක් පොහොයෙන් අවසන් වන අතර, එම කාලය අතරතුර පමණක් සිරිපා කරුණා කිරීම පැරැණ්නන්ගේ සිරිත විය. එම කාලය 'වාරය' ලෙසත්, අනෙක් කාලය 'අවාරය' ලෙසත් හැඳින්වේ. පැරැණ්නන් විසින් එසේ වසරේ සය මසක් පමණක් වන්දනාව සඳහා යොදාගන්නට ඇත්තේ එකල භෞතික පහසුකම් අතිශය දුබල වූ නිසා පාරිසරික වශයෙන් යම් පමණකට හෝ පහසුවෙන් ගමන් කළ හැකි කාලය එය බැවිනි. මැයි මස සිට දෙසැම්බර් දක්වා සිරිපා අඩවියට අධිකව වර්ෂාව හා සුළං ලැබෙන කාලය බැවින් වර්තමානයේ පවා අවාරයේ එහි ගමන් කිරීම පහසු නැත. අනෙක් අතට සිරිපා කඳු වැටිය යනු ජෛව විවිධත්වය අතින් සංවේදී ප්‍රදේශයකි. වසර පුරාම එහි දහස් ගණනක් සංචාරකයන් හා වන්දනාකරුවන් ගමන් කළහොත් එය ස්වාභාවික පරිසරයේ පැවැත්මට ද තර්ජනයකි. එබැවින් අවාරය යනු සිරිපා අඩවියේ ගස කොළ සතා සිව්පාවුන් නිදහසේ ගත කරන කාල පරිච්ඡේදයකි. ජනප්‍රවාදයන්ට අනුව අවාරය වෙන් කොට ඇත්තේ දෙවියන්ට සිරිපා පද්මය වන්දනාමාන කිරීම උදෙසාය.

එම නිසා වන්දනා සමය කාලය තුළ දී පමණක් උඩමළුවේ සධාතුක කරඬු වහන්සේත්, සමන් දේව ප්‍රතිමාව ඇතුළු දේවාභරණත් තැන්පත් කරන අතර, වසරේ ඉතිරි කාලයේ දී පැල්මඩුල්ලේ ගල්පොත්තාවල රජමහා විහාරස්ථානයේ එම පූජනීය වස්තූන් ආරක්ෂිතව තැන්පත් කොට වතාවත් සිදුකරනු ලැබේ. ශ්‍රීපාද පන්සල නැතහොත් පැල්මඩුල්ල කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරය ලෙස ද මෙම විහාරස්ථානය හඳුන්වනු ලබයි.

ඒ අනුව ශ්‍රීපාද වන්දනා සමය ලංවෙත්ම ශ්‍රී පාදස්ථානාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ

ප්‍රධානත්වයෙන් සිරිපා වන්දනා සමය ඇරඹීම පිණිස මූලික සැලසුම් සකස් කරන අතර, ඒ සඳහා මහා සංඝරත්නය, රාජ්‍ය නිලධාරීන්, ආරක්ෂක අංශ, රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිලමේතුමන් ඇතුළු දායකකාරකාදීන්ගේ සහයෝගය නිබඳව හිමි වේ. එයින් පසු සංවිධානය කරගත් පරිදි උඳුවප් පුර පසළොස්වක පුන් පොහොය ලැබීම දෙදිනකට පෙර ශ්‍රීපාදස්ථානාධිපති නාහිමි, ශ්‍රීපාද භාරකාර හිමි, ශ්‍රීපාද විහාරයේ තේවා භාර නාහිමි, ශ්‍රීපාදස්ථානයේ කළමනාකරු ප්‍රධාන කාර්යමණ්ඩලය ප්‍රධාන ගිහි පැවිදි දෙපාර්ශ්වය ම ගල්පොත්තාවල විහාරයට රැස්ව, තෙරුවන් නැමඳ සමන් දේව ප්‍රතිමාව තැන්පත් කොට ඇති දේව මන්දිරය වෙත සැපත් වෙති.

එයින් පසු මුල් පියවර වන්නේ ගල්පොත්තාවල විහාරයේ වෙසක් මස සිට උඳුවප් පුර පොහොය දක්වා ගත වූ කාලය තුළ සුරක්ෂිතව තැන්පත් කොට ඇති සමන් දෙවි රුව සහිත ආභරණ, වන්දනා සමය ඇරැඹීම සඳහා ශ්‍රීපාදස්ථානයට වැඩම කරවනු ලැබීමයි. මේ සිදුවීම හඳුන්වනු ලබන්නේ 'දෙවි හාමුදුරුවන් වැඩමවීම' යනුවෙනි.

අති උත්කර්ෂවත් ලෙස පවත්වනු ලබන මෙම අවස්ථාවේ තේවා පදය මුල්කරගෙන බෙර, දවුල්, තම්මැට්ටම්, හොරණෑව, තාලම්පට යන පංචතූර්ය භාණ්ඩයන් වාදනය හා සංඛ නාද මධ්‍යයේ සුබ මොහොතින් දේව මන්දිරයේ දොරටුව විවෘත කරනු ලබයි. ඉන්පසු දේව ප්‍රතිමාව ප්‍රධාන දේවාභරණ විශේෂයෙන් පිළියෙල කළ ආසනයක් මතට වැඩම කරනු ලැබීමෙන් අනතුරුව මහා සංඝරත්නය රැස්ව සිටින පිරිස් පන්සිල්හි පිහිටුවා සෙත් පිරිත් දේශනා කර සමන් දෙවිඳුන්ට පින් අනුමෝදනා කරති.

ශ්‍රීපාදස්ථානයේ කපු මහතා විසින් විශේෂ පූජාවක් හා යාතිකාවක් කරනු ලබන අතර, දේව ප්‍රතිමාව හා ආභරණ පෙරහැර රථය වෙත වැඩම කරවනු ලබන්නේ ද සුබ මොහොතකට අනුවය. එයින් පසුව සධාතුක කරඬු වහන්සේ සහ කොත් වහන්සේ ද සමන් දෙවිඳුන්ගේ වාහනය වන රිදියෙන් කළ ඇත් රුවක් ද ඇතුළු දේවාභරණ සහිත පූජා



**සිරිපා පද්මය සුවඳපැනින් දෝවනය කිරීම**

වස්තු රැසක් ද දෙවියන් වැඩම කරවන පෙරහැරට සම්බන්ධ කරනු ලැබේ. මෙසේ වැඩමවනු ලබන සමන් දේව ප්‍රතිමා අතර ඓතිහාසික වටිනාකමකින් යුතු ප්‍රතිමා ද්විත්වයක් වන අතර, ඉන් එක් ප්‍රතිමාවක් සඳුන් දැවයෙන් ද, අනෙක් ප්‍රතිමාව රිදියෙන් ද තනවා ඇත. ඓතිහාසික සාධකවලට අනුව එම සඳුන් අරටුවෙන් කළ සමන් දෙවි රුව දේවපතිරාජ අමාත්‍යවරයා විසින් දෙවන පරාක්‍රමබාහු මහ රජුගේ අනුශාසනාවෙන් කරවා ශ්‍රීපාදස්ථානයට පූජා කළ බව පැවසේ.

සිංහල රාජ්‍ය පාලනය නිම වී බ්‍රිතාන්‍ය පාලනයට නතුවීමෙන් පසුවද බොහෝ කාලයක් සමන් දේව ප්‍රතිමාව ඇතුළු දේවාභරණ වැඩම කරවන පෙරහැර ගමන් කර ඇත්තේ පලාබද්දල පැරැණි රජ මාවත ඔස්සේ පමණක් වුවත්, පසු කාලය වන විට එය වෙනස් වී හැටන් මාර්ගය ඔස්සේ ගමන් කොට තිබේ. වර්තමාන ශ්‍රීපාදස්ථානාධිපති නාහිමියන් වර්ෂ 2011 දී පත් වීමෙන් අනතුරුව දෙවියන් වැඩම කරවන පෙරහැර පෙර නොවූ විරූ

අයුරින් ගෞරවාන්විතව මෙන්ම සබරගමු දිසාව ම උත්සවශ්‍රීයෙන් ඇලළෙන අන්දමින් සංවිධානය කිරීම පිළිබඳ උන්වහන්සේ වෙත අප සැම විසින් කෘතඥතාපූර්වක විය යුතුය. ඒ අනුව අද වන විට පලාබද්දල මාවත, හැටන් මාවත සහ බලන්ගොඩ පින්වල මාර්ගය ඔස්සේ පෙරහැර තුනක් ලෙස බෙදී ගමන් කරනු ලබයි. සමන් දෙවි ප්‍රතිමාව සහිත දේවාභරණ වැඩම කරවන රිය පෙරහැර ප්‍රථමයෙන්ම සබරගමු මහා සමන් දේවාලය කරා පැමිණෙන අතර, එහි දී ශ්‍රීපාදස්ථානයේ ගිහි පැවිදි කාර්යමණ්ඩලය විහාර මන්දිරයට ගොස් තෙරුවන් නැමඳ පුද සත්කාර කර රථ පෙරහැර හැටන් මාර්ගයෙන් නල්ලතන්නිය දක්වා ගොස් නවතී.

එම ස්ථානයේ පෙරහැර පිළිගැනීමට බැතිමතුන් සූදානම්ව සිටින අතර, එතැන් පටන් පංචතූර්ය නාදයෙන් යුතුව පෙරහැර සම්ප්‍රදායානුකූලව පා ගමනින් මළුව දක්වා ගමන් කිරීම ආරම්භ කරයි. එයින් පසුව ගිමන් හැරීම සඳහා පෙරහැර නතර වන්නේ ජපන් සාම චෛත්‍ය අසලයි. එහිදී සංග්‍රහයන්ට සහභාගි වී සීත ගඟුල දක්වා ගමන් කරයි. සීත ගඟුලේ දී සියලු දෙනා ජලය ස්නානය කොට පිරිසිදු වී එහි සමන් දෙවොලය අසල ආගමික චාරිත්‍රයන්හි යෙදී යළිත් පෙරහැර ආරම්භ කරයි. පෙරහැර සිරිපා මළුවට පිවිසීමෙන් පසු උදුවප් පුර පසළොස්වක දා හිමිදිරි උදෑසන සුබ මුහුර්තයට අනුව ශ්‍රීපාදස්ථානාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මූලිකත්වයෙන් සඳුන්කිරි මිශ්‍රිත සුවඳ පැණින් ශ්‍රීපාද පද්මය පවිත්‍ර කොට නානුමුර පූජා පවත්වනු ලැබේ. ඉන් අනතුරුව පෙරහැරින් වැඩමවන ලද සධාතුක කරඬුව, දේව ප්‍රතිමා ඇතුළු දේවාභරණ සිරිපා මළුව වටා තෙවරක් පැදකුණු කොට දේව මන්දිරයේ තැන්පත් කරනු ලබයි.

චාරිත්‍රානුකූලව පවත්වන මංගල බුද්ධ පූජාව පෙරහැරින් මළුව වටා වැඩමකර පූජා පැවැත් වූ පසු මහා සංඝරත්නය විසින් සෙත් පිරිත් දේශනා කරනු ලබයි. එම කටයුතු නිමවීමෙන් පසුව සුමන සමන් දෙවිඳුන්ට පින් අනුමෝදන් කොට කපු මහතා යාතිකාවක් පවත්වනු ලබයි. ඉන් අනතුරුව දොළොස් මහේ පහන දැල්වීමත් සමඟ සිරිපා වන්දනා සමය ඇරැඹේ.

සිරිපා වන්දනාව වෙනම ම උපසංස්කෘතියකි. එහිදී සිය චර්යාව පවත්වාගත යුතු ආකාරයේ සිට ආහාර පාන දක්වා ආවේණික චාරිත්‍ර විධි ඇත. තෙරුවන් පිළිබඳ නිබඳව සිතෙහි ශ්‍රද්ධාව සහිතව එම වන්දනාවේ යා යුතුය. මේ සියල්ල අනුග මනය කරන අතර තුර අප විසින් මනාව සිතිය යුතු කරුණක් ඇත. එනම්, මේ පරිසර පද්ධතියේ මතු පැවැත්ම පිළිබඳවයි. සිරිපා වාර කාලයේ දී පරිසරයට මුදා හරින පොලිතීන් ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් ගණනක් වේ. එබැවින් එම අපද්‍රව්‍ය සිරිපා අඩවියට බැහැර නොකොට සිරිපා අඩවියෙන් පිටතට ගෙනවිත් විධිමත් ලෙස බැහැර කිරීම වැදගත් වේ. සෑබෑ බෞද්ධකම ශ්‍රද්ධාව හා ප්‍රඥාව සමව මෙහෙය වීමයි.

එසේ නම් ඔබ සැමට මුනි සිරිපා පද්මයේ සරණයි! සුමන සමන් දෙවි රැකවරණයි!

**රුවන් වින්ඩ්සර්**


## පුණ්‍යානුමෝදනාත්මක ස්තුතිය

- *බෞද්ධාලෝක සඟරාව ධර්මදානයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට, ලාභාපේක්ෂාවෙන් තොරව, අවස්ථාව සලසා දුන් රජයේ මුද්‍රණාලයාධිපතිනි ගංගානි ලියනගේ මහත්මියට හා එයට සහයෝගය දැක්වූ මුද්‍රණාලීය කාර්යය මණ්ඩලයට, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගෞරවය හා පුණ්‍යානුමෝදනාත්මක ස්තුතිය පුද කරමු.*

### බෞද්ධයන්ගේ උන්නතියට මහඟු මෙහෙයක් කළ විද්වතා

# මහාචාර්ය ගුණපාල මලලසේකර

### ජන්ම සැමරුම වෙනුවෙනි



ලොව ප්‍රාචීන අධ්‍යාපනයන් පිළිබඳ කීර්තිමත් මහැදුරකු වූ ආචාර්ය ජී.පී. මලලසේකර විසි වැනි සියවසෙහි ශ්‍රී ලංකාවේ විසූ විද්වතුන් අතර මැණිකක් බඳුවිය. පාලි සහ බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ මහැදුරකු ලෙස විද්වත් ප්‍රජාව උදෙසා සේවය කරන අතරම බෞද්ධයන්ගේ උන්නතිය උදෙසා විවිධ අයුරින් ඔහු නිරතුරුව ම ක්‍රියාකාරී විය. මේ සඳහා හෙතෙම සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය උපයෝගී කරගනු ලැබූ අතර, දශක හතරක කාලසීමාවක් තුළ එහි විවිධ තනතුරු, එනම් සමලේකම් (1925-1926), සභාපති (1939-1957) සහ බොහෝ දෙනෙකුට ප්‍රියමනාප වූ අනුශාසක පදවිය ද දරමින් කටයුතු කළේය.

මෙම ආයතනයේ ශක්‍යතාව උපරිම තලයකට ළඟා වන පරිදි ශක්තිමත් කිරීමට සැලකිය යුතු මට්ටමකින් උපකාරී වූ මෙම විශිෂ්ට නායකයාට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සදා ණයගැති වෙයි.

ලෝක බෞද්ධ ප්‍රජාව උදෙසා ඔහු විසින් ඉටුකරනු ලැබූ අතිශයින් වැදගත් කාර්යයන් අතුරින් එකක් නම් 1950 මැයි මස පිහිටුවනු ලැබූ 'ලෝක බෞද්ධ මිත්‍රත්ව සමුළුව'යි. එය ලෝකයේ එතෙක් පවත්වනු ලැබූ ප්‍රථම බොදු සමුළුව වන අතර, රටවල් 29 කින් නියෝජිතයන් 129 ක් සහභාගි වූ මහා පරිමාණයේ සමුළුවක් විය. මහැදුරු ගුණපාල මලලසේකර විසින් පොදුවේ මෙරට සමාජයට සහ විශේෂයෙන් බෞද්ධ ජනතාවට ඉටුකරනු ලැබූ අති විශාල සේවාව වචනවලින් පවසා නිම කළ නොහැක.

ගුණපාල මලලසේකර ශ්‍රීමතාණන් සෝවියට් රුසියාවේ ප්‍රථම ශ්‍රී ලංකා තානාපති තනතුරට 1957 වසරේත් ඉන් අනතුරුව චීනය, චෙකොස්ලෝවැකියාව, යුගෝස්ලෝවැකියාව, පෝලන්තය හා රුමේනියාව ආදී රටවල තානාපති තනතුරු සහ කැනඩාවේ මහ කොමසාරිස් ලෙසත්, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත හා 1963 සිට 1967 දක්වා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තනතුරත් හෙබවීය.

උසස් පිළිගැනීමක් ඇති විද්වතකු වූ ඔහු බෞද්ධාගමේ විවිධ අංශ පිළිබඳ දැනුමැති, ලෝක ප්‍රකට පර්යේෂකයන්ගේ සහභාගිත්වය ඇතිව 1956 සිට බෞද්ධ විශ්වකෝෂය ඇරඹීමට මූලිකත්වය ගනු ලැබීය. නොවැම්බර් මස 09 වැනි දිනට උපන් දිනය යෙදෙන මෙම උදාර විද්වතා උදෙසා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වත්මන් සභාපති ලෙස සම්මේලනයේ අනෙකුත් ක්‍රියාකාරීන් සමඟ එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

**චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ**
සභාපති
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

# 'බෞද්ධයිනි, සිංහල භාෂාව ඔබේ උරුමයයි. එය රැකගැනීම ඔබේ යුතුකමයි'



සෑම සිංහලයකුම මෙය කියවා බලනවා නම් හොඳයි. ලෝකයේ මිනිසුන් උපදින්නේ තම උරුමය දායාද කරගෙනය. මෙම උරුමය දෙයාකාරය. එනම් සොබාදහමින් ලබන උරුමය සහ සංස්කෘතික උරුමය ලෙසයි. තවද මෙම සංස්කෘතික උරුමයේ කොටස් දෙකකි. චංචල සහ නිශ්චල වශයෙන් වූ ස්පර්ශනීය උරුමය සහ අස්පර්ශනීය උරුමයයි. සිංහල භාෂාව වෙන කිසිවකුගේ නොව ඔබේ උරුමයයි. ශිෂ්ටාචාරයක් විසින් භාවිත කරමින් දියුණු කරන ලද ශිෂ්ටාචාරයේ භාෂාව එහි ඇති විශේෂිතම අංගයයි. එසේ වන්නේ භාෂාව යනු ඕනෑම ශිෂ්ටාචාරයක ඇති සාරධර්මයක් සහ දැනුම් සම්භාරයක් එක පරම්පරාවකින් ඊළඟ පරම්පරාව වෙත සන්නිවේදනය කරන මාධ්‍යයක් බැවිනි. භාෂාව නැති වුවහොත් එම ශිෂ්ටාචාරය විසින් ගොඩනඟන ලද සාරධර්ම සහ දැනුම ඉදිරියට ගමන් කරන මඟක් නොමැතිවීමෙන් ශිෂ්ටාචාරය අවසාන වන්නේය.

අප දන්නා හැටියට අතීතයේ දී ලෝකයේ බොහෝ උසස් ශිෂ්ටාචාරයක් විය. ඒවා බැබිලෝනියානු ඉට්‍රස්කන්, ග්‍රීක, රෝම, ඊජිප්තියන් හරප්පා මොහන්ජදාරෝ ආදී නම් වශයෙන් හඳුන්වයි. මෙම ශිෂ්ටාචාරයන් ලොව පහලවී පැවත වසර සිය ගණනකින් සම්පූර්ණයෙන් නැතිවී ගොසින්ය. සමහර පැවති ඔවුන්ගේ භාෂාවන් පුරාවිද්‍යාඥයින්ටවත් කියවා තේරුම් ගත නොහැකිව පවතී. ඔබගේ උරුමය වන සිංහල භාෂාව අයිතිවන්නේ සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයේ වැදගත්ම අස්පර්ශනීය අංගය ලෙසිනි. සිංහලේ බෞද්ධ ශිෂ්ටාචාරය වසර දෙදහස් තුන්සියයකට වඩා වැඩි කාලයක් තිස්සේ අඛණ්ඩව එකම රටක එකම භාෂාවක් කථා කරමින්, ලියමින් බුද්ධාගම අදහමින් අද දක්වාම පවතින්නේය. එය ආශ්චර්යයකි. එසේ වූයේ එම ගමන් මඟෙහිදී මුහුණදුන් හැල හැප්පලි විවිධ ආභාෂයන් ආදියට මුහුණ දෙමින් ජය ගනිමිනි. මෙය ඔබේ මුතුන් මිත්තන් හරහා ඔබට ලැබුණ උරුමයකි. එබැවින් සිංහල බස රැකගත යුත්තේ ඔබ මිස වෙන කවුරුන්ද? ඔබම සිතා බැලිය යුතුය. සිංහල භාෂාව නොමැතිව සිංහලයන් ද, සිංහලයා නොමැතිව මෙතෙක් රැකගෙන ආ නිර්මල බුදුදහමක් පවතින්නේ නැත. අද පාසල් අධ්‍යාපනය ද, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද සිංහල භාෂාවේ පරිහානියට මුලපුරා ඇත. එය ජාතියේ අභාග්‍යයයි. යුනෙස්කෝව පවා නිර්දේශ කර ඇත්තේ සියලුම ජාතීන් තම ළමයින්ට පස්වැනි පංතිය දක්වා දරුවන්ට ඔවුන්ට උරුම භාෂාවෙන් ඉගැන්වීම අවශ්‍ය බවයි. දරුවන්ට තම ශිෂ්ටාචාරයේ ඇති සාරධර්මයන් ද, එයට ඇති ආදර ගෞරවය ද ලැබෙන්නේ එය තුළින් බැවිනි. ලංකාවේ උගත් නමුත් අනුවන දෙමාපියන් උනන්දු

කරන්නේ ළදරු පාසලේ සිට දරුවට ඉංග්‍රීසිය ඉගැන්වීමය. එමෙන්ම වෙර දරන්නේ පාසල් අධ්‍යාපනය ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් කරවීමටය. හොඳින් සිතා බැලුවහොත් එය හීනමානයකි. අද ශ්‍රී ලාංකිකයින් ජාතික වීමට පෙර ජාත්‍යන්තර වීමට උත්සාහ වන්නේය. එයින් සාගරයට වන් දිය බිඳක් සේ තම අනන්‍යතාවයෙන් තොරව නැතිවී යන බව නොතේරෙන්නා සේය. විශ්වවිද්‍යාල උගතුන් ද තම විෂයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට උත්සුක වී ඇත. පශ්චාද් උපාධි කරවන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි. ඒ සඳහා ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කරන නිබන්ධනවල බොහෝ විට ඇත්තේ ඉංග්‍රීසි නොව ඉංග්‍රීසියෙන් අදහස් නිසිලෙස ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. එය ශිෂ්‍යයින්ට තම මව්බසින් ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණා නම් මොන රඟේට ඒවා කරනවා ඇත්ද? එදා මාගේ පුංචිඅම්මලා සිංහල ඉගෙන ගත්තේ ඉංග්‍රීසියෙනි. අද අප ගමන් කරන්නේ එතැනටදැයි සලකා බැලිය යුතුය.

සිංහල භාෂාව ද අනිකුත් සම්ප්‍රදායක් මෙන් වසර දෙදහස් පන්සියයකට වැඩි කාලයක් තිස්සේ වෙනස් වෙමින්, දියුණු වෙමින් අද දක්වා ගමන් කොට ඇත. එහි වූ උචිත භාෂාව ද එසේමයි. ක්‍රිස්තු පූර්ව පළමු වැනි සියවසේ දී බෞද්ධ ත්‍රිපිටකය ලියා තැබීමට සුදුසු සහ උසස් තත්ත්වයක පැවතුණි. සිංහල ලියැවුණ අක්ෂර මුලින් බ්‍රාහ්මීවලින් පටන්ගෙන විවිධ ආභාෂයන් හරහා වෙනස් වෙමින් දියුණු වෙමින් අද භාවිත අක්ෂරයන් වෙත පැමිණ ඇත. කට, බඩ, තොල, පුක වැනි සරල වචනයන්ගෙන් විස්තර වූ හෙළබස පළමුව බුදු දහම සමඟ පැමිණි අර්ධ මාගධී භාෂාව සමඟ සම්බන්ධ විය. ඉන් පසු භාරතයේ මූල භාෂාව වූ සංස්කෘත මහායානය සහ ශිල්ප ශාස්ත්‍ර සමඟ පැමිණ සිංහලයට එකතු විය. අලියා යනු හෙළ බසයි. ඇතා යනු සංස්කෘතයේ හස්තියා යන්නෙන් බින්න වූ වචනයයි. හඬ සැමරීම ද එසේමයි. ඉන්පසු දකුණු ඉන්දියානු දේශපාලන බලපෑම් නිසා චෝලයින් සමඟ පැමිණි දෙමළ භාෂාවේ ආභාෂය ලැබුණි. පරංගින්ගේ පැමිණීම සමඟ ඔවුන්ගේ බස පමණක් නොව ආගම, චාරිත්‍ර ධර්ම, නම්ගම්, ආහාර ආදිය ද සිංහලයට එකතු විය. ලන්දේසි සහ ඉංග්‍රීසින්ගේ ද භාෂාව සහ සංස්කෘතියන් ද එසේම විය. මේවා සියල්ල සමාජ ගත වූයේ බලලෝභී ප්‍රභූන් හරහාය.

ඉහත සඳහන් සියලු ආභාෂයන්ගෙන් ලැබූ වචන සිංහලය සමඟ භාවිතයට එකතු කරගත්තා පමණක් නොව, බොහෝ වචන සබෝච්චාරණය සඳහා සිංහල කරගෙන ඇත. දැන් ඒවා සිංහල වචන වී ඇත. අතීතයේ පටන් ගද්‍යයෙන් සහ පද්‍යයෙන් ලියැවුණ සිංහල සාහිත්‍ය ඉතා පොහොසත්ය. අද දරුවන් ද, වැඩිමහලුන් ද සිංහලයෙන් ලියැවුණ පොතපත කියවන්නේ නැති තරම්ය. කියෙව්වත් එය නොතේරනවා ඇත. අද ජංගම දුරකථනයට හා පරිගණකයට හසුවී සිටින දරුවන්ට සිංහලෙන් කියවන්නට හා ඇසෙන්නට ඇත්තේ වල්පල් හැර වෙන කිසිවක් නොව, වසර දෙදහස් පන්සියයකට වැඩි කාලයක් තිස්සේ සිංහලදීපයේ භාවිත වූ සිංහල භාෂාව අද පත්වී ඇති අවදානම් තත්ත්වය ගැන රජයේ සහ අධ්‍යාපනයේ අවධානය යොමුවිය යුතුමය. සිංහල බසින් ඕනෑම අදහසක් ඉතා සරලව ඉදිරිපත් කළ හැක. විස්තර කළ හැක. එදා සාගර පලන්සූරිය කෙටි සරල පද හතරකින් ගම විස්තර කළ හැටි බලන්න.

| | |
|---|---|
| ගොඩ මඩ දෙකම සරු සාරය | එලබරය |
| කටුරොද ගම්මාන තරමක | පිටිසරය |
| එගම මැදින් ගලනා ගඟ | මනහරය |
| කඩමණ්ඩිය පිහිටියේ ගම | කෙලවරය |

මෙය සිංහල වචනයෙන් අඳින ලද මනහර චිත්‍රයක් අද අප මේ කථා කරන සිංහලයා සිංහල භාෂාවට ගරු නොකරනවා නොව, ඒ සඳහා ඔවුනට හැඟීමක් ඇතිවීම සඳහා දැනීමක් නැත. එහි රඟ දැනුනොත් එය රකිනවා නියතය. මෙතෙක් කාලයක් තිස්සේ සිංහලයා රැකගෙන ආ සිංහල භාෂාව ලොවින් අතුරුදන් වන භාෂාවක් ලෙස විද්වතුන් හඳුනාගෙන ඇත. සිංහලයේ භාෂාවත්, බුදුධාගමත් දෙකක් නොව එකකි. එය බෞද්ධ සංස්කෘතියේ කොඳු නාරටියයි. අද මේ සඳහා දරුවන් දැනුවත් කිරීම උනන්දු කරවීම දෙමව්පියන් සහ ගුරුවරුන් පැහැර හරිමින් පවතින වගකීමකි. සිංහල බස රැකගත යුත්තේ ඔබ මිස වෙන කිසිවෙක් නැත.

**විද්‍යාජෝති මහාචාර්ය නිමල් ද සිල්වා**

# මාලඹේ 66+ නිකේතනය



**66+ නිකේතනයේ වසර 10 කට වැඩි කාලයක් ජීවත් වන වයස අවු: 103 මාතාවකගේ හිස මත කඨින චීවරය තබා ආශිර්වාද කළ අවස්ථාව,**

මාලඹේ 66+ නිකේතනය දැන් අතිශය සාර්ථක ලෙස පවත්වාගෙන යන නිකේතනයක් වේ. ලංකාවේ මුදල් අය කොට පවත්වාගෙන යන වැඩිහිටි නිකේතන අතුරින් තරගකාරී ලෙස අඩු මුදලක් අය කොට පවත්වාගෙන යනු ලබන සුභෝපබෝගී නිවාසය මාලඹේ 66+ නිකේතනය වේ. මෙම නිකේතනය උණුවතුර සහිතව යාබද වැසිකිලි ඇති කාමර 40 කින් සමන්විත වන අතර, ඇවිදීමට අපහසුව ඇඳ මත සිටින පුද්ගලයන බලා ගැනීමට වෙනමම විශේෂ සත්කාර වාට්ටු දෙකක් ද ඇත. සේවක පහසුකම් සති දෙකකට වරක් වෛද්‍යවරයෙකුගේ පරික්ෂාව, ලොන්ඩරි පහසුකම් හා සියලුම ආහාර කාමරයටම සැපයෙන අතර, අතිවිශාල ගෙවත්ත හා බුදු මැදුර නිසා නිවැසියන්ට විවේක කාලය සැනසිල්ලේ ගත කිරීමට ඉඩ පහසුකම් ලැබී ඇත.

මේ පහසුකම් සියල්ල ලැබෙන කාමරයක් සඳහා එක් පුද්ගලයෙකුගෙන් රු.40,000/= සිට රු.75,000/= දක්වා මුදලක් අය කරනු ලබයි. (කාමර වර්ගය අනුව) මෙම නිකේතනය පාලනය කරනු ලබන්නේ ජාතික සමාජසේවා මණ්ඩලය විසින් වින් පත් කරනු ලබන ස්වේච්ජා පාලක සභාවකින් වන අතර, එම පාලක සභාව කිසිදු මුදලක් අය නොකර ආයතනයේ දියුණුව සඳහා කැප වී වැඩ කරන වෘත්තිකයන් ගෙන් සමන්විත වේ.

මෙම නිකේතනයෙන් ලැබෙන අතිරික්ත මුදල් බෞද්ධ මහා සම්මේලනයේ විවිධ කටයුතු සඳහා මෙන්ම මුදල් අවැසි අනෙකුත් මණ්ඩලවල කටයුතු සඳහා ආධාර කරනු ලබයි. මුදල් අය නොකර පවත්වාගෙන යන නිවාස සංවර්ධනයට මෙන්ම අළුතින් ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස ආරම්භ කිරීම සඳහා ද අතිරික්ත මුදල් යෙදවීම කරනු ලබන අතර, ආයතනය පවත්වාගෙන යෑම සඳහා මහජන ආධාර ලබා නොගන්නා බවද විශේෂයෙන් සඳහන් කරමු. මෙහි සාර්ථකත්වය නිසා මෙයටත් වඩා සැප පහසුකම් ඇති 65+ නමින් නිකේතනයක් තැනීමට දැන් සමාජසේවා මණ්ඩලය කටයුතු සැලසුම් කර ඇත. එහි වර්ග අඩි 600 නිවාස ඒකක 20 තැනෙන අතර, නිවාස ඒකකයක් සඳහා මුදල් යොදන අයෙක් වෙතොත් ඔහු හෝ ඇය ජීවිතය තිබෙන තාක් නොමිලේ ආයතනයේ තබා ගැනීමට අදහස් කරගෙන ඇති බව සතුටින් වාර්තා කරමු.

**දැනට පවත්වා ගෙන යන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවලට රුපියල් ලක්ෂ පනහකට වැඩි ප්‍රවර්තන වටිනාකම ඇති දේපල /මුදල් පරිත්‍යාග කර ජීවතුන් අතර සිටින දානපතියන්ගේ නිවෙස්වලට කඨින චීවරය වැඩම කරවා ආශිර්වාද කරන ලදී**




මුහන්දිරම් ඒම්ස් සහ එමිලියා ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය පරිත්‍යාග කළ ඩී චන්ද්‍ර- සේකර මැතිතුමාගේ පෞද්ගලික නිවසට කඨින චීවරය වැඩම වූ අවස්ථාව




මාලබේ 66+ නිකේතනයට ගොඩනැගිල්ලක් පරිත්‍යාග කළ රුක්මණී සීලනාථ කුරුප්පු මැතිණියගේ පෞද්ගලික නිවසට කඨින චීවරය වැඩම වූ අවස්ථාව




ඊ.ඩී.ඒ. ගුණසේකර අනුස්මරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය පරිත්‍යාග කළ ඊ.ඩී.ඒ. ගුණසේකර පවුලේ පෞද්ගලික නිවසට කඨින චීවරය වැඩම වූ අවස්ථාව




මාලබේ 66+ නිකේතනයට ජී බී ද සිල්වා ගොඩනැගිල්ල පරිත්‍යාග කළ හේමා ද සිල්වා මැතිණියගේ පෞද්ගලික නිවසට කඨින චීවරය වැඩම වූ අවස්ථාව

# කඨින මහෝත්සවය 2021



වව්නියාව කැලැබෝගස්වැව සපුමල්ගස්කඩ ආරණ්‍ය සේනාසනයේ වාර්ෂික කඨින මහෝත්සවය 2021.11.14 දින පැවැත්විය. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පවත්වන ලද මෙම මහෝත්සවයේ ප්‍රධාන දායකත්වය දරන ලද්දේ ආගමික හා සංස්කෘතික කටයුතු පිලිබඳ ජාතික මණ්ඩලයයි. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා විදේශ ගතවීම නිසා ගරු නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මහතා මෙම අවස්ථාවට සහභාගි විය. උප සභාපතිවරුන් වන ලලීන්ද්‍ර රණවීර, වෛද්‍ය රාණි ප්‍රනාන්දු, නිලිකා සේනානායක යන මහත්ම මහත්මින්ද සමලේකම්වරුන් වන දිලුම් තුෂාර වාහලතන්ත්‍රී මහතා හා ඉෂාන් එදිරිසූරිය මහතාත් සමග උප ලේකම් රවී පිරිස් මහතා සහ තවත් කිප දෙනෙක් සම්මේලනය වෙනුවෙන් මෙම පුණ්‍යණෝත්සවයට සහභාගි වුයේ අදාළ කොවිඩ් ආරක්ෂන උපදේශයන්ට යටත්වය. අවට ගම්වාසින්ද මල්පහන් රැගෙන පහන් සිතින් කඨින මහෝත්සවයට සහභාගී වුහ.

ආගමික හා සංස්කෘතික කටයුතු පිලිබඳ ජාතික මණ්ඩලයේ ගරු සභාපති, ලක්ෂ්මන් කෝට්ටගේ, උප සභාපති බ්‍රිගේඩියර් රාජා ගුණසේකර, ලේකම් එස්. වෙත්තසිංහ මහත්වරුන් 2021.11.13 දිනම අරණ්‍ය සේනාසනයට ගොස් පෙර සුදානම් කටයුතු සියල්ල යෙදු අතර එදින ප.ව.5.00 දක්වාම එහි රැදී සිටින ලදි. බ්‍රිගේඩියර් රාජා ගුණසේකර මහතා යුද හමුදා නිලධාරින්ට උපදෙස් දෙමින් අවශ්‍ය සියදුම සංවිධාන කටයුතු සිදුකරනු ලැබුවේ නායක ස්වාමින් වහන්සේ විහාරස්ථානයේ වැඩ නොසිටි නිසාය. උන්වහන්සේ නැවත විහාරස්ථානයට වැඩ ඇත්තේ රාත්‍රී 8.00 පමණය. 2021 .11.14 දිනද පෙ.ව.7.30 වන විට අප විහාරස්ථානය වෙත ගොස් සියළුම විධිවිධාන යොදන ලදි. පෙ.ව.8.30 කඨින චීවරය පුදබිමට වැඩම කළ අතර ඉන් අනතුරුව කෙටි දුරක් පෙරහැරෙන් කඨින චීවරය වැඩමවා විශේෂ මණ්ඩපයේ තැන්පත් කර කඨින පුණ්‍යණෝත්සවය ආරම්භ කරන ලදි.

ගරුතර මහා සංඝරත්නය 36 නමක් මෙම කඨින පිංකම සදහා වැඩම කරන ලදි. නායක ස්වාමින් වහන්සේ කුලකුමරෙකු පැවිදිකිරිමෙන් අනතුරුව මහා සංඝරත්නය වෙත දන් පිළිගන්වා චීවර පූජා කර කඨින පුණ්‍යානුමෝදනා අනුශාසනාවලින් අනතුරුව ප.ව.1.30 පමණ කඨින පිංකමෙහි කටයුතු සාර්ථක ලෙස අවසන් කරන ලදි. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන හා ගරු. සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා අපේක්ෂා කළ ආකාරයටම කඨින පිංකමේ සියලුම කටයුතු අංග සම්පූර්ණ ලෙස නිමකිරිමට හැකිවිම මහත් සන්තෝශයට කරුණකි. වව්නියාව පොලිස් අධිකාරිතුමා සමග පොලිස් නිලධාරින් යුද හමුදාවේ උසස් නිලධාරින් අනිකුත් නිලධාරින්, සිවිල් ආරක්ෂක බලකායේ උසස් නිලධාරින් සහ අනෙකුත් නිලධාරිගේ සහභාගිත්වත්, ලද සහයෝගයත්, කඨින පිංකම සාර්ථක ලෙස නිමකිරිමට මහත් රුකුලක් වු බව ස්තුති පූර්වකව පිහිපත් කරමු. මෙම පුණ්‍ය කටයුතු සදහා විශාල වශයෙන් මුදලින් ආධාර කල ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලයේ ව්‍යාපාරික සාමාජික/සාමාජිකාවන්ටත් සහයෝගය ලබාදුන් සියලුම දෙනාටත් ගරු. සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ට මහතා ඇතුලු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සියලුම සාමාජිකයිනටත් ස්තුතිය පුද කරන අතර සියලු දෙනාටම මෙම පුණ්‍ය මහිමය හේතුකොට ගෙන නිදුක් නිරෝගි සම්පත්තිය ලැබ් සසර කෙටිකර උතුම් නිවනට ළගාවීමට මාර්ගය උදා වේවායි පතමු!



# සංඝමිත්තා මහරහත් තෙරණියෝ සහ උඳුවප් පෝදා

උඳුවප් පොහෝ දින වනාහි ලෝකවාසී බෞද්ධයන්ට මෙන්ම ශ්‍රී ලාංකේය කාන්තා පරපුරට සුවිශේෂ වූ දිනයකි. එනම් මේ රට වැසි කාන්තාවට විමුක්තිය උදාකරමින් සසර ජය ගන්නට අත්පොත් තැබුණේ මේ පෝය දිනයේදීය.

අපට එම විමුක්තිය රැගෙන ආ සංඝමිත්තා මහරහත් උත්තමාවිය ධර්මාශෝක මහරජතුමාගේ දියණියයි.

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ උජ්ජයිනී නම් වූ ග්‍රාමයේ එතුමියගේ උපත සිදුවී ඇත. වයස අවුරුදු 14 දී අශෝක රජුගේ බෑනණුවන් කෙනෙකු වන්නා වූ 'අග්‍රබ්‍රහ්මී' අග්ගි බ්‍රහ්ම නම් කුමරෙකුට සරණ පාවා දෙන ලදුව ඉතා වාසනාවන්ත ගෘහ ජීවිතයක් ගත කරන ලදී. සංඝමිත්තාවෝ සුමන නම් පුතෙකුට මව වූවාය.

ධර්මාශෝක රජු සසුන්හි ඥාතීත්වයෙහි පිහිට වීමට නම් තම දරුවන් සසුන් ගත කළ යුතු යැයි රහතන් වහන්සේගේ අවවාදය පිළිගෙන සිය සංඝමිත්තා දියණිය ද මිහිඳු කුමරු ද අග්ගි බ්‍රහ්ම කුමරු මෙන්ම පස් හැවිරිදි සුමන කුමරු ද සසුන්ගත කරන ලදී. එතුමිය ථෙරවාදී බුදු සසුනෙහි පැවිදි බව ලබන විට වයස අවුරුදු 18 කි. ආයුපාලි නම් මහ රහත් මෙහෙණින් වහන්සේගේ ආචාර්යත්වයෙන් හා ධම්මපාලි මහරහත් මෙහෙණින් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් පැවිදි බිමට පත් වූ සංඝමිත්තා තෙරණියෝ නොබෝ දිනකින්ම ප්‍රාර්ථනීය ලෙස සියලු කෙලෙසුන් නසා උතුම් වූ මහ රහත් පදවියට පත්වූ සේක. උන්වහන්සේ පසුව 'පාටලීපුත්‍ර' නම් ග්‍රාමයෙහි වැඩ වාසය කළ සේක.

ධර්මාශෝක මහ රජු විසින් බුද්ධ ශාසනය පිරිසිදු කර දුසිල් මහණුන් නෙරපනු වස් තුන්වන ධර්ම සංඝායනාව පැවැත්වීමට තීරණය කළේය. මෙම සංඝායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේයි. ධර්ම සංඝායනාවෙහි නිර්දේශවලට අනුකූලව පිරිසිදු බුදුදහම ව්‍යාප්ත කිරීම පිණිස, ධර්මදූත කණ්ඩායම් 9 ක් විවිධ දිශාවලට පිටත් කරන ලදී.

මෙසේ විදෙස් රටවලට ධර්මදූතයන් යවද්දී රජු පුත් මිහිඳු හිමි විසින් අපේ ශ්‍රී ලංකා දීපය තෝරා ගැනීමට තරම් අපි භාග්‍යවන්තයෝ වීමු. තිස්ස රජුගේ ඉල්ලීම පරිදි, මිහිඳු හිමි ඇතුළු පිරිස ශ්‍රී ලංකාව බලා පිටත් වූහ. මෙම දීර්ඝ ගමනට පෙර සිය මෑණියන්ගේ ආශීර්වාදය ලබාගත් උන්වහන්සේ ගමනට තවත් හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එක් කරගත් සේක. ඒ උට්ඨිය, උත්ථිය, සම්බල, බද්ධසාල යන රහතන් වහන්සේලා ද, සුමන සාමණේරයන් ද, භණ්ඩුක උපාසක ද (මිහිඳු හිමිගේ ඥාති සහෝදරයෙකි) වශයෙනි.

කුඩා සාමණේර හිමි නම සංඝමිත්තා මහරහත් තෙරණියගේ පුත්‍ර රත්නයයි. ඒ කුඩා සාමණේරයන් වහන්සේ ද අභිඤ්ඤාලාභී මහ රහත් තෙරනමකි.

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු (ක්‍රි.පූ. 250 - 210) තිසරණ සහිත පංචශීලයෙහි පිහිටුවා මහමෙව්නා උයනට වැඩම කළ දිනයේ ම අනුලා දේවිය ඇතුළු පන්සියයක් හෙළ කුල කතුන් පැවිද්ද අයැද සිටියෝය. කාන්තාවන්ට පැවිද්ද ලබාදීම භික්ෂූන් හට අකැප බැවින් ඒ උදෙසා භික්ෂුණීන් වහන්සේ නමක් වඩමවා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගිණි.

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ නැඟණිය වන සංඝමිත්තා මහරහත් තෙරණිය ලංකාවට වැඩම කරවා දෙන ලෙස ධර්මාශෝක රජුගෙන් ඉල්ලා සිටීම සඳහා අරිට්ඨ කුමරු ඇතුළු රාජකීය පිරිසක් ඉන්දියාවට පිටත්ව යන්නේ ඒ උදෙසාය. එසේ ඔවුන් පැළලුප් නුවර බලා පිටත්ව ගොස් ඇත්තේ වප් පුර පසළොස්වක පොහෝ දිනකය.

දූත පිරිස පිළිගත් ධර්මාශෝක රජු සිය දියණිය පමණක් නොව, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ද ශ්‍රී ලංකාද්වීපයට වැඩම කර යැවීමට එය අවස්ථාවක් කර ගත්හ. මේ ගමන සඳහා සූදානම් වන විට සංඝමිත්තා තෙරණියගේ වයස අවුරුදු 32 ක් පමණි.

සත්‍ය වශයෙන්ම ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාද්වීපයට වැඩම වීම විෂයෙහි පරිනිර්වාණ මංචකයේ දී අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ අධිෂ්ඨාන පහක් කර ඇති බවත්, එහෙයින් බෝධීන් වහන්සේ වැඩම කරවීම දුෂ්කර කාර්යයක් නොවන බවත්, මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් රජු දැනුවත් කරන ලදී.

ඒ අනුව නවරියන් වට ඇති, පස් රියන් උස ඇති, අඟල් අටක් ඝනකම ඇති, ඇතුළත ඝන අඩි 119 ක් වන ස්වර්ණ කටාහයක් කරවා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් ඒ තුළට වැඩමවා ශ්‍රී ලංකාවට රැගෙන යාමට සකසන ලදී. අදටත් දැකගත හැකි අයුරින් දඹදිව සාංචි තොරණේ කැටයම් දෙකක ජය ශ්‍රී මහා බෝධි ශාඛාව ලංකාවට වැඩම කළ අයුරු දක්වා ඇත.

සරසන ලද නෞකාවකින් ගංගා නදිය දිගේ වඩමවන ලද බෝධි ශාඛාව සත් දිනකින් දඹදිව තාම්‍රලිප්ත නම් තොටට පැමිණියේය. එහිදී කරවටක් ජලයේ බැස ධර්මාශෝක රජු බෝධීන් වහන්සේට ගෞරව උපහාර දැක්වූහ. එහිදී ධර්මාශෝක නිරිඳාණන් විසින් දඹදිව රාජ්‍යය තුන් වතාවක්ම ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා පූජා කළේය. තාම්‍රලිප්ත තොටුපළේ සිට ලක්දිව දඹකොළ පටුනට නැව යාත්‍රා කිරීමට දින හතක් ගත විය.

එසේ වැඩම වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ දෙවනපෑතිස් රජු ද කරවටක් මහ මුහුදේ බැස සිරසින් පිළිගත්තේය. මහ පෙරහරින් වැඩම කරවූ ඒ දක්ෂිණ ශාඛා බෝධීන් වහන්සේ සුවහසක් ජනී ජනයාගේ සාදුකාර මධ්‍යයේ අනුරාධපුර මහමෙව්නා උයනේ පිහිටියේය. දෙවනපෑතිස් රජු ද මේ ලක් දෙරණ තුන් වතාවක් ම බෝධීන් වහන්සේට පූජා කරන ලදී.

ඒ සමඟ දහ අට කුලයකට අයත් වෘත්තිකයන් පිරිසක් ද බෝධීන් වහන්සේගේ ආරක්ෂාව සඳහා මෙන්ම විවිධ ශිල්ප ශාස්ත්‍ර කටයුතු සඳහා මේ රටට එවීමට ද ධර්මාශෝක මහ රජු විසින් කටයුතු යොදා තිබුණි.

එහෙයින් උඳුවප් පොහෝ දින සඟමිත් තෙරණියගේ ආගමනයත් සමඟ ශිල්ප ශාස්ත්‍ර අතින් ද මෙරට පොහොසත් වූ බව අපට සතුටින් සිහිපත් කළ හැක. හෙළටුවා ලියූ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ රටපුරා දම් දෙසමින් ධර්ම ඥාණයෙන්



අප පොහොසත් කරද්දී, සඟමිත් තෙරණිය සමඟ පැමිණි මෙම 18 කුලය ශිල්ප ශාස්ත්‍ර දැනුම අතින් මෙරට වැසියන් පෝෂණය කිරීමට දායක විය. එහෙයින්ම උඳුවප් පොහොය අපට වැදගත් වන්නේ ලක්දිව මෙහෙණි සස්න පිහිට වීම සම්බන්ධයෙන් පමණක් නොවේ. බෞද්ධයාගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම වීමත්, ශාස්ත්‍රයෙන් අපව පොහොසත් කළ 18 කුලයක ශිල්පීන් මෙරටට පැමිණීමත් එකසේම වැදගත්ය.

පාලි බෝධි වංශ ගැටපදයට අනුව එම 18 කුලය මෙසේය.

1. බලත්ථ කුලය - දොර රැකීම
2. උද්‍යාන පාල කුලය - මල් වැවීම
3. කුලිංග කුලය - මල් සැපයීම
4. මාලාකාර කුලය - මල් ගෙතීම
5. කප්ප කුලය - ලදපස්මල් තැනීම
6. පේෂකාර කුලය - රෙදි වියීම
7. සිබ්බකාර කුලය - රෙදි මැසීම
8. ඡත්තකාර කුලය - සේසත් තැනීම
9. තුරච්ච කුලය - සේසත් මැසීම
10. ගන්ධකාර කුලය - සුවඳ තැනීම
11. කුම්භකාර කුලය - මැටි වැඩ කිරීම
12. සුද කුලය - බත් පිසීම
13. කම්මාර කුලය - යකඩ වැඩ කිරීම
14. ලෝහ කාර කුලය - ලෝහ වැඩ කිරීම
15. සුවණ්ණකාර කුලය - රන් රිදී වැඩ කිරීම
16. වඩ්ඪකී කුලය - ලී වැඩ කිරීම
17. චිත්තකාර කුලය - සායම් වැඩ කිරීම
18. ආතවොජ්ජක කුලය - බෙර වැයීම

තවත් තැනක සඳහන්ව ඇත්තේ,

මගධයේ රාජකීය පෙළපතෙහි අයද,
රදළයන් ද,
බ්‍රාහ්මණවරු ද,
වෛශයයන් (වෙළෙඳුන්)
එඬේරුන්
කර්මාන්තකරුවන්,
සන්නාලියන් සහ
කුඹල්කරුවන් ද, මෙම පිරිසට අයත්ව සිටි බවයි.

බෝධීන් වහන්සේ වැඩමවීමට සය මසකට පෙර සිදුවූ මහින්දාගමනයෙන් බෞද්ධ දර්ශනය හඳුන්වා දී ඇති කරන ලද චින්තන විප්ලවය මෙම දහ අට කුලයක ශිල්පීන්ගේ ආගමනය සමඟ වඩ වඩාත් ඔපවත් වී ශිෂ්ට සම්පන්න සමාජයකට අත්‍යාවශ්‍ය වන කර්මාන්ත ගොඩනැංවීමට ද, බෞද්ධ සංස්කෘතියක් ඇති කරලීමට ද කොතරම් ඉවහල් වන්නට ඇද්දැයි කිවමනා නොවේ.

මහා බෝධි රෝපණයෙන් පසු සංඝමිත්තා මහ රහත් තෙරණිය මෙරටට වැඩම කළ ප්‍රධාන

කටයුත්ත වූ අනුලා බිසවුන් ඇතුළු පන්සියයක් පමණ රාජකීය කුල කාන්තාවන් පැවිදි කිරීම සිදුවිය. ඒ සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේගේ පරිවාර භික්‍ෂුන් වහන්සේලා වන උත්තරා, හේමා, පසද්පලා, අග්ගිමිත්තා, දාසිකා, ඡේගු, පබ්බතා, මත්තා, මල්ලා සහ ධම්මදාසියා යන භික්‍ෂුන් වහන්සේලා දොළොස්නමගේ ද සහාය ලබාගනිමිනි. ඉන් ඇරඹුණේ විධිමත්, විනයානුකූල භික්‍ෂුණී ශාසනයකි.

දෙවනපෑතිස් රජු සංඝමිත්තා රහත් උත්තමාව ඇතුළු භික්‍ෂුණීන් වහන්සේලාට චූලංග නා, මහාංගනා, සිරිවඩ්ඪන ඇතුළු දොළොස්මහ මෙහෙණි ආරාම කරවන ලදී. මේ මෙහෙණි ආරාම සියල්ල අනුරාධපුර යුගය පුරා අභයගිරි ජේතවන යන මහායාන නිකායවලට නොබෙදී මහා විහාරයේ පිරිසිදු ථේරවාදී භික්‍ෂුණී පරපුර අඛණ්ඩව පවත්වා ගෙන යෑමට සමත් වූ බව මහාවංශය කියයි. අද කාන්තා විමුක්තිය පිළිබඳ බොහෝ සේ කතා කළ ද භික්‍ෂුණී ශාසනයක් පිහිටවීමට නොහැකියාවක් ඇත්තේ මන්දැයි විමසා බැලිය යුත්තකි. එය අද වැනි උඳුවප් පොහෝ දිනක විශේෂයෙන් සලකා බැලීම වටී.

මෙසේ අප රටට වැඩම කරන ලද සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේ ඇතුළු පිරිස කිසිදා නැවත සිය රට බලා වැඩම කළේ නැත. මහත් වූ ශාසනික ආගමික මෙහෙවරක නිරත වීමෙන් ශ්‍රී ලංකාවාසී කාන්තාවට විමුක්තිය ලබාදීමෙන් වැඩසිටි උන්වහන්සේ උත්තිය රජුගේ නවවැනි රාජ්‍ය වර්ෂයේ දී උපසම්පදාවෙන් පනස් නව වසරකට පසු හත්ථාළ්හක මෙහෙණවරේ දී වයස වසර හැත්තෑ නවය පිරුණු පසු පිරිනිවන් පා වදාළ සේක. රජු මහත් ගෞරවයෙන්, රාජශ්‍රීයෙන් සංඝමිත්තා රහත් තෙරණියගේ ශ්‍රී දේහය උන්වහන්සේ ජීවමානව සිටිය දී ඉල්ලා සිටි පරිදි නැගෙනහිර ථූපාරාමයේ බෝධි ශාඛාව ඉදිරිපිට ආදාහනය කොට, එහි භෂ්මාවශේෂ මැදිකොට ස්ථූපයක් සාදවන ලදී. දැනුදු ඒ සෑයේ සංරක්‍ෂිත නටබුන් ථූපාරාම සෑයට නුදුරේ දැකගත හැකිය.

ශ්‍රී ලංකාවාසී කාන්තාවට අරහත් ධජය දරා ගැනීමේ වාසනාව උරුම කර දී, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනාමාන කිරීමට මහත් වූ භාග්‍යයක් සැලසූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේට අපි ණයගැති වෙමු.

මහා බෝධි රෝපණයෙන් පසු පැනනැගුණු අෂ්ඨ ඵලරුහ සහ දෙතිස් ඵලරුහ බෝධීන් වහන්සේලා ශ්‍රී ලංකා භූමිය ආවරණය වන පරිදි රෝපණය කිරීමේ දී එකී බෝධීන් වහන්සේලාට පුද පූජා පැවැත්වීම සඳහා යටකී දහඅට කුලයක ශිල්පීන් එම බෝධීන් වහන්සේලා සමඟම රට පුරා විසිර ගියහ. එහි ප්‍රතිඵලය වූයේ එම කර්මාන්ත සහ සිරිත් විරිත් දේශීය ජනතාව අතර මුල්බැහැ ගැනීමයි. එයින් ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයේ සහ සංස්කෘතියේ රසය අපි අද ද භුක්ති විඳින්නෙමු. එහෙයින් මෙම උඳුවප් පෝය වනාහි අපට මෙහෙණි සස්න පමණක් නොව, නව සංස්කෘතියක්, නව කර්මාන්තයන්හි ආරම්භයක් සනිටුහන් කර දෙන ලද්දකි.

එපමණක් නොව, අනුරාපුර මහමෙව්නාවේ රෝපණය කරන ලද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රැකවරණය පිණිස ලාංකික රජ දරුවන් සිව් දෙනෙකු (මිහිඳු, කාශ්‍යප, විධුරින්ද, සංඝමිත්ත) මුල්තැන තබා සෙසු කුලයන්ට ද රාජකාරි තනතුරු පවරා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අරබයා පෙරහර පැවැත්වීමට ශාක්‍ය වංශිකයන්ට තනතුරු ලබාදුන් බව සඳහන්ය.

මොවුන්ට තනතුරු ලබාදීම පමණක් නොව, ගම්වරද ප්‍රදානය කල බව ඉතිහාසය කියයි. මෙයින් අපට පැහැදිලි වන්නේ පූර්ණ රාජ්‍ය එම පොහෝ දින සිටය අනුග්‍රහය යටතේ බොදු වත් පිළිවෙත් ද බුදු දහම ද රට පුරා ව්‍යාප්ත කිරීමට උඳුවප් පොහෝ දින වැඩමවන ලද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මහත්සේ ඉවහල් වූ බවයි.

උඳුවප් පෝයෙන් ශ්‍රීපාද වන්දනා සමය ඇරඹෙයි. ශ්‍රී ලාංකික බෞද්ධයන් මහත් භක්තියෙන් හා ගෞරවයෙන් ශ්‍රී පාද වන්දනා සමය ඇරඹෙන තුරු කල් බලා සිට සමන්ගිර තරණය කිරීම සඳහා සූදානම් වන්නේ එම පොහෝ දින සිටය.

මේසා වැදගත් පොහොයක් වන උඳුවප් පොහෝ දින පෙහෙවස් සමාදන්ව පිළිවෙත් පුරන්නට අදිටන් කරගත යුතුය.

**වෛද්‍ය ඉන්ද්‍රාණී රත්නායක**

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

### 2021 අප්‍රේල් මස 03 සහ 04 දෙදින පැවති නිලවරණය සහ 94 වන වාර්ෂික මහා සභා රැස්වීමෙන් පත් වූ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ඇතුළු නව නිලධාරී මණ්ඩලය විසින් කරනු ලැබූ ශාසනික සේවාවන්

වසර 102 ඉතිහාසයකට උරුමකම් කියන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 2021 අප්‍රේල් මස 04 වන දින පැවති නිලවරණයෙන් සහ 95 වන වාර්ෂික මහ සභාවෙන් පත් වූ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය විසින් මේ දක්වා කරන ලද ශාසනික හා ආගමික සේවාවන් මෙසේ දිග හැරෙන්නේය.

1. අභිනවයෙන් පත් වූ නව නිල මඬුල්ල සිය රාජකාරී කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම සම්මේලනයේ ආදි කර්තෘන් සහ ශාසන විරුවන් සිහිපත් කොට පුණ්‍යානුමෝදනාව පළ කිරීම සඳහා මහා සංඝරත්නය 25 නමක් විෂයෙහි දහවල් දානය පිළිගැන්වීමේ පිංකමක් 2021 අප්‍රේල් මස 09 දින පවත්වන ලදී.

2. අභිනවයෙන් පත් වූ නව නිලධාරී මණ්ඩලයේ ප්‍රථම ගරු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ රැස්වීම 2021 අප්‍රේල් මස 09 දින පවත්වන ලදී.

3. ගරු සභාපතිතුමා ප්‍රමුඛ නව නිල මඬුල්ල 2021.04.24 දින මහනුවර ශ්‍රී දළදා වහන්සේ වැඳ ආශිර්වාද ලබා ගැනීමෙන් අනතුරුව ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහානායක මාහිමිපාණන්වහන්සේ, ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මහානායක මාහිමිපාණන්වහන්සේ ඇතුළු දෙපාර්ශවයේම අනුනායක ස්වාමින්වහන්සේලා බැහැ දැක ආශිර්වාද ලබා ගන්නා ලදී. එදිනම ගරු දියවඩන නිලමේ තැන්පත් නිලංග දෑල මැතිතුමා සහ මහනුවර තරුණ බෞද්ධ සංගමයේ සාමාජිකයින් හමු වීමද සිදුවිය.

4. නව නිල මඬුල්ල 2021.04.27 දින මීරිගම විද්‍යාවාස පිරිවෙනේ දී ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක, අතිපූජ්‍ය මකුලෑවේ විමලාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බැහැ දැක ආශිර්වාද ලබා ගන්නා ලදී.

5. අභිනවයෙන් පත් වූ අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය දොඩම්පහල චන්ද්‍රසිරි මහානායක ස්වාමින්වහන්සේ බැහැ දැක නව නිලමඬුල්ල ආශිර්වාද ලබා ගන්නා ලදී.

6. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වැඩිම කාලයක් සභාපතිත්වය දැරූ, ලෝක බෞද්ධ සම්මේලනයේ නිර්මාතෘවරයෙක් ලෙස සම්බුද්ධ ශාසනය දෙස් විදෙස් පතල කිරීමෙහිලා සිදු කළ ආගමික ශාසනික ශාස්ත්‍රීය මෙන්ම රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලිය බෙහෙවින් ප්‍රශංසනීය අයුරින් ඉටු කළ මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිඳුන්ගේ 48 වන ගුණ සමරු උත්සවය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා ලෝක බෞද්ධ සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ඒකාබද්ධව 2021 අප්‍රේල් මස 23 දින පැවැත්විණි.

   තවද මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිඳුන්ගේ 122 වෙනි ජන්ම දින සැමරුම 2021.11.09 දින සිදු කරමින් මලලසේකර පිළිරුවට පුෂ්පෝපහාර දක්වමින් පවත්වන ලදී. එදිනම මලලසේකර අධ්‍යාපනික හා සංස්කෘතික පර්යේෂණ මධ්‍යස්ථානය නැවත පිහිටුවීමට කටයුතු ආරම්භ කරන ලදී.

7. වර්තමානයේ රටේ පවතින කොවිඩ් 19 වසංගත රෝගී තත්වය හමුවේ ශ්‍රී ලංකාවාසී ජනතාව රෝග බියෙන් මුදවාලීම උදෙසා අප තිලෝගුරු අමාමෑණි බුදු පියාණන් වහන්සේගේ තෙමඟුල සමරනුවස් වෙසක් මාසයේදී රටට සහ ජනතාවට ආශිර්වාද කොට මහා සංඝරත්නයේ

අනුශාසනාවෙන් හා ආශිර්වාදයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව සෙත් පිරිත් සජ්ඣායනාවක් 2021 මැයි මස 24 වන දින පවත්වන ලදී. එදින ජාතික රූපවාහිනියෙන් විකාශනය කරන්නට විය.

වර්තමානයේ රටේ පවතින කොවිඩ් 19 රෝගී තත්වය හමුවේ 19 වන වරටත් සංවිධානය කර තිබූ බෞද්ධාලෝක වෙසක් උත්සවය නොපවත්වා බෞද්ධාලෝක මාවත ඒකාලෝක කරමින් ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක අංශවල සහයෝගය ඇතිව වෙසක් පහන් කූඩුවලින් අලංකාර ලෙස ආලෝකමත් කරමින් ආලෝක පූජාවක් පවත්වමින් සම්මේලන බෝ සමිඳුන් අභියස බෝධි පූජා පිංකමක් සිදු කරන ලදී.

එදින මහජන ආරක්ෂක පිළිබඳ ගරු අමාත්‍ය බොදු සමුළුවේ හිටපු ගරු උපසභාපතිවරයෙකු වූ රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා එම අවස්ථාවට සහභාගී වූ අතර, එම අවස්ථාවේදී බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තා පොත එතුමා වෙත ගරු නියෝජ්‍ය සභාපති මද්දුමගේ රෝෂාන් සම්පත් මහතා විසින් පිරිනමන ලදී.

8. රුහුණු කතරගම දේවාලයේ බස්නායක නිලමේ දිල්ෂාන් ගුණසේකර මැතිඳුන්ගේ ආරාධනයෙන් 2021 ජූලි මස 20 දින ඇසල පෙරහැරට සහභාගී වූ 1000 කට අධික පිරිසක් සඳහා රාත්‍රී බත් දන්සලක් බෞද්ධ මහා සම්මේලනයේ දායකත්වයෙන් පවත්වන ලදී. එදින ඓතිහාසික කිරිවෙහෙර වැඩ පුදාගෙන බස්නායක නිලමේතුමන් හමුවීම ද සිදු විය.

9. බෞද්ධ සුභ සාධක අරමුදලට පරිත්‍යාග ශීලීන්ගෙන් ලද මුදලින් රු.187,500/= ක් වටිනා රෝගී සත්කාරයට අත්‍යාවශ්‍ය මල්ටිපැරා මොනිටර්ස් කිහිපයක් ජාතික රෝහලේ අධ්‍යක්ෂතුමා වෙත පරිත්‍යාග කරන ලදී.

10. කොවිඩ් 19 වසංගත රෝගී තත්වය හේතුවෙන් බෞද්ධ මහා සම්මේලනයෙන් පාලනය වන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවලට ජාතික සමාජසේවා මණ්ඩලයේ ගරු සභාපති වසන්ත ද සිල්වා මහතාගේ මූලිකත්වයෙන් සමාජසේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් හතරවන වතාවටත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය බෙදා දෙන ලදී.

පූජ්‍ය බෝදාගම චන්දිම නායක ස්වාමින්වහන්සේ විසින් ඔක්සි මීටර් ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පරිත්‍යාග කළ අතර, ජාතික ළමාරක්ෂක මණ්ඩලයේ ගරු සභාපතිනි නිලිකා සේනානායක මහත්මියගේ මූලිකත්වයෙන් ළමාරක්ෂක මණ්ඩලය විසින් ආහාර ද්‍රව්‍ය, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය ද එම ළමා සංවර්ධන මධ්‍යස්ථාන 17 සඳහා බෙදා දෙන ලදී.

ආගමික හා සංස්කෘතික ජාතික මණ්ඩලයේ ගරු සභාපති ලක්ෂ්මන් කෝට්ටගේ මහතා සහ දානපතියන් දෙදෙනෙකුගේ ධන පරිත්‍යාග යෙන් රු.275,000/= බැගින් රු. 825,000/= වටිනා CPAP යන්ත්‍ර තුනක් සහ රු.287,500/= වටිනා මල්ටිපැරා යන්ත්‍රයක් ලක්ෂ්මන් කෝට්ටගේ මහතාගේ ධන පරිත්‍යාගයෙන් ගම්පහ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙත පරිත්‍යාග කරන ලදී.

11. අරන්තලාවේ භික්ෂු ඝාතනයට වසර 34 ක් පිරීම නිමිත්තෙන් පැවැත් වූ දානමය පිංකම සඳහා මූල්‍ය හා ද්‍රව්‍ය පරිත්‍යාගයන් සිදු කරන ලදී.

12. අප සම්මේලනය විසින් 15 වන වරටත් පැවැත්වීමට නියමිත වූ (2020 වර්ෂයේ පළ වූ බෞද්ධ ප්‍රකාශන සඳහා) බෞද්ධ සාහිත්‍ය උත්සවය කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ අතර ඒ වෙනුවෙන් Zoom තාක්ෂණය ඔස්සේ බෞද්ධ සාහිත්‍යයික උරුමය මැයෙන් විද්වතුන්ගේ සහභාගිත්වයෙන් සාහිත්‍ය කතිකාවතක් ගරු උපසභාපති මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතාගේ සංවිධානත්වයෙන් පැවැත් වූහ.

13. ස්වාධීන රූපවාහිනී සේවය සමඟ බෞද්ධ සම්මේලනය විසින් සෑම පුන් පොහෝ දිනකම ශාසනාලෝක වැඩ සටහන මගින් සාමනේර

ස්වාමීන්වහන්සේලාගේ දෙමාපියන් සඳහා ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලයේ ගරු සභාපති ලක්ෂ්මන් කෝට්ටගේ මහතාගේ මූල්‍ය පරිත්‍යාගයෙන් රු.5000/= බැගින් රු.50,000/= ක්ද, එදින අනුශාසනාව පවත්වන ස්වාමීන්වහන්සේට රු.10,000/= ක්ද පිරිනමනු ලැබේ.

14. සෑම පුන් පොහෝ දිනකම ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලයේ මූලිකත්වයෙන් සෞඛ්‍ය ආරක්ෂිත නීතිරීතිවලට අනුකූලව සීල සමාදාන වැඩ සටහන පවත්වනු ලැබේ.

    නව නිලධාරි මණ්ඩලය පත්වීමෙන් පසුව නිකුත් කරන ලද බෞද්ධාලෝක සඟරාව දෙමසකට වරක්ද ප්‍රකාශයට පත් කරන ලදී. ඊ පුවත්පත සෑම පොහෝ දිනකම ද නිකුත් කෙරේ.

15. ග්‍රැන්විල් වික්‍රමරත්න ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිත්‍යාග කරන ලද ග්‍රැන්විල් වික්‍රමරත්න මහත්මිය මේ වන විට රෝගාතුරව සිටින අතර, ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි එතුමිය පෞද්ගලික සාත්තු නිවාසයක නේවාසිකව නවතා රැක බලා ගැනීමේ කටයුත්ත සම්මේලනය විසින් සිදු කරනු ඇත.

16 සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයෙන් පාලනය වන ළමා සංවර්ධන මධ්‍යස්ථානවල නේවාසික දරුවන්ගේ මානසික මට්ටම නංවාලීම උදෙසා මධ්‍යස්ථාන තුළදීම ලෝක ළමා දින සැමරුම් සංවිධානය කරන ලදී.

17 2021 ඔක්තෝම්බර් මස 13 දින සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලයේ මූලිකත්වයෙන් ආචාර්ය සි.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමාගේ 137 වන ජන්ම දිනය වෙනුවෙන් ගුණ සමරු උත්සවයක් පවත්වන ලදී.

18 බෞද්ධ මහා සම්මේලනයේ භාරකාර මණ්ඩලයේ ගරු සාමාජික ඕස්ට්‍රේලියාවේ හිටපු මහ කොමසාරිස් මයිකල් ද සිල්වා මහතාගේ මැදිහත්වීම මත ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය සුභසාධක ව්‍යාපෘතිය විසින් ICU 77, මෙට්ට 74, කබඩ් 25, අත්වාරු 134 සම්මේලනය වෙත පරිත්‍යාග කරන ලදී. එම පරිත්‍යාගයන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමා වෙත භාරදුනි. පසුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි එම භාණ්ඩ රෝහල් සඳහා නිකුත් කරන ලදී. එම අවස්ථාවේදී බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තා පොත එතුමා වෙත පිරිනමන ලදී.

19 ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ඇතුළු පිරිස 2021 ජුලි මස 22 දින වවුනියාවේ කැලෑබෝගස්වැව සපුමල්ගස්කඩ ආරණ්‍ය සේනාසනයේ ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ශ්‍රී කල්‍යාණි වංශ පාර්ශවයේ උතුරු පළාත් ප්‍රධාන සංඝනායක පූජ්‍යපාද ගල්ගමුවේ සන්ත බෝධි නාහිමිපානන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නය වෙත වැහි සළු පූජා පවත්වා සිව්පසයෙන් උපස්ථාන කරන බවට ප්‍රතිඥා දී වස් ආරාධනය කළ වගයි. එදින සපුමල්ග ස්කඩ පුරාවිද්‍යා ස්ථාන නිරීක්ෂණ චාරිකාවක් ද සිදු කරන ලදී.

    2021.10.19 දින චාරිත්‍රානුකූලව කඨින චීවරය බෞද්ධ මහා සම්මේලනයේදී මසා පඬු පොවා විශේෂ ස්ථානයක තැන්පත් කර කඨින චීවරය වැදපුදා ගැනීමට සහ කප්රුක් පූජාවට ද අවස්ථාව ලබාදෙන ලදි.

    මෙම කඨින චීවරය ඉමහත් ගෞරවයෙන් අපගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවල නේවාසිකව සිටින වැඩිහිටියන්ට සහ සම්මේලනයට දේපල පරිත්‍යාග කරන ලද දානපතීන්ට ආශිර්වාද ලබා ගැනීම සඳහා නිවෙස් වෙත කඨින චිවරය රැගෙන යන ලදී.

    2021 නොවැම්බර් 14 වන දින පූජ්‍යපාද ගල්ග මුවේ සන්ත බෝධි නාහිමිපානන් වහන්සේ අනුශාසනාව පරිදි වව්නියාව කැලෑබෝග ස්වැව ඓතිහාසික රජමහා විහාරයේ කඨින මහා පූජෝත්සවයේ ගරු සභාපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ සිදු කිරීමට කරන ලදි. එදින කඨින චිවරය සංඝ සතු කිරීමත්, කුල

දරුවන් සසුන්ගත කිරීමත්, 50 නමක් විෂයෙහි සංඝගත දක්ෂිනාවක් පිරිනැමීම සිදු විය.

මෙම කඨික පිංකම ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලයේ මූලිකත්වයෙන් පැවැත්විණි. එහි ගරු සභාපති ලක්ෂ්මන් කෝට්ටගේ මහතාගේ ධන පරිත්‍යාගයෙන් වස් විසූ ස්වාමින්වහන්සේලා සඳහා සිව්පසින් ආධාර ඇතුළු වතුර ටැංකියක්, චීවරය තැන්පත් කිරීම සඳහා මංජුසාවක්, පාලම් කොඩි, පැවිදි කරන ස්වාමින්වහන්සේලා දෙනමට සිවුරු ඇතුළු පිරිවර සහ දෙමාපියන්ට පරිත්‍යාගයන් සිදු කරන ලදී. ලක්ෂ්මන් කෝට්ටගේ මහතාගෙන් සහ මණ්ඩලයේ රු.650,000/= පමණ ද්‍රව්‍ය හා මූල්‍ය දායකත්වයක් දක්වන ලදී.

ජාතික සමාජසේවා මණ්ඩල ගරු සභාපති වසන්ත ද සිල්වා මහතාගේ මූලිකත්වයෙන් එම මණ්ඩලය ඇතුළු ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවැසියන්, නිවාස පාලක සභාවලින් සහ එම දේපල පරිත්‍යාග කළ පින්වතුන්ගෙන් රු.335,594/= මූල්‍ය දායකත්වයක් ලබා දුනි.

තවද සම්මේලනය වෙත වෙනත් දායක භවතුන්ගෙන් රු.250,000/= වැඩි මුදලක් පිරිකර සඳහා ලැබී තිබුණි.

මෙදින දහවල් සංඝගත දක්ෂිණාව ජාතික ළමාරක්ෂක මණ්ඩලයේ ගරු සභාපතිනි නිලිකා සේනානායක මහත්මියගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් රුපියල් 150,000/- ක මුදලක වියදමින් සිදුකරන ලදී.

එසේම කප්රුක් පූජාවෙන් ලද පිරිකර සහ අනෙකුත් ද්‍රව්‍යයන් එම විහාරස්ථානයට පූජා කරන ලදී.

මෙම කඨින පිංකම සඳහා සමස්ථයක් වශයෙන් රුපියල් මිලියන 1.7 වැඩි ද්‍රව්‍ය හා මූල්‍යමය වටිනාකමකින් යුක්ත විය.

20. බෞද්ධ හිමිකම් ආරක්ෂා කර ගැනීම උදෙසා විවිධ වූ ක්ෂත්‍ර ඔස්සේ දිවයින පුරා සාක්ෂි ලබා ගනිමින් වසර 02 ක් පුරාවට සිදු කරන ලද බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව අනතුරුව නිකුත් කරන ලැබූ බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ජාතික ක්‍රියාන්විතය සඳහා කමිටු 09 ක් පිහිටුවන ලදී.

- බුද්ධශාසනය බෞද්ධ හිමිකම සහ ආගමික සහජීවනය,
- ඓතිහාසික පුරාවිද්‍යා උරුමය,
- නීතිය හා රාජ්‍ය පාලනය ජාතික ආරක්ෂාව හා විදේශ ප්‍රතිපත්ති,
- සමජීවිකතාව සහ ආර්ථිකය,
- තාක්ෂණය හා විද්‍යාත්මක ක්‍රම,
- භාෂාව, සංස්කෘතිය හා ජාතික අනන්‍යතාවය
- සෞඛ්‍ය ආහාර හා පෝෂණය වෙදකම
- අධ්‍යාපනය, සදාචාරය හා පුරවැසියා
- පරිසරය හා ස්වාභාවික සම්පත්

(මෙතෙක් පත් කරනු ලැබූ කොමිෂන් සභා වාර්තා නිර්දේශ ද සැලකිල්ලට ගනිමින්)

21. පැවිදි ගිහි උපදේශක මණ්ඩල රැස්වීම

නව නිලධාරි මණ්ඩලය පත්වීමෙන් පසු උපදේශක මණ්ඩලයේ ප්‍රථම රැස්වීම 2021 නොවැම්බර් මස 23 වන අඟහරුවාදා ප.ව.3.00 ට සම්මේලන ශාලාවේදී ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ අනුනායක බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අධ්‍යාපනපති පූජ්‍ය ආණමඩුවේ ධම්මදස්සාභිධාන අනුනායක ස්වාමින්වහන්සේ, ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය පූජ්‍ය මැදගම ධම්මානන්ද නායක ස්වාමින්වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නියෝජ්‍ය ලේඛකාධිකාරී පූජ්‍ය නැඳගමුවේ විජයමෛත්‍රී නායක ස්වාමින්වහන්සේ, කොළඹ නව කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය දිවියාගහ යසස්සි නායක ස්වාමින්වහන්සේ, මහාචාර්ය පූජ්‍ය කොන්ගස්තැන්නේ ආනන්ද නායක ස්වාමීන්වහන්සේ, අමරපුර මහා නිකායේ අමරපුර පාර්ශවයේ අධිකරණ

සංඝනායක ශාස්ත්‍රපති පූජ්‍ය දොඩම්පහල සිරි සුගුණ නායක ස්වාමින්වහන්සේ සහ කුලතුංග රාජපක්ෂ මැතිතුමා, මහාචාර්ය ආරියපාල පෙරේරා මැතිතුමා, මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා, මහින්ද මඩිහහේවා මැතිතුමා, විශේෂඥ වෛද්‍ය අනුලා විජේසුන්දර මැතිණිය, සුනිල් සරත් කූරගම මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

**ඉදිරි කටයුතු**

01. 2021 උඳුවප් පොහෝ දින පූජ්‍ය බලංගොඩ රාධා ස්වාමින්වහන්සේගේ මූලිකත්වයෙන් ශීල සමාදාන වැඩ සටහන පැවැත්වීමට සංවිධානය කෙරේ.

02. ශිෂ්‍යත්ව ප්‍රදානය

අධ්‍යාපනය ලැබීමට මූල්‍ය දුෂ්කරතා ඇති දිවයිනේ සිටින දූ දරුවන් උදෙසා අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට අත්වැලක් වීමට අරමුණු කරගෙන සාමණේර භික්ෂූන් වහන්සේලා, මෙහෙණින් වහන්සේලා, පළමු වසරේ සිට විශ්ව විද්‍යාල දක්වාත්, දෙමාපිය රැකවරණය අහිමි දරුවන් 600 ක් පමණ අප ළමා සංවර්ධන මධ්‍යස්ථාන 17 ක රැකබලා ගන්නා අතර, එම දූ දරුවන් සඳහාත් වාර්ෂිකව අධ්‍යාපනික ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු සංවිධානය කරමින් පවතී. එම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයක් 2021 දෙසැම්බර් මස 19 දින පැවැත්වේ.

03. සම්මේලනයේ ශාසනික සේවාවන් සිදු කොට අභාවප්‍රාප්ත වූ ආදි කර්තෘන්, නිලධාරීන් ඇතුලු සියලුම සාමාජික භවතුන්ට සහ රට වෙනුවෙන් දිවි පිදූ විරෝදාර රණවිරුවන්ට පුණ්‍යානුමෝදනා කිරීම හා වත්මන් නිලධාරී මණ්ඩලය ඇතුලු සමස්ත සාමාජිකත්වයට සෙත් ප්‍රාර්ථනා කරමින් 2021 දෙසැම්බර් මස 19 දින සර්ව රාත්‍රික පිරිත් පිංකම පැවැත්වීමට සංවිධානය කරමින් පවතී. පසුදින උදේ සංඝගත දක්ෂිණාවක් පැවැත්වේ.

04. රත්නපුර, අටකලන්පන්නේ පිහිටි ලංකාවේ ප්‍රථම කථානායක ප්‍රැන්සිස් මොලමුරේ මැතිතුමාගේ වලව්ව අයත් ඉඩමේ මුදලිදු අමරසේකර ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය නැවත ආරම්භ කිරීම සහ සියවස් කෘෂි නිවාස ව්‍යාපෘතිය.

05. ගෞරව ප්‍රණාම ප්‍රදානය කිරීමේ මහෝත්සවය

බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ශාසනික සේවයේ නියැලෙන පුද්ගලයන් ඇගයීම, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බෞද්ධ සංවිධාන ඇගයීම, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ස්වේච්ජා සංවිධාන ඇගයීම, දිස්ත්‍රික් මට්ටමින් දීර්ඝ දහම් ගුරු සේවය ඇගයීම, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බොදු පුවත් ප්‍රචාරණය සඳහා සිදු කරන ලද මාධ්‍යකරණය (මාධ්‍යවේදීන්) ඇගයීම යන අංශයන් යටතේ සිදු කරන ගෞරව ප්‍රණාම පිරිනැමීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

06. ජාතික අධ්‍යාපන මණ්ඩලය පූජාවලිය නමින් බෞද්ධ ගීත රචනා තරගයක් සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීමට සංවිධානය කරමින් පවතී.

07. 65 + නිකේතනය ඉදි කිරීම

බෞද්ධ සම්මේලනයේ ශාසනික හා ආගමික කටයුතු සිදු කරලීම සඳහා ආදායමක් ලබා ගැනීමේ අරමුණින් මුදල් ගෙවා නැවතිය හැකි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නිකේතනයක්

08. බෞද්ධ මහා සම්මේලනය සතු දිවයින පුරා ඇති ඉඩම්, ගොඩනැඟිලි හා බෞද්ධ විහාරස්ථානයන්හි සූර්ය බල ජනක ඒකක (පැනල) සවි කිරීමේ ව්‍යාපෘතිය

සූර්යබල, සුළං හා ජල විදුලි ජනක ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය සම්බන්ධීකරණයෙන් ඉදිරි වැඩ කටයුතු සිදු කරගෙන යමින් පවතී.

09. බෞද්ධ සාහිත්‍ය උත්සවය

බෞද්ධ සාහිත්‍ය පොත පත ඇගයීම් කොට ඉපැරණි බෞද්ධ සාහිත්‍ය කලාව නැංවීමට සම්මේලනය විසින් බෞද්ධ සාහිත්‍ය උත්සවය

15 වෙනි වරටත් පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

2020 වසරේ ප්‍රකාශිත බෞද්ධ තේමාව රැගත් ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් ලැබී ඇති බවත්, විද්වත් මඩුල්ලක් විසින් පාලි හා සංස්කෘත, ධර්ම ග්‍රන්ථ, ශාස්ත්‍රීය පර්යේෂණ, ශාස්ත්‍රීය සංස්කරණ, පද්‍ය, නවකතා, පරිවර්තන, ළමා සාහිත්‍ය, සිංහල ජනශ්‍රැති, බෞද්ධ ඉතිහාසය (ඉංග්‍රිසි/සිංහල), උපහාර ග්‍රන්ථ, චරිත කතා අංශයන් යටතේ පරිශීලනය කරමින් ඇත.

10. අලව්ව/අටකලන්පන්න නිවාස ව්‍යාපෘතිය
11. මීරිගම, පල්ලේවෙල නව නිවාසයක් ආරම්භ කිරිම
12. ළමා නිවාස කේන්ද්‍ර කර ගනිමින් වෘත්තිය පුහුණු ආයතනය ආරම්භ කිරිම
13. කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම සහ ප්‍රවර්ධන වැඩ සටහන්
14. මලලසේකර අධ්‍යාපන හා සංස්කෘතික පර්යේෂණ ආයතනයේ ඉදිරි කටයුතු
15. Process Audit එකක් සිදු කිරිම
16. බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානයේ කටයුතු වර්ධනය කිරිම
17. ව්‍යවස්ථාව සංශෝධනය කිරිම
18. මූලික අරමුණක් වූ බෞද්ධ සමිති ඒකරාශි කර ගැනීමේ වැඩ පිළිවෙල
19. සම්මේලනය සතු දේපළ මනා කළමණාකරනය කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

**තුෂාර දිලුම් වාහලතන්ත්‍රී**
**ඉෂාන් බුද්ධික එදිරිසූරිය**
ගරු සමලේකම්වරු


## සබ්බ දානං - ධම්ම දානං ජිනාති
## සියලු දානයන්ගෙන් ධම්ම දානය උතුම් වේ

**බෞද්ධාලෝකය - බෞද්ධ සඟරාව**
**ධර්ම දානයක් සේ පූජා කරන්න**

**බෞද්ධාලෝකය සඟරාව ධර්මදානයක් ලෙස විශේෂ මිලකට ලබාගත හැක**

**සඟරා 50 ක් සඳහා රු.5000/=**
**සඟරා 100ක් සඳහා රු.8000/=**




ඔබගේ පවුලේ සාමාජිකයෙකුගේ

- උපන් දිනය නිමිත්තෙන්
- විවාහ සංවත්සරය සැමරීමට
- මියගිය ඥාතියෙකුට නිවන් සැප පතා




**මාසයකට පෙර මුදල් ගෙවීමෙන් පිං පැමිණවීම**

**සඟරාවේ පින්තූරයද සමග පලකරවා ගත හැක.**

විමසීම් - 071 4812656 / 072 9297000

# අවිද්‍යාව සහ තණ්හාව

පළමුව සිතක් ඇතිවීමට අරමුණක් තිබිය යුතුය. සිත් ඇතිවන්නේ ඉන්ද්‍රිය මගිනි. ඉන්ද්‍රිය යනු ඇස, කන, නාසය, දිව, කය, මනස ය. එම ඉන්ද්‍රියවලට අරමුණු වන්නේ ඇසට රූප, කනට ශබ්ද, නාසයට ගඳ සුවඳ, දිවට රස, කයට ස්පර්ශ, මනසට සිතිවිලි.

සිතක් ඇතිවීමේදී ඉන්ද්‍රියත් අරමුණත් මුණ ගැසීමේදී ඵස්ස නොහොත් ස්පර්ශ වීම ඇතිවේ. ස්පර්ශයේදී භවාංග සිත චලනය වේ. භවාංග සිත චලනය වන්නේ අරමුණට සිත යොමු වූ බවයි.

ඉන්ද්‍රියයත් අරමුණත් මුණ ගැසුණුවිට චෛතසික පහක් ඇතිවේ. ඒවානම් ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, මනසිකාර. මෙම චෛතසික පහ සම්පූර්ණ වීමේදී අවිද්‍යාව ඇතිවේ. අවිද්‍යාවේදී චේතනාවේ කාර්ය භාරය වන්නේ කර්මයක් කිරීමට ශක්තිය නිපදවීම පමණි. අවිද්‍යාව යනු මම, මගේ සිත.

පංචස්කන්ධ ධර්මවල ඵස්ස, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන චෛතසික පහ සම්පූර්ණ වීමේදී ඇතිවන්නේ තණ්හාව. (තණ්හාව යනු මගේ කොටස, මගේ කය) තණ්හාවේදී සංඛාර චෛතසිකයට භාර කාර්යය වන්නේ අවිද්‍යාවේදී චේතනාවෙන් නිපදවූ කර්ම ශක්තිය උපයෝගී කරගෙන කායික ඉන්ද්‍රිය මෙහෙයවා කර්මයක් කිරීම වේ. අවිද්‍යාවේදී චේතනාවෙන් නිපදවූ කර්ම ශක්තිය තණ්හාවේ සංඛාර චෛතසිකය මගින් කායික ඉන්ද්‍රිය මෙහෙයවා කර්මයක් කිරීමය. එනම් චේතනාවෙන් නිපදවූ කර්ම ශක්තිය කය හෝ වචනින් ක්‍රියාත්මක කිරීමය. මෙසේ බලන විට චේතනාහං භික්ඛවේ - කම්මං වදාමි. චේතනාව කර්මයයි. චේතනාවෙන් මගේ සිතින් නිපදවූ කර්ම ශක්තිය තණ්හාව වන මගේ කයින් එම කර්ම ශක්තිය ක්‍රියාත්මක වේ.

චේතනාවෙන් සිතේ කර්ම ශක්තිය නිපදවිය හැකිය. එහෙත් සිතට එය ක්‍රියාත්මක කළ නොහැක. කළ හැක්කේ කායික ඉන්ද්‍රියන් වන කය හෝ වචනයෙනි.

සිතට කායික ක්‍රියාවන්වන පින් පව් කිරීමට නොහැක. සිතින් කරන්නේ කුසල් හෝ අකුසල පමණි. කය හා වචනයට කුසල් අකුසල් කිරීමට නොහැක. කය හා වචනයට කළ හැක්කේ පින් පව් පමණි.

බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙ තුන්වන ප්‍රතිපදාවේ දේශනාකර ඇති වචනය සංවර කරන සිල්පද හතරින් තුනක් පන්සිල්වලට, අටසිල්වලට, දසසිල් වලට, සාමණේර බණදහම් පොතේ, දස සික්ඛා පදවලට, පිරිත් පොතේ, දස සික්ඛා පදවලට ඇතුලත් කර නැත. නුවර යුගයේ සිට නැතිනම් රහතන් වහන්සේලා නැතිවූ දා සිට කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම භාවිතා වන්නේ නැත.

**පහත සඳහන් පොත්වලින් පින් පව් කුසල් අකුසල් ගැන විස්තරත් ඉහත සඳහන් දේ ගැන විස්තරත්**

- පින් සහ පව් - කුසල් සහ අකුසල් 120/-
- පින සහ කුසලය එකක්ද දෙකක්ද 200/-
- සිත මනස සහ ආගම් 80/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම 125/-
- හොඳ - නරක, පින් - පව්, කුසල් අකුසල් 100/-
- චිත්ත නියාම ධර්මය 125/-
- සිතෙහි සතුට ඇති කරගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න 125/-
- දූ දරුවන්ගේ සාරධර්ම අත්පොත 100/-
- සිත සහ මනසින් කුසල් අකුසල් කය හා වචනින් පින් පව් - 100/-
- ත්‍රිපිටකය හැදෑරීමට ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සරල බසින් සිංහල බසට නගන ලද කාණ්ඩ 48 කින් යුත් ත්‍රිපිටකය සියලුම පොත් 25% වට්ටමකට ලබාගත හැකිය.

පින් පව් ගැන විස්තර ඇතුළත් පිටු 16 දහම් පත්‍රිකා 25 ක් රුː 200/-, අවිද්‍යාව, තණ්හාව ගැන ලියන ලද පිටු 8 දහම් පත්‍රිකා 25 ක් රුː 100/- බැගින් ද දහම් පඬුරු සඳහා දීමට ලබා ගත හැකිය.

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**

**661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථනː (011) 2685369, 2686925**

**ෆැක්ස්ː 2674187**